# 2022 ජුනි මස 02 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | වැඩ බලන නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්. බී. නිලංක සිල්වා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ඩබ්. ඩී. රන්දූ නිරෝෂණ මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. දීපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජය ශ්‍රී ගුණසේකර මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රී යානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. ක්‍රිෂණි ප්‍රනාන්ද මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |

45. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
46. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
47. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2022.06.02 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදී.

## 01. වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.

2022.05.05 දින පැවති මහා සභා වාර්තාව.

**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2022.05.05 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා ඉදිරිපත් කර සිටිනවා.

## 02 ගරු නගරාධිපතිතුමාගේ නිවේදන

02 (1) ගරු මන්ත්‍රීවරුනි, අද දින සභාව සදහා නගරාධිපති ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමා අද දින සභාවට නීතිමය ගැටලුවක් පවතින බැවින් නොපැමිණෙන බව සඳහන් කරනවා.

02 (2) ගරු මන්ත්‍රීවරුනී, 2022 වර්ෂයට අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ අකෘති පත්‍ර සියලුම මහා නගර සභා මන්ත්‍රීවරු වෙත ලබා දී ඇති හෙයින් හා එම වත්කම් ප්‍රකාශ 2022.06.30 දිනට පෙර පළාත් පාලන කොමසාරිස් වෙත භාරදිය යුතු බැවින්, මෙතෙක් වත්කම් ප්‍රකාශ ලබා නොදුන් මහා නගර සභා මන්ත්‍රීවරුන් එම වත්කම් ප්‍රකාශ කඩිනමින් නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත භාරදීමට කටයුතු කරන මෙන් දන්වා සිටිනවා.

02 (3) ගරු මන්ත්‍රීවරුනී, 2022 ජුලි මාසයට අදාළ ස්ථාවර කමිටු නියමිත දිනවල පැවැත්වෙන බවත්, කාර්යාල පස්වරු 3.00ට වැසීමට සිදුවන බැවින් සවස් වරුවට නියමිත කමිටු නියමිත දිනවල පස්වරු 1.00ට පැවැත්වෙන බව දන්වා සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපිට ඊලග සභාවේදි වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකරපු මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න කියලා යෝජනා කරනවා.

## 03 සභාව අමතා එවන ලද ආයවනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

**වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සභාවට පැමිණෙන විට සභාවේ ගෞරවය ආරක්ෂා වන විදියට ඔබතුමා ඇඳුමකින් සැරසුනා නම් හොදයි කියලා කියනවා. ඔය ආකාරයෙන් පැමිණිම පිළිබදව අපේ අප්‍රසාදය පලකරනවා.

**03 (01) මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම ඔබතුමාට සුභ පතනවා මුලසුනේ වාඩිවීම සම්බන්ධව. ඒවගෙම මගේ අද ඇඳුම සම්බන්ධයෙන් මම කියන්නම්. මම මේ ඇඳුම ඇදගෙන ආවේ වුවමනා වෙන්මයි. නගර සභාව අද වෙනකොට තියෙන්නේ විශාල අවධානමක. ඔබතුමාට කියන්න පුලුවන්ද මේ නගර සභාවට එන මේ සභිකයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම ඔබතුමාට භාරගන්න පුලුවන්ද? නගර සභාව ඉවරවෙලා අපි එළියට බහින කොට මේ නගර සභාව දහස් ගානක් වටකරලා අපේ ජීවිතවලට හානි නොවෙයි කියන වගකීම ඔබතුමාට භාරගන්න පුලුවන්ද? මම සරමක් ඇදගෙන ඇවිල්ලා මගේ සරම ඔලුවේ ඔතලා මාව

යට ඇඳුම පිටින් යවන්නැහැයි කියන වගකීම ඔබතුමාට භාරගන්න පුලුවන්ද? මට තියෙන්නේ එකම එක නැෂනල් එකයි. ඒ නැෂනල් එක ඇඳගෙන ඇවිල්ලා අද දවසේ නගර සභාවෙන් පිටවෙන කොට පිරිසක් වටකරලා ගහලා මගේ ඇඳුම ඉරුවොත් එහෙම ඒ වගකීම ඔබතුමාට භාරගන්න පුලුවන්ද? ඒනිසා ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අද මේ සභිකයන් 48 දෙනාම විශාල අවධානමකට මුහුණ පාලා තියෙනවා. ඒ අවධානම නිසා තමයි, වසර 16 ක් ඇඳපු සම්ප්‍රදායික ඇඳුම අයින් කරලා අද සභාවට නොගැලපෙනවයි කියලා මම හිතන්නේ නැහැ. එක මම ප්‍රතික්ෂේප කරනවා. සභාවට නොගැලපෙනවා නම් නොගැලපෙන දේවල් ගොඩක් වෙනවා. ඇඳුම නොගැලපෙන එක නෙමෙයි ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ප්‍රශ්ණය, සමහරු මට අභියෝග කරා සමන්තට ගරු නගරාධිපතිතුමා කියලා කථා කරන්න වෙනවා දැන් මොකද කරන්නේ කියලා. මම එකත් කියලා පටන් ගන්නම් මම බොහෝම ආඩම්බරයෙන් සමන්තට ගරු නගරාධිපතිතුමනි කියලා කියන්නේ. මොකද හේතුව සමන්ත කියන්නේ මගේ වෛරක්කාරයෙක් නෙමෙයි. මම එක කියන්න ඕන. හැබැයි අපි එක පන්තියේ මිනිස්සු. අපේ පන්තියේ එකෙක් උඩට ගිහිල්ලා වාඩිවෙලා ඉන්නකොට අපිට සතුටුයි. ඒ නිසා එහෙම කියන්න අපේ කටවල් පැටලෙන්නේ නැහැ. අපි කියන්නේ ඔය තනතුර බාල්දු කරන්නේ නැතිව ඔය තනතුරේ කටයුතු දවසද, දෙකද, කරන්නේ කොන්ද කෙලින් තියාගෙන කරන්න කියන ඉල්ලීමයි කරන්නේ. ඔබ පටන්ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම් නායකයාට වෙන පුද්ගලයෙක් ගෙන්නලා මෙතන වාඩි කරවගෙන. හැබැයි ඔබ දන්නේ නැහැ සාමාන්‍යයෙන් කණ්ඩායම් නායකයෙක් පත්කරනකොට කණ්ඩායම් නායකයා පක්ෂයෙන් පත්කරලා නැත්නම් සාම්ප්‍රදායිකව කණ්ඩායම් නායකයා හැටියට අවුරුදු 4ක් වැඩ කරපු මිනිහාව එක පාරටම අයින් කරන්න වැඩ බලන නගරාධිපතිවරයාට බැහැ. ඒනිසා මම ඔබත් එක්ක තරහා නැහැ.

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම නැගිට්ටේ අද මේ සභාව විශාල වශයෙන් ප්‍රශ්ණ ගොඩකට මුහුණ දිලා තියෙන තැනක්. අපි වෙනදා කථා කරනවාට වඩා, වෙනදා කථා කරන දේවල් වලට වඩා, වෙනදා අවධානය යොමුකරන දේවල් වලට වඩා, බෙහෙවින් වෙනස් වාතාවරණයක වටපිටාවක වෙනස් පරිසරයක ඉදලා තමයි, අද අපිට කථාකරන්න වෙලා තියෙන්නේ. එක පුද්ගලයෙක් කරපු මහා පරිමාණ විනාශයක් නිසා අද ලක්ෂ දෙකයි විස්සක ජනතාවක් අපහසුතාවයට පත්වෙන තැනක ඉදලා තමයි අපි මේ කථා කරන්නේ. සේවකයෝ දහස්ගානක් තමන් මොරටුව මහා නගර සභාවේ සේවය කරනවායි කියන්න බැරි තැනට පත්වෙච්ච නගර සභාවක්. එහෙම පරිසරයක ඉදලා තමයි අපි මේ කථා කරන්නේ. ඒනිසා ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, සැකයක් සංකාවක් විචිකිච්ඡාවක් නැහැ. අපිට තියෙනවා ලොකු ප්‍රශ්නයක්, මේ නගර සභාව හෙට දවසේ කිනම් දිශාවකට ගමන් කරනවාද කියන ප්‍රශ්නය අපිට තියෙනවා. මොකද හේතුව, අද වෙනකොට නගරාධිපතිවරයා රක්ෂිත බන්ධනාගාර ගතවෙලා ඉන්නේ. නගරාධිපතිවරයා රක්ෂිත බන්ධනාගාර ගතවෙන්නේ ඔහුට අභූත චෝදනාවක් එල්ල කරලා නෙමෙයි. එදා මැයි මාසේ 8 වෙනිදා රාත්‍රියේ මට පණිවිඩයක් එනවා. ඒ පණිවිඩයෙන් කියන්නේ මොකක්ද හෙට සේවකයෝ ගෙනියන්න කියලා. හෙට සේවකයන්ට කාඩ් එක ගහන්න එපා සේවකයෝ සියලුදෙනා අනිවාර්යෙන්ම යන්න ඕන කියලා අරලියගහ මන්දිරයට නගරාධිපතිවරයා නියෝගයක් නිකුත් කරලා තියෙනවා. ප්‍රධානින්ට ඒ අනුව හෙට උදයේ නගර සභාවේ ඉන්න සේවකයෝ 9 උදේ අරලියගහ මන්දිරයට යනවා කියන පණිවිඩය මට එනවා. මම නාගරික මන්ත්‍රිවරයෙක් හැටියට මම ඒ පණිවිඩය ආපුගමන් නාගරික කොමසාරිස්තුමාව දැනුවත් කරනවා. මෙන්න මෙහෙම දෙයක් හෙට දවසේ සිද්ධවෙනවා ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. එක කරන්න දෙන්න එපා. සේවකයන්ගේ රැකියාව අනතුරට දාන්න එපා කියලා. එතනින් මම නවතින්නේ නැහැ. මම කථා කරනවා නියෝජ්‍ය කොමසාරිස්වරයාට මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. හෙට දවසේ සේවකයෝ ගෙනියනවා ඒක නවත්වන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. මම එතනින් නවතින්නෙත් නැහැ. මම කථා කරනවා සේනක දමයන්ත අපේ සමගි ජන බලවේගයේ නායකතුමාට එතුමාට කථාකරලත් කියනවා මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා මොනවාහරි කරලා මේක නවත්වන්න ඕන. නැත්නම්, සේවකයෝ අමාරුවේ වැටෙනවා කියලා. පහුවදා උදේ අපි එනවා නගර සභාවට සේවකයො ඇවිල්ලා අපිට කියනවා මට මේ සභාවේ දැන් ඔප්පු කරලා පෙන්නන්න පුලුවන් අපිව ගෙනියන්නේ බලෙන් කියලා සේවකයෝ ඇවිල්ලා කියනවා. මම කාඩ් එක ගහලා ඉන්නේ ඒත් මට කරන්න දෙයක් නැහැ මට යන්න වෙනවා මම මොනවා කරන්නද කියලා. තව සේවකයෙක් ඇවිල්ලා කියනවා එක්තරා පරිපාලකවරයෙක්ගේ නමක් කියලා අහවල් පරිපාලකවරයා අපිට කිව්වා අද කාඩ් එක ගහන්න එපා කියලා. ඒනිසා අපිට යන්න වෙනවා කියලා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ සේවකයන්ගේ අදෝනා මධ්‍යයේ තමයි සේවකයන්ව බලෙන් අරගෙන ගියා කියන්න සාක්ෂි අපි ලඟ තියෙනවා. අපි ඉස්කෝලේ යන කාලේ විවේක කාලයෙන් පස්සේ සමහර වෙලාවට

අපි හැමොම පාසල් ගිය පිරිසක් හැටියට, දන්නවා සමහර වෙලාවට පීරියඩ් එකක් කට් කරන්න ඕන වුනාම ටොයිලට් එකක් අස්සේ එහෙම නැත්නම් කොහේහරි පන්ති කාමරයක් අස්සේ කොලුකමට අපි ඉදලා තියෙනවා. අපිව හොයන්න ප්‍රින්සිපල් වේවැල අරගෙන ඇවිල්ලා අපිව වටේ හොයලා පස්ස පැත්තට පාරක් ගහලා යවනවා පන්තියට. ඒවගේ සිද්ධියක් මම දැක්කා, මට පාසල් අවදිය මතක් වුනා. එදා 9 වෙනිදා උදේ පාන්දර නගරාධිපතිවරයා වේවැල නැතිවුනත් පරුෂ වචනයෙන් එක එක්කෙනාට බැන බැන මේ වටේ ගිහිල්ලා හැංගිලා හිටපු සේවකයෝ ගිහිල්ලා බස්වලට නග්ග ගත්තා. එහෙම තමයි බස් 8ක් පිටත් කරේ. එහෙම යනකොට නගරාධිපතිවරයා මෙතන මන්ත්‍රී කාමරය තුල හිටියා. මම කියන දේවල් සාක්ෂි පිට ඔප්පු කරන්න පුලුවන් දේවල්, මන්ත්‍රී කාමරයේ නගරාධිපතිවරයා ඉන්න කොට නිරෝෂන් මන්ත්‍රීතුමා ඇවිල්ලා එතුමා මේ සේවකයෝ රැගෙන යනවා වීඩියෝ කරා. ඒ වීඩියෝ කරපු එකට විරුද්ධව නගරාධිපතිවරයා කථා කරා. මම කථා කරන්නේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරිම සම්බන්ධයෙන්. මොරටුව ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරිම සම්බන්ධයෙන්. මොරටුව ජනතාවගේ මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරිම සම්බන්ධයෙන් කරුණක් ගැන මේ කථා කරන්නේ. හැබැයි, මම කිව්වා මේ පරිසරය වෙනස් අද මේ කථාකරන ශබ්දවාහිනිය පිටින් අරගෙන තියෙන්නේ මේක විනාශ වෙලා තියෙන්නේ. මේක හොරු අරගෙන ගිහිල්ලා. නගර සභාවේ කැබ් රථ 4කට 5කට ගිනි තියලා විනාශ කරලා. නගර සභාවේ ත්‍රිවිලර් රථ ගණනාවක් ගිනිතියලා විනාශ කරලා. මන්ත්‍රීවරුන්ගේ යතුරු පැදි පවා ගිනි තියලා විනාශ කරලා. නගරාධිපතිවරයාගේ කාර්යාලය ගිනි තියලා විනාශ කරලා. නගර සභාවට කෝටි 10 වඩා වැඩි අලාභ හානියක් සිද්ධ කරලා. එහෙම වතාවරණයක මේ කථා කරන්නේ. ඒනිසා අපි බොහේම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා, අපිට මේක කථා කරන්න අවස්ථාව දෙන්න. මොකද හේතුව මේ කථා කරන්නේ, මොරටුවේ ඉන්න ලක්ෂ දෙකයි විස්සකට වඩා වැඩි ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරපු සිද්ධියක් සම්බන්ධයෙනුයි. ඒ කථාකරන සිද්ධිය සම්බන්ධයෙන් කථා කරන්න අයිතියක් අපිට තියෙනවා. ඒ නිසයි ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ කථා කරන්නේ. මන්ත්‍රීවරයෙක් හැටියට අපිට වෙච්ච අසාධාරණය ඒ මන්ත්‍රීවරයා ඇවිල්ලා මෙතන ඉන්න කොට මන්ත්‍රීවරුන්ට පරුෂ වචනයෙන් බනිනවා. ගහන්න යනවා. තව සේවකයෙක් දම්මලා ජංගම දුරකථනය උදුරගන්නවා. උදුරගෙන මන්ත්‍රීවරයා තල්ලු කරනවා. ඒ සියලු දේ මම වීඩියෝ කරනවා. මගේ කාර් එක ඉස්සරහාට ඇවිල්ලා කියනවා ඕන එකෙක් වීඩියෝ කර ගද්දෙන් අපිට කමක් නැහැයි කියලා මේ නගරාධිපතිවරයා. පට්ට පරුෂ වචනයෙන් කැගගහා වියරුවෙන් හැසිරුණේ. මම ගාව තියෙනවා ඔප්පු කරන්න පුලුවන් සාධක.

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, සේවකයෝ 400ක් අරගෙන ගිය නිසා තමයි හවස අපේ මේ නගර සභාවේ සම්පත් විනාශ වෙන්නේ. හවස මේ නගර සභාවේ දේපල හානි වෙන්නේ. හැබැයි දේපල අලාභහානි විම සම්බන්ධයෙන් අපිට ගැටලුවක් තියෙනවා අලාභහානි වෙන විදිය. ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. මේ ගැන නීතියට කියන්න ඕන වේලාවක නීතිය ඉස්සරහාට ඇවිල්ලා අපිට කියන්න පුලුවන්කම තියෙනවා. මම පොලිසියේ ප්‍රධාන පොලිස් නිළධාරියාට මේ ගැන කරුණු කිව්වා හරිම උගතෝකෝටික ප්‍රශ්නයක් තියෙනවා නගර සභාවට ගැහිම සම්බන්ධයෙන්. ඊට ඉස්සේල්ලා ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීවරයාගේ ගෙදරට ගහනවා. නගරාධිපතිවරයාගේ ගෙදරට ගහනවා. ඔසද හර්ෂණ අබේකෝන් මන්ත්‍රීවරයාගෙ ගෙදරට ගහනවා. ප්‍රියනාත් හිටපු මන්ත්‍රීවරයාගේ ගෙදරට ගහනවා. අපේ අනුර ප්‍රනාන්දු මන්ත්‍රීවරයාගේ කඩේට ගහනවා. මේ සියලු දේවල් දැඩිව ප්‍රතික්ෂේප කරමින් තමයි, මේ කථාව කරන්නේ. මේ අහිංසක මන්ත්‍රීවරුන්ට ඉන්න හිටින්න ගෙයක්වත් නැහැ. ඉන්නේ කුලියට. කුලියට ඉන්න ගෙදරටත් ගහනවා. මේ වාතාවරණය නිර්මාණය කරේ කවුද? මේ මන්ත්‍රීවරු ගිහිල්ලා කාට හරි වැරදි කරලා තියෙනවාද? ඔසඳ මන්ත්‍රීතුමා කාටහරි වැරදි කරලා තියෙනවාද? ලක්ෂ 100කට වඩා අලාභ හානි. අනුර මන්ත්‍රීතුමා අපි පොඩිකාලේ ඉදන් ආශ්‍රය කරන මනුස්සයා කුරා කුඹියෙකුටවත් වරදක් කරපු මිනිහෙක් නෙමෙයි. ඔහුටත් ගහනවා ගිහිල්ලා. ඒ වගේ ෆ්‍රැන්සිස් මන්ත්‍රීතුමා අහිංසකම මනුස්සයා මේ නගර සභාවේ ඉන්න. ඒ මන්ත්‍රීවරයාගේ ගෙදරට ගහනවා. කාටද වරදක් කරලා තියෙන්නේ? මල්ලිකා මන්ත්‍රීතුමියගේ ගෙදරට ගහලා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ සියලු මන්ත්‍රීවරුන් දඩ මීමා කරගෙන පහර දුන්නේ මේච්චර කල් මේ මන්ත්‍රීවරුන්ට පහර දුන්නේ නැහැනේ. ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා අවුරුදු 16ක් ඔසද මන්ත්‍රීතුමා අවුරුදු 16ක් මන්ත්‍රීවරයෙක්. ගෙවල්වලට ගැහුවේ නැහැ කවුරුත් ගිහිල්ලා. ඇයි මොකද වුනේ මේ උද‍ැසන සිදුවෙච්ච සිදුවිමත් එක්ක තමයි අපේ මන්ත්‍රීවරු ගුටිකැවේ. අපේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල් වලට ගැහුවේ. ඒ විතරක් නෙමෙයි, මොරටුවේ නගර සභාවේ මම අවුරුදු 16ක් මන්ත්‍රීවරයෙක් මම අවුරුදු 8ක් උප නගරාධිපතිවරයෙක් මම හිතන්නේ නැහැ මෙතන ඉන්න බහුතරයක් මන්ත්‍රීවරු මේ ඉස්සරහා ඉන්න මන්ත්‍රීවරු අවුරුදු 16 කට වැඩියි. මේ මන්ත්‍රීවරු 48 ඇහුවොත් එහෙම

දෙන්නෙක් තුන්දෙනෙක්ට වැඩිය දන්නේ නැහැ රිට්ලිගේ කාමරය කොහෙද තියෙන්නේ කියලා. රිට්ලිගේ කාමරයේ ප්‍රෙට්ටල් තියෙනවා කියලා අපි කවුරුත් දැනගෙන හිටියේ නැහැ. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේකෙ ගැටලුව තියෙන්නේ මෙහෙමයි, මේසා විනාශයක් කරපු නගර සභාවට ප්‍රෙට්ටල් ටික ගන්න යන්නේ රිට්ලිගේ කාමරයට. ඒ කාමරයට ගිහිල්ලා කාමරයේ දොර කඩන්නේ නැහැ. කාමරයේ සොයිබේ ගලවන්නේ. සොයිබේ ගලවලා තමයි ප්‍රෙට්ටල් ටික ගන්නේ. ඒ අරගෙන තමයි මේසා විනාශ කරන්නේ. අපිට ප්‍රශ්නය තියෙන්නේ ආරක්ෂාකාරිව ප්‍රෙට්ටල් තියෙන එක දන්න කෙනෙක් වෙන්න ඕන එතනට යන්න. ඒ විතරක් නෙමෙයි, ප්‍රෙට්ටල් ටික අරගෙන මේ විනාශය කරන්න පෙලඹුනේ දන්න කෙනෙක් වෙන්න ඕන. සිකියුරිටි එකේ ගයාන් කියන කෙනාගේ ත්‍රිවිල් එක තියෙන්නේ මෙතන, ඔබතුමාගේ කාර්යාලය පිටිපස්සේ. හැබැයි, ගයාන්ගේ ත්‍රිවිල් එක ගිනි තියන්නේ ඉස්සරහා. ගයාන් කියනවා ත්‍රිවිල් එක පෙරලගෙන පෙරලගෙන යනවා එයා දැක්කාලු සාමාන්‍යයෙන් වාහනය පෙරලගෙන යනවානම් ඒ වාහනයේ විදුරු කුඩුවෙන්න ඕන. එහෙම මුකුත් තිබ්බේ නැහැ. හැබැයි අවසානයේ සිකියුරිටි කාමරය ඉස්සරහා තමයි ගිහිල්ලා ගිනි තියන්නේ. ඒ විතරක් නෙමෙයි, වැදගත්ම ප්‍රශ්ණය මේ නගර සභාවේ අපේ කැබ් 4ක් ගිනි තියනවා. ජේසිබි යන්ත්‍රයට ගහනවා. අර ලොරියක් අපේ ගිනි තියනවා. ඊට අමතරව, මල් පොච්චි කඩලා, විදුරු බිදලා, විශාල අලාභහානි සිදු කරනවා. උගතෝකෝටික ප්‍රශ්නයක් තියෙනවා. අපිට මේ ප්‍රශ්නය මේ සභාවේ කියන්නේ හැමදෙනාගේම අවධානය යොමු කරන්න. නගරාධිපතිවරයාගේ කාමරයට පහරදීම ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමා සාමාන්‍යයෙන් ඔෆිස් එකේ ඉන්නවා. ඔබතුමාට වාඩිවෙන්න පුටුවක් තියෙනවා. මම ඔබතුමත් එක්ක තරහා වෙනවා. මට චාන්ස් එකක් එනවා ඔබතුමාගේ කාර්යාලය කඩන්න, ගිනි තියන්න මම තරහා ඔබතුමාත් එක්ක. මම ගිහිල්ලා ගහන්න ඕනේ ඔබතුමා වාඩිවෙන පුටුවටද? ඔබතුමා හම්බවෙන්න එන අය වාඩිවෙන කච්චියටද? සාමානයෙන් අපි දන්න දේ නම් අපි ඉලක්ක කරන පුද්ගලයාටනේ හානි කරන්නේ. කෝටි 10කට වඩා අලාභ හානි සිද්ධවෙලා තියෙන්නේ. මේ නගර සභාවට කලු පැල්ලමක් එකතුවෙලා තියෙන්නේ සේවකයෝ 400ක් අරගෙන ගිහිල්ලා තියෙනවා. අහිංසක සේවකයෙක් වැඩට එන්නේ නැතිව හිටියොත් දවස් දෙකක් මේ 25,26 වැඩට ඇවිල්ලා නැහැ ලලිත් කියන සේවකයා

(සභා ඝෝෂා)

අපි කියන්නේ නගරාධිපතිවරයාගේ කාර්යාලයට ගහපු එක සැකයි. කවුරු හරි මෙහෙයවලා ගහලා තියෙන්නේ. නගරාධිපතිවරයාගේ මේසෙට, පුටුවට මුකුත් කරලා නැහැ. කරලා තියෙන්නේ අර සැටියකට. අපිට සැකයි මොනවාහරි සැටියට දාලා ගිනි තියලා කියලා. සෙන්කොලේ ගිනි තියනවා සැටියට දාලා. අපිට ප්‍රශ්නය තියෙන්නේ එතන

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, එහෙම සැකයක් මොකක් හරි තියෙනවා නම් අවශ්‍ය නීතිමය කටයුතු කරන්න කොමසාරිස්තුමා ඉන්නවා. අපේ වැඩබලන නගරාධිපතිතුමා ඉන්නවා. ඒවා අවශ්‍ය කටයුතු කරන්න. මේක නිකම් ප්‍රසිද්ධියක් කරන්නේ නැතිව මාධ්‍යයටයි සභා වාර්තාවටයි. මේ කථා කරලා ඇත්තටම තේරුමක් නැහැ මන්ත්‍රීතුමනි අවශ්‍ය නීතිමය කටයුතු කරන්න. මාධයයට කථා කරලා තේරුමක් නැහැනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මහජන නියෝජිතයෙක් හැටියට මම මේ කරන්නේ මගේ අයිතිය. මම මේ කරන්නේ මගෙ යුතුකම. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන්න. අපි කැමතියි ඕන වෙලාවක ඇවිල්ලා සාක්ෂි දෙන්න. අපි කැමතියි අදහස් ප්‍රකාශ කරන්න. විධිමත් පරික්ෂණයක් ආරම්භ කරන්න. තාම හරියට අපිට පෙන්නේ නැහැ, මේ නගර සභාවට ගහපු එක ගැන විධිමත් පරික්ෂණයක් කරනවා අපි දැක්කේ නැහැ. ඒනිසා අපි කියන්නේ මේක කවුරු හරි හිතාමතාම වුවමනාවෙන්ම සැලසුම් කරපු ප්‍රහාරයක්. මේක බොරදියේ මාලු බාන්න කරපු ප්‍රහාරයක් හැටියට තමයි නගර සභා ප්‍රහාරය අපි දකින්නේ. ඒනිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් අවශය කටයුතු කරන්න කියන ඒ ගෞරවනිය ඉල්ලීම කරනවා.

**03 (02)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන්ම ඔබතුමාට සුභාසිංශන යොමු කරනවා මේ අවස්ථාවේදි මුලාසනය ගෙන කටයුතු කිරිම ගැන. විශේෂයෙන්ම, සුජිත් මන්ත්‍රිමා කිව්ව විදියට අපේ මොරටුවට කලු පැල්ලමක් එකතුවුන දවසක් තමයි, මැයි මාසේ නව වෙනිදා. එදා උදැසන අපි පුන පුනා කිව්වා මේ ස්ථානයට ඇවිල්ලා. කථා කරන්නේ අපේ මන්ත්‍රිවරුන්ට වුන වරප්‍රසාද උල්ලංඝනය කිරිමක් සම්බන්ධව. එදා උදැසන විශාල පිරිසක් මෙම ස්ථානයේ රැදි සිටියා. අපි කලින් දවසේ දැනගෙන හිටියා විශාල පිරිසක් ඒකරාශි කරගෙන අරලියගහ මන්දිරයට යනවා කියලා. එක අයිතියක් තියෙනවා. හැබැයි, අයිතිය තියෙන ක්‍රමයක් තියෙනවා. යනකොට 400 විතර නිවාඩු දාලා එක දවසක එහෙම අරගෙන යන්න පුලුවන්ද කියන ප්‍රශ්නය තියෙනවා ආයතනය පැත්තෙන්. එහෙම ගිහිල්ලා සාමකාමී රැස්වීමක සාමකාමීව රැස්වෙලා ආවානම් මේ කිසිම දෙයක් ඇතිවෙන්නේ නැහැ. එතනින් ඔබ්බට ගිය දේ තමයි මුලු ලංකාවම ගිනි ගත්තේ. අපි කථා කරන්නේ මොරටුව ගැන. මොරටුවේ ජීවත්වෙන පුද්ගලයෙක් විදියට කවදාවත් මොරටුවේ මන්ත්‍රිවරයන්ට පක්ෂ විපක්ෂ මෙහෙම දෙයක් වුනේ නැහැ. එකට මුහුණ දෙන්න සිද්ධ වුනා. අහිංසකද කියලා බැලුවේ නැහැ. ඒ අය ඇවිල්ලා පහර දුන්නා. ඒවගේම මේ නගර සභාවට විශාලතම හානියක් සිද්ධ කරා. මේකට පලවෙනි වගඋත්තරකරු වෙන කවුරුවත් නෙමෙයි, නගරාධිපතිවරයා. හැසිරුන විදියයි මෙහෙයවපු විදියයි ඒ නිසා තමයි එතුමාට ඒ ප්‍රහාරය එල්ලවුනේ හා එතුමා නිසාවෙන් මොරටුවට මේ ප්‍රහාරය එල්ලවුනේ. අපිට වගකිමක් තියෙනවා. මේ සභාව නියෝජනය කරන මන්ත්‍රිවරු විදියට සුජිත් මන්ත්‍රිතුමා දරුණු ප්‍රකාශයක් කරා පොලිසිය මට්ටමෙන් එවා විමර්ෂණය වෙනවා වෙන්න පුලුවන්. හැබැයි, ආයතන මට්ටමින් සාකච්ඡා කරලා හොයලා බලලා කොමසාරිස්තුමා, නියෝජ්‍ය කොමසාරිස්තුමා අදාල අය මේ පිළිබඳව විමර්ෂණයකට ලක් කරන්න කියන ඒ ඉල්ලිමත් කරනවා. විශේෂයෙන්ම මන්ත්‍රිවරුනි, එක කොණයකින් බලන්න එපා. එක පුද්ගලයෙක් ආරක්ෂා කරන්න එපා. ඒක තමුන්නාන්සේලා එහෙම කරනවානම් ලොකු විනාශයක්. පොඩ්ඩක් අපි කියනදේත් අහලා බලන්න. විශේෂයෙන්ම, මම දේශපාලනය කරලා තියෙනවා. අපි වැඩ කරපු නායකයෝ ඉන්නවා. ගරු කරපු නායකයෝ ඉන්නවා. ඒ අයට ඇඟිල්ලක් දික්කරලා හොරෙක් කිව්වේ නැහැ. ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාට, ඉරාන් වික්‍රමරත්නට හොරෙක් කිව්වේ නැහැ. ජී. එල්. පීරිස්ට හොරෙක් කිව්වේ නැහැ. මේ ආසනයේ සංවිධායකවරු වගකිමක් තියෙන්න ඕන තමුන්නාන්සේලාට කොන්ද කෙලින් තියාගෙන කථා කරන්න පුලුවන්කම තියෙන නායකයෙක් ඉන්න ඕන. ඒ නායකයා හොරෙක් නොවෙන්නට ඕන. මම අහනවා මන්ත්‍රිවරුනි, තමුන්නාන්සේලාගෙන් මේ නගරාධිපතිවරයා එයාගේ ගේ හැදුවේ මේ නගර සභාවේ සේවකයෝ අරගෙන ගිහිල්ලා නෙමෙයි කියලා. මේ නගර සභාවේ බඩු අරගෙන ගිහිල්ලා නෙමෙයි කියලා කියන්න පුලුවන්ද? එයාගේ බිල්ඩින් හදනකොට මේ නගර සභාවේ සේවකයෝ බඩු අරගෙන ගිහිල්ලා නෙමෙයි කියන්න පුලුවන්ද? කොන්දක් කෙලින් තියලා කථාකරන මන්ත්‍රි කෙනෙක් ඉන්නට ඕන. ඒක කරන්න එපා කියන්න කාටවත් පුලුවන්කමක් තිබ්බේ නැහැ. අද ඒවායේ පලවිපාක තමයි මේ භුක්ති විදින්නේ. අහිංසක මිනිස්සු බලන් හිටියා. තමන් බලය අයුතු විදියට පාවිච්චි කරගෙන මේ වගේ වත්කම් අරගෙන ගිහිල්ලා තමන්ගේ ගෙවල් හදාගන්න කොට බලන් හිටියා. හැබැයි, එගොල්ලන්ගේ ගෙවල් කුඩු කරනකොට ඒ මිනිස්සුන්ට කේන්තියක් ආවා. වෛරයක් ආවා. පර්චස් 2 ගෙවල් ගහලා ඉවරවෙලා ටොයිලට් එක කඩලා දාන මිනිස්සු තමන්ගේ දරුවාට තමන්ගේ පැන පාවිච්චි කරලා පර්චස් 3නේ තට්ටු 6ක් ගහන්න දෙනවා. මන්ත්‍රිතුමා හිතන්න. ඒවා ගැහුවේ නගර සභාවෙ සේවකයෝ ගිහිල්ලා. නගර සභාවෙ වාහන ගිහිල්ලා. ඡායාරූප තියෙනවා. නගර සභාවේ බඩු දාලා ගැහුවේ. මෙහෙ තියෙන මැෂින් ගෙනිහිල්ලා හයි කරගෙන ගැහුවේ. තමුන්නාන්සේලා එක්කෙනෙක්වත් විරුද්ධ වුනේ නැහැ. එදා විරුද්ධවෙලා කථා කරානම් අද මේවගේ වපසරියක් වෙන්නේ නැහැ. මේවගේ හානියක් වෙන්නේ නැහැ. ඒ විතරක් නෙමෙයි කොච්චර ආසාධාරණකම් මොරටුවේ මිනිස්සුන්ට කලාද එක තමයි කේන්තිය තිබ්බේ. ඒ කේන්තිය පිටකරේ අහිංසක මන්ත්‍රිවරුන්ගේ ගෙවල් වලට ගිහිල්ලා ගහලා. මම ඇත්තටම දුක්වෙනවා අනුර මන්ත්‍රිතුමා ඇත්තටම අසරණ තත්වයකට පත්වෙලා. ඒවගේම අපේ ෆ්‍රැන්සිස් මන්ත්‍රිවරයා. ඒ විතරක් නෙමෙයි කාගේ ගෙදරට ගැහුවත් අපි විරුද්ධ වෙනවා. හැබැයි, එතැනට ගෙනාවේ කවුද ඒ තැනට ගෙනාවේ මේගොල්ලෝමයි. තමන්ගෙ පුතාට ඒ බිල්ඩින් එක ගහන්න පුතාගේ තියෙන වත්කම් මොනාද? මොකක්ද රැකියාව කෝටි 2ක් දෙකාමාරක් විතර තක්සේරුව. එයාගේ වාහනයේ වටිනාකම ගත්තාම ලක්ෂ 100 ක වත්කමක් එනවා. කෝටි 5 විතර වත්කම් තියෙනවා. කොහෙන්ද මේ වත්කම්. නගරාධිපතිවරයාගේ සම්පූර්ණ වැටුප් වාර්තාව මා සතුව තියෙනවා.

(සභා ඝෝෂා)

නගරාධිපතිවරයාගෙ සම්පූර්ණ වත්කම එදා ඉදලා මේ දක්වාම ආදායම ලක්ෂ 80ක් නැහැ. මේව 60 70 ගුණයක් වත්කමක් තියෙන්නේ කොහොමද? මෙන්න මේවා තමයි මිනිස්සු බලන් හිටියේ. මේ කේන්තිය තමයි පිටවුනේ. මේ නගර සභාව තුලින් පිටවුනා. අහිංසක මන්ත්‍රීවරුන්ගේ ගෙවල් වලින් පිටවුනා, වාහන වලින් පිටවුනා. මේ කැකෑරේන කේන්තියයි පිටවුනේ. ඒනිසා මන්ත්‍රීවරුනි, මම කියනවා මන්ත්‍රීවරු විදියට ගරුත්වයකින් කටයුතු කරනවානම් තමන්ගේ නායකයාට හරි කමක් නැහැ කියලා හදන්න. මේ වැරැද්ද කරන්න එපා කියලා. මේ නගර සභාවේ මන්ත්‍රීවරු විතරක් නෙමෙයි මේ නිළධාරිත් ඔක්කෝම දන්නවා. ඇයි මේ නිළධාරින් ඉස්සරහා මන්ත්‍රීවරු හැල්ලු වෙන්නේ. එතනට යන්න ඕන නැහැ. කොන්ද කෙලින් තියෙන මන්ත්‍රීවරු ඉන්නවා ගරු කරන මන්ත්‍රීවරු ඉන්නවා කිහිපදෙනෙක්. මන්ත්‍රීවරු මේ වරප්‍රසාද භුක්ති විදිනවා අපි දන්නවා. මේවා හැබැයි අහිංසක ජනතාවගේ බදු මුදල් තමයි හුරගෙන කන්නේ තමන්ගේ පෞද්ගලික සුඛවිහරණය වෙනුවෙන්. ඒ නිසා එ සියල්ලක්ම අපි අවධානයෙන්ම ඉන්නවා. වත්කම් බැරකම් වලදි මුඩු ඉඩම් 3යි, පවුම් 5යි, බැංකු ගිණුම් 2යි මොරටර් සයිකලයක යනවා කියන පුද්ගලයෝ මෝරටර් බයික් එකේ ජීවිතේට ගිහිල්ලා නැතිව ඇති. හැබැයි, එහෙම තියෙන මිනිහා කියනවා විදුරු ගෙවල්වල ඉදලා ගල්ග හන්න එපා කියලා. මම පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට අවුරුදු 23 හිටියා. මට පර්මිට් 3ක් හම්බවුනා අවසාන පර්මිට් එකේ වටිනාකම කෝටි 1යි විස්සයි. මම 2011 ඉදලා වාහන ව්‍යාපාරයක් කරනවා. වාහන දෙතුන්සියයක් විකුණලා තියෙනවා. එක වාහනයකින් ලක්ෂයක් තිබ්බත්. ඒනිසා කාටවත් චෝදනා කරන්න බැහැ. බිස්නස් රේජිස්ටේෂන් ඒවගේම ටැක්ස් ගෙවලා මොකද වාහනයක් ගන්න කොට බැංකු ගිණුමට එන්න ඕන ඩොකියුමන්ට් කාටවත් හොර කරන්න බැහැ. මට පුලුවන්කම තියෙනවා මම ඕනම කෙනෙක්ට අභියෝග කරනවා ඕනම චෝදනාවක් තියෙනවා නම් එල්ල කරන්න. මොකද අපිට අපේ දේවල් තියෙනවා. මම ගෙයක් ගැහැවයි කියලා මට ගහන්න තිබ්බා කෝටි 10ක ගෙයක්. මගේ වියදම් අඩු කරේ නැත්නම්. අඩු කරානම් ඔයට වඩා ගහන්න තිබ්බා. මම එතනින් එහාට යන්නේ නැහැ. වැඩබලන නගරාධිපතිතුමනි, මම කියන්නේ මේ දේ අපි යෝජනාවක් විදියට ගෙනවා. ඒ යෝජනාවට හැමෝටම අදහස් දක්වන්න දෙමු. ඒ යෝජනාවෙන් යම්කිසි විදියට නිතිමය පැත්තට බාධාවක් නොවෙන විදියට අපි කථා කරන්න කටයුතු කරමු. මම කියන්නේ මේක සාධාරණ පරික්ෂණයක් වෙන්න ඕන. වැඩබලන නගරාධිපතිතුමනි, අපි දැක්කා පහුගිය කාලේ මේ සිද්ධිය සම්බන්ධයෙන් උසාවියට යම් යම් පුද්ගලයෝ ඉදිරිපත් කරලා තිබුණා. හැබැයි මේ පුද්ගලයින් පොලිසියට ඉදිරිපත් කරනකොට දවල් දෙකට රූපරාමු වල හිටපු අය රෑ 8, 7.30ට ගහපු අය විදියට ඉදිරිපත් කරේ. දවල් 2ටයි රූපරාමු වල දකින්නේ. කවුරුකරත් වරදක් දකින්න ඕන. දෙන්න පුලුවන් උපරිම දඬුවම දෙන්න ඕන. අපි එතන ඉන්නවා. හැබැයි සාධාරණ විදියට. මේකෙන් වෙන්නේ අහිංසක මිනිස්සු එතනට යොමු වුනාම අර හරියටම කරපු මිනිස්සු නිදැල්ලේ මේකෙන් ගැලවිලා යනවා. සුක්ෂම විදියට මේ වැඩ පිළිවෙලත් යන්න ඇති හැබැයි සැකයකත් තියෙනවා සුජිත් මන්ත්‍රීවරයා කියපු විදියට සැකයක් තියෙනවානම් අපි ඒ සැකය තහවුරු කරගෙන අපි හරියට වැරදි පුද්ගලයින් තෝරගෙන ඒ වැරදි පුද්ගලයින්ට දඬුවම් දෙන්න ක්‍රියා කරමු. යෝජනාවක් අපි ගෙනවා ඉදිරියේදි “උ” වගන්තිය යටතේ එකට සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලිමක් කරනවා.

**03 (03)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා**</u>

ගරු වැඩබලන නගරාධිපතිතුමනි, 2022.05.09 දින යම් සිදුවිමක් සිදු වුනා. නමුත්, මම ආයතන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් මේ සභාව නියෝජනය කරන්නේ එම දින මගෙ දරුවාගේ පාසලේ යම් කාර්යය භාර්යකට නිරත වුණා. මම වසර 20ක කාලය තුල කිසිම දිනක මගේ කමිටුව පැහැර හැරලා නැහැ. මම නියෝජනය කරන මේ සභාවේ මට වගකිමක් දිලා තියෙනවා. නිළධාරින්ගේ ලේඛන ගත්තොත් සදහන් වෙලා තියෙනවා. නමුත්, එදිනත් මම මගේ කමිටුව නියෝජනය කරන්න සහභාගි වුනා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, යම් සිද්ධවිමක් වුනානේ අපේ මොරටුවේ ඒ සිද්ධ වීමෙන් පස්සේ කොටින්ම කිව්වොත් අරගලයක් ඇති වුනානේ. අරගලයේ යම් පිරිසකට පහරක් දිලා තිබුණා. නමුත්, අරගලයේ මිනිස්සුට පහර දුන්නාට අරගලයේ මිනිස්සු නෙමෙයි මේකට කුපිතවුනේ. දේශපාලනික වාසිය ගන්න යම් යම් පක්ෂවල දේශපාලනය කරන දේශපාලනයේ ඡන්ද ඉල්ලපු පුද්ගලයන්ගේ සහෝදරවරු තමයි මේකට සහභාගි වුනේ. මම එකට සුදුහුණු ගහන්න එන්නේ නැහැ. ගරු වැඩබලන නගරාධිපතිතුමනි, මගේ මන්ත්‍රී ධූරය තුල මගේ වගකිම මහජන නියෝජීතයෙකු වශයෙන් ඉටුකරලා තියෙනවා. මම විපක්ෂයේ හැමදාම ගරු කරන පුද්ගලයෝ දෙදෙනෙක් ඉන්නවා දේශපාලන පක්ෂයෙන් නෙමෙයි. විපක්ෂයේ එක් පුද්ගලයෙක් තමයි රවිනාත් ගුණසේකර මැතිතුමා එවගේම ජනතා විමුක්ති පෙරමුණේ නිශාන්ත ප්‍රදිනාන්දු මැතිතුමා මම හැමදාම

ආදරය කරන දේශපාලන ප්‍රවාහය දේශපාලන න්‍යාය පත්‍රය නිසාය. තමන්ගේ පක්ෂපාති වෙන්න පුලුවන්. නමුත්, වරදක් දුටුවිට පෙන්නුම් කරලා දෙන්න පුලුවන් නායකයෝ දෙන්නෙක් තමයි මම හැමදාම ආදරයෙන් සාදරයෙන් මෙම සභාවේ විපක්ෂයෙන් අනෙක් මන්ත්‍රීවරුන්ට ලෙන්ගතුකමක් නැතිව නෙමෙයි කියන දේ හරි හැටිය ජනතාවට ප්‍රශ්ණාර්ථයෙන්ම ප්‍රශ්න විසඳලා දෙන්න පුලුවන් දෙදෙනෙක් තමයි එතුමන්ලා දෙදෙනා. ඒනිසා මම මොරටුවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් වගේම මොරටුව මහා නගර සභාවට වරිපණම් බදුගෙවන පුද්ගලයෙක් වශයෙන් මම කණගාටුවට පත්වෙනවා. මොරටුව මහා නගර සභාවේ අපිට මොරටුවේ ජනතාව වරිපණම් බදු ගෙවන ජනතාවගේ මුදල් වලින් තමයි අපේ මන්ත්‍රී දීමනා ලබා දෙන්නේ ගරු වැඩබලන නගරාධිපතිතුමනි. හෘදසාක්ෂියට එකඟව අපේ දරුවන්ට යම් වක්‍රාකාරයෙන් හෝ අපි මේ දෙන දීමනාවෙන් දාන පරිත්‍යාගයෙන් එහෙම කිව්වොත් නැවත අපේ පර්ස් එකට ඇවිල්ලා අපේ දරුවන්ටත් මොරටුව ජනතාව දෙන බදු මුදල් වලින් අපිට යම් දීමනාවක් දෙනවා දීමනාවක් වශයෙන්. අපි හෘදසාක්ෂියට එකඟව හිතා බලන්න ඕනා. මේ මොරටුවේ පරිහානියට පත්කරපු නගර සභාව දේශපාලන නායකයන්ගේ න්‍යාය පත්‍රය වෙන්න පුලුවන් පුද්ගලයින්ගේ න්‍යාය පත්‍රයට වෙන්න පුලුවන් අපි මොරටුවේ ජනතාවට සේවය කරන්න සියලුම පක්ෂ එකතුවෙලා ඉන්නේ මේ මිනිස්සුන්ට වැඩ කරන්න. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි මොරටුවේ අපේ ජනතාවගේ බදු මුදල් වලින් ගන්නා වූ වාහන බහුතරයක් ගිනි තියනවා. ඒවගේම නගරාධිපති කාර්යාලයට ගිනි තියනවා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, බුදුන් වඩින මේ දැතින් මොරටුව බෝ සමිඳු ඉදිරිපිට ඉඳන් මේ කියන්නේ තමන්ගේ කාර්යාලයට එන යම් විනාශයක් කරන්න එන පුද්ගලයා බිත්තියේ ගහලා තියෙන බුදුපියාණන් වහන්සේගේ රූපයටත් ගිනි තියනවා. ගරු වැඩ බලන නගරාපතිතුමනි, අපි මොරටුවේ මිනිස්සුන්ගේ බදු මුදල් වලින් යම් මුදලක් ගන්නවානම් අපි එකට හානියක් කරනවානම් අපිටත් පඩිසන් දෙනවා.අපේ දරුවන්ටත් පඩිසන් දෙනවා.වක්‍රාකාරයෙන් යම් කෙනෙක් ආරක්ෂා කරන්නේනම් දේශපාලන න්‍යාය තුල මම මෙසේ කියනවා. මම වරදක් කරලා තියෙනවා නම් මටත් පඩිසන් දෙන්න ඕන.යම් කෙනෙක් මේ සභාවට ගිනි තියන්න වක්‍රාකාරයෙන් හෝ අන්‍යාකාරයෙන් හෝ කටයුතු කලානම් හෙන ගහන්න ඕනි. හෙන ගහපියව් කියලා මට කියන්න පුලුවන්. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, තාම කරුණු පැහැදිලි නැහැ. නමුත්, යම් මොරටුවට බින්න බැහැගත්ත අපතයො පිරිසක් එකතුවෙලා තමයි මේ ගිනි තියන්න තැත්කලේ දේශපාලනය නෙමෙයි. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම වසර විස්සක් මේ නගර සභාව නියෝජනය කරනවා. අද වෙනතුරු දේශපාලන වශයෙන් එක මනුස්සයෙක්ගේ මත්පැන් විදුරුවකට යටවෙලා නැහැ. සිගරැට්ටුවකට යටවෙලා නැහැ. කිසිඳු ආකාරයෙන් මේ දේවල් වලට සම්බන්ධ වෙන්නේ නැති නිසා මට මෙසේ බය නැතුව කියන්න පුලුවන්. අපේ දේශපාලන න්‍යායේ තියෙනවා මොරටුවේ වරිපනම් බදු ගෙවන ජනතාවගේ මුදල් වලින් තමයි හෙටත් මේවා යම් සංවර්ධනයක් කරන්න ඕන වුනොත් කරන්න වෙන්නේ. ඒක ඔය ගිනිතියන්න ආපු මිනිස්සු දන්නේ නැහැ. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, යම් පරික්ෂණයකට භාජනය වෙලා තියෙනවා අධිකරණයකින් මේකට නිසි දඬුවමක් නොලැබුනත් අපි අදහන ආගම අනුව මේවා කරපු පුද්ගලයන්ටත් සාපවේවා කියා කියනවා.

**03 (04)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ අභිනවයෙන් පත්වුන අග්‍රාමාත්‍රය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ කණ්ඩායම් සංවිධායක විදියට සහ විපක්ෂ නායකතුමා ඇතුලු සියලු දෙනාගේම සුභාසිංශනය මේ අවස්ථාවේදි පලකරන්න ඕන. මේ රටේ අමාරු තත්ත්වයට වැටිලා තියෙන අවස්ථාවේදි මේ රටේ කොන්ද පනක් තියෙන නායකයෙක් විදියට මෙරට කෝටි ගණනාවක් ජීවත්වන අපේ ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් එතුමාගේ ආර්ථිකය සැලැස්ම සහ එතුමාගේ ඒ පූර්ණ දේශපාලනය සනිටුහන් කරගෙන මේ රටේ අග්‍රාමාතයවරයා විදියට එතුමා පත්වෙනවා. අද වෙන කොට සතුටුයි කියන්න, ලංකාවේ තියෙන ඉන්ධන පිරවුම්හල්වල මේ රටේ මාසයක් එකාමාරක් තිස්සේ තිබ්බ ඒ ඉන්ධන පිරවුම්හල්වල තිබ්බ පෝලිම් අද වෙනකොට පෙට්‍රල් පෝලිම් මේ රටේ අඩුවීමක් වෙලා තියෙනවා. ගරු අග්‍රාමාතයතුමාගේ ඒ වැඩ පිළිවෙලත් එක්ක ඒ වෙච්ච සිදුවිම මේ සති දෙකක් ඇතුලත එතුමා යම් කිසි දෙයක් මේ වෙනකොට පැහැදිලි කරලා අවසානයි. වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමාටත් සුභ පතනවා මේ අවස්ථාවේදි ඔබතුමත් මේ අපේ කාලයක් තිස්සේ මොරටුවේ මන්ත්‍රීවරයෙක් වෙලා නියෝජ්‍ය නගරාධිපතිවරයෙක් වෙලා අද වැඩ බලන නගරාධිපති බවට පත්වීම සම්බන්ධව, මාගේ පෞද්ගලික ස්තුතිය මේ අවස්ථාවේදි පුදකරනවා. ඒවගේම 2022.05.09 දින මේ රටේ වෙච්ච හානිය මේ රටේ මොකක් හරි දේශපාලන පක්ෂයක් තුලින් මේ රටේ ජනතාවට විශාල හානියක් දේශපාලඥයන්ට විශාල හානියක්, ඒවගේම මම කථා කරන්නේ මොරටුව මහා නගර සභාවේ වෙච්ච හානිය

සම්බන්ධව. ජනතාවක් නියෝජනය කරන කොට්ඨාශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විදියට මේ නගර සභාව තුල 2022.05.09 දින නගර සභාවට පළාත් පාලන ආයතනයක් විදියට මේ රටේ මේ ගමේ මේ මොරටුවේ ජනතාවට සේවයක් කරන ස්ථානයක් විදියට මේ නගර සභාවට වෙච්ච හානිය සම්බන්ධව කථා කරන්න ඕන. ඒ මොකද මොරටුව ජනතාව ලක්ෂ දෙකකට වැඩි ජනතාවක් ජීවත්වෙන ගම් 29 කොට්ඨාශ 29 ක් මේ මොරටුව ආසනයේ මේ මොරටුව මහා නගර සභාවට වෙලා තියෙන හානිය විශාල හානියක් බවට පත්වුනා. කිසිසේත් අපි ඒක අනුමත කරන්නේ නැහැ. කෝටි 15 කට ආසන්න හානියක් මොරටුව මහා නගර සභාවට වෙලා තියෙනවා. එම නිසා මම මේ ගැන කථා කරන්නේ මේක අද හෙට නෙමෙයි මේක බලපාන්නේ. මේක බලපාන්නේ තව අවුරුද්දක් දෙකක් මොරටුවේ ජනතාවට සංවර්ධනය කරන්න තියෙන ඒ මුදල් තමයි මේ හානියට නිසා අපිට ඉදිරියට වැය කරන්න වෙලා තියෙන්නේ.

**03 (05)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, පසුගිය 9 වෙනිදා සිදුවුන සිද්ධිය පිළිබඳ අදහස් භුවමාරු වුනත් අපි දන්නවා (ඌ) වගන්තිය යටතේ යෝජනාවක් තියෙනවා එ යෝජනාව යටතේ අපේ අදහස් ප්‍රකාශ කරනවා. එනමුත්, ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම පැමිණිල්ලක් විදියට ඉදිරිපත් කරනවා මෙන්න මේ කාරණය, හැබැයි මේ කාරණය පැමිණිල්ලක් ලෙස ඉදිරිපත් කරන්න වෙන්නේම මේ 9 වෙනිදා ඇතිවූ සිද්ධිය නිසා. මොරටුව ජනතාවට සති කිහිපයක් යනකම් නිශ්චිත සේවාවන් ප්‍රමාණය ලබාදීමට නොහැකිව මොරටුව ජනතාව විශේෂයෙන් කසල ප්‍රශ්ණයේදි කාණු පිරිසිදු කිරීම් ආදි ඒ වැදගත් දෛනික කටයුතු සතියක් දෙකක් යනකම් ඇණහිටියා. මෙයට වගකියන්න ඕන කවුරුන්ද කියන එක අද මුල මොරටුවම දන්නවා. එවැනි තත්වයක් ඇතුලත ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබ මේ පුටුවේ සිටින නිසා මම මේ පැමිණිල්ල කරන්නේ ඔබේ අවධානයට මහජන නියෝජිතයෙක් ලෙස මා මීට මාස දෙකකට ප්‍රථම හරියටම ගත්තොත් හතරවෙනි මාසේ පලවෙනිදා මම ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂකතුමාට භාරදෙනවා. සොයිසාපුර ජනතාවගේ ගැටලුවක් සම්බන්ධයෙන් ඔවුන්ගේ ඉල්ලීමක් විදියට කාණු පද්ධති දෙකක් පිරිසිදු කරලා දෙන්න කියලා අද වෙනකම් ඒ කටයුත්ත ඉටුවෙලා නැහැ. මා මේ පිළිබඳව අවස්ථා ගණනාවකදීම ප්‍රශ්ණ කරා මුලින්ම මට දැන ගන්න ලැබුණේ ඉහලින් ලැබුණු ඔඩර් නිසා අපේ දේවල් කරන්න බැහැ කියන අදහස ඒ කියන්නේ ඔය පුටුවේ කලින් හිටපු කෙනාගේ අනුදැනුම මත පමණක් ඒවා සිදු කරන්න ඒවා දිගින් දිගටම සිද්ධවුනා අපි දන්නවා හැබැයි මොරටුව ජනතාවගේ විශේෂයෙන් අපි නියෝජනය කරන සොයිසාපුර ජනතාවගේ ගැටලුවක් ඉදිරිපත් කරාම ඒවා ඉෂ්ට නොකර ඉතාම කුහක දේශපාලන අවස්ථාවාදි තත්ත්වයක් නිර්මාණය කරගන්නවා නම් හරිම කණගාටුයි අපි විශ්වාස කරනවා ඔබතුමා තාවකාලිකව හරි වැඩ බලන නගරාධිපතිවරයා මේවාට අවධානය ලක් කරන්න. මේ පුද්ගලිකව සුදේශ් ඉන්ද්‍රජිත් ඉදිරිපත් කරන ඉල්ලීමක් නෙමෙයි, මොරටුවේ බදු ගෙවන ජනතාව සොයිසාපුර ජනතාවගේ ඉල්ලීමක් එක නිසා ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් අපි නැවතත් ඉල්ලීමක් කරනවා අඩුම තරමේ ඊලග සතියෙවත් මෙය ඉවරකරලා දාන්න. මෙහි සමහර සේවකයන් සමහර නිලධාරින් තවමත් වැඩ කරන්නේ තමන්ට ඕන ඕන ආකාරයට කියලා අපිට පේනවා. ඒනිසා අපි ඉතාම කාරුණිකව ඉල්ලනවා මහජන නියෝජිතයෝ ඉදිරිපත් කරන ගැටලු මේවා අවධානයට ලක්කරන්න. දේශපාලන භේදයෙන් තොරව ඒ ගැටලු වලට විසඳුම් දෙන්න. මෙහි පිටපතක් ඔබතුමාට දෙන්නම් මෙහි ඇඩ්රස් කරලා තියෙන්නේ ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂකතුමාට නිසා. අපි කාරුණිකව මේ කාරණය මතක් කරනවා කසල ප්‍රශණයත් මේ පහුගිය සිද්ධිය ඇතුලතදි සති ගණනාවක් ගැටලුවක් බවට පත්වෙලා තියෙනවා ඒක තාමත් හරි තැනකට ගෙනියන්න බැරිවෙලා තියෙනවා විශේෂයෙන් සොයිසාපුර වැනි තැනක මහල් නිවාස අතිදැවැන්ත විදියට කසල ප්‍රශ්ණය නැවතත් උග්‍රවෙලා තියෙනවා. මිනිස්සු දැන් පාර පුරා කසල දාලා තියෙනවා ඒ කසල ඇද්දේ නැති නිසා මා සෞඛ්‍ය කමිටුවේදි ඒ පිළිබඳව අදහස් මතු කරනවා. ඒනිසා මේවාට අවධානය ලක්කරලා ඉක්මණින් මේ කටයුත්ත නිමා කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03 (06)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මැයි මාසේ 9 වෙනිදා මේ සිදුවුණ සිද්ධියත් සම්බන්ධව අපේ ඉල්ලීම තියෙන්නේ ආයතනයක් හැටියට මේ ආයතනයට සිදු වූ විශාල හානිය සම්බන්ධව පුළුල් පරික්ෂණයක් කරන්න කියලා ඉල්ලනවා, අනිත් පැත්තෙන් ගත්තම එය පොලීසිය විසින් ඒ කරන පරික්ෂන සම්බන්ධව ඉතාමත් ඉක්මනින් මේ සම්බන්ධන්ව කරුණු සොයා බලා එ අවශ්‍ය කරන නීතිමය කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා වගේම, වැඩ බලන ගරු නගරාධිපතිතුමනි මේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී මහජන නියෝජිතයන් හැටියට අපිත් පොඩි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා ඒ මොකද මම ජීවත්වෙන ඉදිබැද්ද ප්‍රදේශයෙත් ජනතාව අපට ප්‍රශ්න නඟනවා මේ නවවෙනිදා සිදුවීම සම්බන්ධව කිසිම දෙයකට සම්බන්ධ නැති සාමාන්‍ය මිනිස්සුන්ටත් මේ නීතිය ක්‍රියාත්මක වීමේදී මගේ ඉදිබැද්ද සේවා පටුමගේ මම ඉතාමත් හොඳට දන්න හඳුනන බොහොම සාමකාමී මනුස්සයෙක්ටත් මම හිතන්නේ බන්ධනාගාර ගත කරලා තියෙනනවා ඉතින් එ නිසා එ අයගෙන් අපිට චෝදනාවක් එනවා මේ අහිංසක අයව ඇයි මේ වගේ දඩමීමා කරගෙන ඇයි මේ නීතිය ක්‍රියාත්මක කරන්නේ කියලා එ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න, පොලීසියෙන් ඉල්ලීමක් කරන්න, මේ පරික්ෂන කිරීමේදී ඉතාමත් හොඳින් සොයා බලා සමාන්‍ය මිනිසුන්ට අසාධාරණයක් නොවන විදියට මේ නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. මම එතනින් එහාට එගැන කතා කරන්න යන්නේ නෑ හැම පැත්තේන්ම අධිකරණ කටයුතු සිදු වෙන නිසා. ගරු නගරාධිපතිතුමනි මගේ අනිත් ඉල්ලීම තමයි ඉදිබැද්ද ධම්මාදාර පෙර පාසලේ මිට මාස 3කට පෙර මන් හිතන්නේ එම පෙර පාසල පවත්වාගෙන යන ගුරුතුමිය මේ වාහලේ ශිට් එකක් හෝ දෙකක් කැඩීම සම්බන්ධව මාස 3කට ඉස්සෙල්ලා තමයි මෙහෙට දන්වලා තියෙන්නේ නමුත් දන්වලා මාසයකට පස්සේ ගිහිල්ලා ස්ථාන පරික්ෂාවක් කරලා එ ශිට් දෙකක් කැඩිලා කියලා අපේ වැඩ කරන කෙනෙක් කිවුවට පස්සේ අද වෙනකම් එක යථාතත්වයට ගන්න කටයුතු කරලා නෑ, එ ගුරුතුමිය දැකලා තියෙනවා මිට මාස කිහිපයකට පසු ඉදිරියෙදී වහින්න පුළුවන් මේක ඉතා ඉක්මනින් හදාගන්න ඕන කියන නිසා තමයි මේක දැනුවත් කරලා තියෙන්නේ ඊයේ මම යනකොටත් එ ශිට් එකෙන් බේරෙන වතුර පාර සිවිලිමෙනුත් ඇවිත් පොළවට වැටිලා ඒ ළමයි අධ්‍යාපනය කරන හොල් එකේ හැම තැනම වතුර පිරිලා තියෙනවා,එක පාටිෂන් කරන්න ගහලා තියෙන බෝඩ් පවා පෙගිලා අද හරි අසරණ තත්වයකට පත්වෙලා තියෙනවා මම හිතන්නේ පෙර පාසලට එන්න දරුවන් මෙන්ම ගුරුතුමිය මෙන්මදෙමාපියෝත් පත්වෙලා තියෙනවා මේ වැස්ස දින වල සමහරක් වෙලාවට දරුවන්ව නැවත පෙර පාසලට ගන්නේ නැතුව නිවෙස් වලට පිටත් කරලා යවන්න වෙනවා ගරු වැඩ බලන නගරාධිපතිතුමනි මේක මහා සුළු දෙයක් මේ තියෙන පරන ශිට් දෙකක් හරි තුනක් හරි ගෙනියලා කරන්න ඕන දෙයක් මේක ඉතා ඉක්මනින් කරන්න කියන ඉල්ලීම එ පෙර පාසල් දරුවන් වෙනුවෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

නාගරික ඉංජිනේරුතුමිය මේක ගැන විශේෂ අවදානයක් යොමු කරලා මේ සතියේ ඉවර කරන්න.

**03 (07)** <u>මහ නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම මේ පවසන දේ පවසන්නේ කිසිම කෙනෙක් සමඟ ද්වේෂයකින්, තරහකින්, වෛරයකින් නෙවෙයි. නමුත් මේක මතු පරපුරට වැරදි පූර්වාදර්ශයක් වෙන නිසා තමයි මන් මෙදේ පවසන්න උත්සහා කරන්නේ ගිය මැයි මස 9වෙනිදා මගේ නිවසට වූ ප්‍රහාරය මා දැඩි ලෙස හෙළා දකිනවා, මාව ඉලක්ක කරලා මගේ තට්ටු හතරේ නිවෙස් 4ම විනාශ කරලා සියළුම දේවල් විනාශ කරලා, රත්තරන් බඩු සියළුම දේවල් මන්කොල්ලා කෑවා.

එ වගේම ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මගේ ඒ නිවෙස් 4ටම ප්‍රහාර එල්ල කරන අවස්ථාව වෙනකොට මම නිවසේ තමයි හිටියේ එ වෙලාවේ මට දිගින් දිගටම දුරකථන ඇමතුම් ගලාගෙන ආවා යන්න නගර සභාවේ බස් එක ගිනිතියලා එතන දෙන්නෙක් ඇවිත් කිවුවා ඔසඳට සළකන්න ඕන එහේ යමු කියලා එ එක්කම විශාල පිරිසක් අපේ නිවස පැත්තට ආවා එ එනකොට මං උත්සහ කරා මගේ දරු දෙදෙනයි බිරිඳයි සමඟ පිටව යන්නට, නමුත් අපිට පිටව යන්නට හම්බවුනේ නෑ මාව හැටක් හැත්තෑවක් වට කර ගත්තා, වටකරන් මගෙන් පරුෂ වචනයෙන් ඇහුවා ඔසඳ කෝ කියලා මම කිවුවා දන්නේ නෑ කියලා, එ කියන්නේ ඒ

අපූ පිරිසේ කවුරුත් මාව අඳුරන්නෙවත් නෑ.මම අවුරුදු 16ක් දේශපාලනය කරලා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරලා ඉන්නේ මාව නොදන්න කෙනෙක් මොරටුවේ ඉන්න විදියක් නෑ. ඊට පස්සේ මගේ සහෝදරයා හිටියා පාරේ එයාව ඔසඳ කියලා හිතාගෙන එතනට දුවගෙන ගියා ඒ වෙලාවේ මම ගිහිල්ලා මගේ සේවා ස්ථානයේ වහලට නැගලා තමයි මං බේරුනේ. වහලට නැඟලා ඉද්දි මගේ චුටි බාබා අවුරුදු 4ක් වයස බාබා මාත් එක්ක තමයි එළියට ආවේ ඊට පස්සේ බාබාව හොයාගන්න බැරි උනා ඊට පස්සේ මට කෝල් එකක් එනවා මගේ නෝනාගෙන් නෝනයි දුවයි මගේ පල්ලෙහා අම්මලාගේ ගෙදර කුස්සියේ හැන්ගිලා ඉන්නවා කියලා එතකොටත් මට සද්දේ ඇහෙනවා විදුරු කඩනවා දැන් මොකද කරන්නේ කරන්න දෙයක් නෑ ඔයා හැන්ගිලා ඉන්න කියලා මගේ යාළුවෙක් ඇවිල්ලා වයිෆ්වයි බාබාවයි අරන් යනවා එක ගැනියෙක් ඇවිල්ලා කියනවා උ ඉන්නේ පල්ලේහා නෙවෙයි උඩ උඩ ගිහින් කඩපන් කියලා ඊට පස්සේ මගේ තට්ටු 4ම විනාශ කරලා මගේ සියළු දේ මන්කොල්ල කාලා කට්ටිය යනවා එහෙම යන්නේ මගේ ගෙදර තිබ්බ මං ක්‍රිකට් කරන නිසා එ තිබ්බ බැට්යි අපේ රෙලින්ස් තිබ්බාළුවයි කඩාගෙන. ඊට පස්සේ මගේ ෆුට් සිටියත් කඩනවා මේ මොරටුවෙන් ආලාභ හානි වුනේ මට මාව තමයි ඉලක්ක උනේ මම මොකද්ද කරේ එකම දේ මන් දේශපාලනය කරපු එක විතරයි දේශපාලනය කරලා අපි සමන්ලාල්ලා, බොබිලා ලඟින් ආශ්‍රය කරනවා නමුත් අපි අනුන්ගේ මුදල් ගසා කාපු මිනිස්සු නෙවෙයි. සේනක මන්ත්‍රීතුමා කිව්වා ප්‍රැන්සිස්ලා, අනුරලා අහිංසක මිනිස්සු ගෙවල් කැඩුවට ඔක්කොම එකයි හැබැයි නගරාධිපති එක්ක එකතු වෙලා අනිත් කට්ටිය සැප වින්දා කියලා එහෙම හිතන්න එපා මන්ත්‍රීතුමා එක වැරදී අපි පොඩිකාලේ ඉඳන් අපේ තාත්තලා ව්‍යාපාරිකයෝ අපි එ හරහා තමයි දේවල් හම්බකරන් ඉන්නේ අපි කවදාවත් කාගෙවත් දේවල් කඩාවඩාගෙන නෑ එහෙම වෙලා ගරු උපනගරාධිපතිතුමනි, හරි නම කිවුවේ නෑ ඔබතුමා දන්නවා අපිට ලොකු ඩැමේජ් එකක් වෙලා තියෙනවා කියලා, මේක මට උනා වගේම අපි බලමුකෝ ඉස්සරහට. ගරු නගරාධිපතිතුමනි කඩේ කඩනවා මම බලන් ඉන්නවා ඊට පස්සේ මාව ගන්නේ මට මගේ පොලීසියේ මිත්‍රයක් ඇවිත් කියනවා මචං උඹ කොහෙද ඉන්නේ මන් කිවුවා මන් වහල උඩ ඉන්නේ කියලා, උඹට විනාඩියක් දෙන්නම් උඹ වහලේන් පනිනවද මන් අඩි 15ක් උස වහලේන් පැනලා බයිසිකලයට නැගලා තමයි යන්නේ, ගොඩක් කට්ටියට මේකට සතුටු ඇති, මොකද අපි දේශපාලනය කරපු නිසා මගේ දරුවෝ තාමත් රෑට නින්දෙන් නැගිටිනවා මගේ පොඩි දරුවා තාම ගොත ගහනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එෆ් සී අයි ඩී එකේ නිලධාරියෙක් පස්සේ මට හමුවුනා හමුවෙලා මට කිවුවා ඔසඳව බේර ගත්තේ එයා කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නිමේෂ් මගේ මිතුරා එයාගේ හෙල්මට් එක මට දාලා මාව අරගෙන ගියේ එහෙම වෙලා තියෙද්දි අපේ කඩේ තියෙන CCTV කැමරා වලින් අපි සියළුම රූපරාමු වලින් අඳුන ගන්නවා මූණු මේ මෙයා මේ අහවලා කියලා අඳුරගෙන අපි මොරටුව පොලීසියට ගිහින් පැමිණිල්ලක් දැම්මා. මම සහ මාගේ මල්ලීලා දෙන්නා දීලා දවස් 8ක් 10ක් ගියා පොලීසියෙන් ගත්ත ප්‍රතිචාරයක් නෑ ඊට පස්සේ මම කරේ මොකද්ද පොලිස්පතිතුමා ගාවට ගිහින් පැමිණිල්ලක් දැම්මා මට මේ සම්බන්ධව සාධාරණයක් ඉටු කරලා දෙන්න කියලා. මට මගේ ජීවිත වලට තර්ජනයක් උනේ නෑ අපේ ආලාභ හානි විතරයි එක ප්‍රශ්නයක් නෑ අවුරුදු 16ක් දේශපාලනය කරානේ ඕවා විඳදරාගන්න ඕන, මගේ වයසක අම්මයි තාත්තයි තාත්තට ඇවිදගන්නත් බෑ හැරමිටි ගගහා එළියට ගියේ මගේ ගේ සම්පූර්ණ විනාශ කරලා අල්මාරි සේරම විනාශ කරලා අවසානේ මගේ පවුලගේ ඇඳුම් පවා අරන් ගිහිල්ලා එච්චරටම පීචන් සමාජයක අපි ජීවත් වෙන්නේ අපි අයේ කටවත් උදව් කරනවද කියලා අපි අයේ හිතලා බලන්න ඕන. එච්චරටම අපි කලකිරිලා ඉන්නේ ගරු වැඩ බලන නගරාධිපතිතුමනි.මට වුණ දේ මම දේශපාලනය කරන නිසා කමක් නෑ මගේ දරුවන්ට වෙච්ච දේ මම අනුමත කරන්නේ නෑ අනුමත කරන්න ඕනේත් නෑ එක සොබාදාහමින් සිද්ධ වෙයි මට අවශ්‍ය නෑ අවනීතියෙන් මේක ජය ගන්න මම නීතියේ පිළිසරණ පතනවා ඒ වගේම තමයි අවසානෙට මන් කියන්න ඕන මට අද වුණ දේ හෙට ඔබට වෙන්න පුළුවන් ගරු මන්ත්‍රීවරුනි ගරු නිලධාරිනි මගේ දරුවෝ හැමදාම නින්දෙන් ගැස්සිලා ඇහැරෙනවා එදා ඒ සිදුවීමට මෙතන ඉන්න හැම කෙනෙක්ම සුව සේ නිදියනවා ඇති එ මට හිනෙකින්වත් වරදක් නොකරපු නිසා ඔබට හොඳ නින්දක් ඇති. එ නිසා මතක තියා ගන්න මේ දෙවියන් වහන්සේගේ බුදුරජානන් වහන්සේගේ ධර්මය මේ අපිව ආරක්ෂා කරන්නේ අපිට අතක්වත් තිබ්බේ නෑ අපේ

දේපල නැතිවුණා විතරයි අපි දේශපාලනය කරනවා එ නිසා මම බලාපොරොත්තු වෙනවා ඔබතුමාගෙන් සහ මේ ගරු සභාවෙන් අපිට සාධාරණයක් ගෙන්න කියලා අපි කවදාවත් අනුන්ගේ දේවල් කඩාවඩාගන්න කෙනෙක් නෙමෙයි. කාරුණිකව ඉල්ලා සිටිනවා මම වෙනුවෙන් කතා කරලා මට දුරකථන ඇමතුම් දීලා මගේ සැප දුක සොයා බලපු සියළු දෙනාට මගේ ස්තූතිය පුදකරනවා.

**03 (08)** <u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, මටත් ඉදිරිපත් කරන්න තියෙන්නේ එ වගේ සිද්ධියක් තමයි නමුත් මම හිතන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන්නේ තහනම් සංවිධානයක් නෙවෙයි අපි එ රැස්වීමකට සහභාගි වුණා නමුත් ඇත්තෙන්ම මේ අරගලෙදි සිදුවුණ සිද්ධිය අපි සම්පූර්ණයෙන්ම හෙලා දකිනවා අපි රැස්වීම ඉවර වෙලා නැවත නිවෙස් බලා එනකොට ඊට පස්සේ තමා අපිට මේ තත්වය ඇතිවුනේ හේතුව සමහරවිට ඔබතුමාන්ලා බලන්න කවදාහරි ඔබතුමන්ලාට ඔබේ පක්ෂයක් හෝ නායකයෙක් එන්න කිවුවොත් අපිට යන්න වෙනවා. නමුත් අපි වැරදි දේවල් අනුමත කරලා නෑ කොහෙදිවත්, නමුත් මට අද කියන්න කණගාටුයි ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි මටත් සිද්ධියක් උනා, මගේ ව්‍යාපාරික ස්ථානයට ප්‍රහාරයක් එල්ල කරා නමුත් එ අවස්ථාව වෙනකොටත් මගේ දියණිය උපාධි පරික්ෂනය සඳහා පාඩම් කරමින් හිටියේ ඒ අවස්ථාවේ තමයි මගේ ව්‍යාපාරික ස්ථානයේ විදුරු වලට ගල් වලින් පහර එල්ල කරේ එ නිසා මගේ දියණිය බය වෙලා තියෙනවා නමුත් ගරු නගරාධිපතිතුමනි මම කියන්න කැමති කටුබැද්දේ කවදාවත් මේ වගේ නෑ දේශපාලන සහජීවනය හොඳින්ම තිබ්බ නගරයක් තමයි මොරටුවේ කටුබැද්ද මොකද මීටර් 500 ඇතුලත මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා කවදාවත් අපි තුන්දෙනා කවදාවත් උඹ නොදකින්වත් කියාගෙන නෑ මොනවා හරි ප්‍රශ්නයක් තිබ්බොත් අපි තුන්දෙනා තමයි ඉක්මනටම එන්නේ, රාත්‍රි 11 වෙනකොට සේනක මන්ත්‍රීතුමා මට කෝල් එකක් දුන්නා අයියේ මොකද්ද වුණ ප්‍රශ්නේ කියලා. අපි එ විදියටයි ජීවත් වුනේ මම මේක ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරනවා මගේ වෙච්ච ප්‍රහාරයට එක්සත් ජාතික පක්ෂයවත් සජබේවත් කිසිම සම්බන්ධයක් නෑ කියලා එ නිසා මං කියන්නේ ඉදිරියටවත් මේ තුච්ච දේශපාලනයට ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි මේ අපේ තව මාස 2ක් වගේ කාලයක් තියෙන්නේ අපහු මමනම් මේ දේශපාලනයට ඉදිරිපත් වෙන්නේ නෑ. මට ලොකු සන්තෝෂයක් තියෙනවා මම දැනට මගේ කොට්ඨාශයේ අලුතෙන් පාරවල් 26ක් හදලා තියෙනවා අපි මේකෙන් ලොකු තැනකට ඇවිල්ලා මේකේ අද බෝධි සත්වයෝ වාගේ කතා කරන මන්ත්‍රීවරු වගේ රැකියා විකුණගෙන නෑ, අයතා ප්ලැන් පාස් කරලා සල්ලි අරන් නෑ අපේ දෑත් පිරිසිදුයි. මම කාවදාවත් ආයේ දේශපාලනයට සම්බන්ධ වෙන්නේ නෑ එකට හේතුව මගේ ගමේ මිනිස්සු ඔක්කෝම දන්නවා ඒ මිනිස්සුන්ට මං කතා කරනකොට මට කියනවා අනේ මන්ත්‍රීතුමා එහෙම කරන්න එපා නමුත් අපි කරනවා, මේ වගේ තුච්ච දේශපාලනයක් කරනවනම් තවදුරටත් මේ දේශපාලනය කරලා තේරුමක් නෑ, අපි දේශපාලනයෙන් හම්බකරලා නෑ මම අවුරුදු තිහ,හතලිහක් තිස්සේ ව්‍යාපාරය කරලා මේ තත්ත්වයට අපු මනුස්සයෙක් මට ගෙවල් 4ක් තියෙනවා මම ගෙවල් හදලා නෑ මේ දේශපාලන සල්ලි වලින් මම ළමයෙකුටවත් කන්න දීලා නෑ මේ සල්ලි වලින් අදටත් මට මේ දෙන දීමනාව මගේ බැංකුවේ තියෙන්නේ එවට අත තියලා නෑ මගේ ලමයගේ උපාධි පරික්ෂනයෙ අවසාන විභාගය තියෙන්නේ දැන් මමත් මගේ දුවත් එක්ක රෑ 1 වෙනකන් පාඩම් කරන්න ඇහැරන් ඉන්නවා මොකද හුළඟට සද්දයක් ඇහුනත් තාත්තේ කියාගෙන මගේ කාමරයට එනවා, මන්ත්‍රීවරුනි මේ තත්ත්වය අපිට විතරක් නෙවෙයි හෙට ඔබටත් වෙන්න පුළුවන් මම එකයි කියන්නේ, මගේ හැම දේකටම සේනක මන්ත්‍රීතුමා ඇවිල්ලා බලනවා මොකද මල්ලි වුනේ කියන එක අපි දේශපාලන වශයෙන් නෙවෙයි බොහොම සහජීවනයෙන් ජීවත් වුන මිනිස්සු නමුත් මේකට එක්තරා කුපාඩි පිරිසක් මේ දෙයට සහභාගි වුණා, ඒ කුපාඩි පිරිස සහාභාගි උනේ අපේ තියෙන අන්‍යොන්‍ය සම්බන්ධතාවය නැති කරන්න වෙන්න පුළුවන්, අනුර මන්ත්‍රීතුමත් සැරීන් සැරේට අපේ ගෙදරට ආවා මේ මන්ත්‍රිකමේ ඉන්න පළවෙනි සුදුසුකම බොන්න පුළුවන් වෙන්න ඕන, අනිත් එක මැරවරයන් අශ්‍රය කරන්න පුරුදු වෙන්න ඕනනමුත් ඔය දෙකම මට නෑ එ කියන්නේ මට මෙතන ඉන්න සුදුසුකම් නැති නිසා මගේ දේශපාලන ජීවිතේ අපහු මං නගරසභා මන්ත්‍රීවරයෙක් හැටියට ඡන්දේ ඉල්ලන්නේ නෑ, මොකද එ හේතුව අපිට සුදුසුකම් නැති නිසා, මගේ ගේ ඉස්සරහින් ගිය මිනිස්සු අනුර මන්ත්‍රීතුමා එක්ක හිනාවෙලා ගියා මන් මිනිස්සු වශයෙන් කියන්නේ නෑ මං කියන්නේ එක්සත් ජාතික පක්ෂයවත් සජබේවත් නෙවෙයි මේක කරේ, අපි කියන්නේ මේකයි මේ නගර සභාවේ දේපල අපිට දීමනාවක් වශයෙන් ලක්ෂ 10 මුදලක් ලැබිලා තියෙනවා නමුත් අපිට අනිතිමට තියෙන්නේ කණගාටුවක් මොකද අන්තිමට එවත් අරගෙන මේ නගරසභාවත් විනාශ කරලා තමයි අපි යන්නේ ඇත්තටම ගරු මන්ත්‍රීවරුනි දැන් එක එක්කෙනාට බොලේ පාස් කරන්න ඕන වෙලාවක් නෙවෙයි ඇත්තටම අපි හැමෝම සාමුහිකව එකතු වෙලා මේ නගරසභාවට වෙච්ච ආලාභය පිළිබඳව

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අනුර මන්ත්‍රීතුමා දෙපාරක්ම කිවුවා එක්සත් ජාතික පක්ෂයවත් සජබේවත් නෙවෙයි කියලා

(සභාවේ ඝෝෂා)

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි පැහැදිලිව දැක්කා කටුබැද්ද හන්දියේ හිටියේ කවුද කියලා, මම වගකීමෙන් ප්‍රකාශ කරන්නේ, මට කියන්න තිබ්බනේ යූඑන්පි නම් එගෝල්ලෝ කියලා මම එහෙම කියන්නේ නෑ මම එහෙම දෙකයි පනැහේ මිනිහෙක් නෙවෙයි.

(සභාවේ ඝෝෂා)

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම් සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ඔබතුමා කියපු එක සම්බන්ධයෙන් ගැටළුවක් නෑ, ඔබතුමා එහෙම කියන එක හොඳයි එත් ඔබතුමා එහෙම කියනකොට අනිත් පක්ෂ වලට ප්‍රශ්නයක් තියෙනවනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, සහොදර මන්ත්‍රීතුමා මන් කියන එක අහන්නකො, මම කිවුවේ මාගේ හෘද සාක්ෂියට අනුව මම දැක්ක දේ පමණයි, මම දැක්ක අයගේ එක එක්සත් ජාතික පක්ෂ එක්කෙනෙක්වත් හිටියෙ නෑ. ගරු උපනගරාධිපතිතුමනි අපිටත් ලක්ෂ 10ක 12ක දීමනාවක් දීලා තියෙනවා මේ සභාවෙන් එක අරගෙන මේ සභාව විනාශ කරලා යන එක නෙවෙයි අපි කරන්න ඕන එ නිසා ඔබලාගෙන් ඉල්ලන්නේ මේ නගර සභාවට පහර දෙන විඩියෝ එකක් හරි තියෙනවනම් එක ඉදිරිපත් කරන්න කියලා මේක අපි ගොඩ නගන්න උත්සහ කරමු. මමනම් අයේ දේශපාලනයට එන්නේ නෑ මොකද මන් අර කිවුව සුදුසුකම් මට නෑ මම අරක්කු බොන්නේ නෑ බීලත් නෑ, තව හිටියොත් ඒ දෙකත් දාගෙන තමා මට ගෙදර යන්න වෙන්නේ එ නිසා මම දේශපාලන වශයෙන් මහජන නියොජිතයෙක් වෙන්නේ නෑ අදටත් ඒ පාපයෙන් මම දුක් විදිනවා මොකද මගේ ළමයා අදටත් රෑ එළිවෙනකන් පාඩම් කරනකම් මම ඉන්නවා පුටුවක් තියාගෙන. විභාගයට තව මාස 06ක් තියෙන්නේ ඇත්තටම අපි මාර මානසික අසාහනයකින් ජීවත් වෙන්නේ, අද ඔබතුමාලා හිනා උනාට ඊළඟ වටය ඔබතුමාලට වෙන්න පුළුවන් එ නිසා මන් කියන්නේ බෝලේ පාස් කරන්නේ නැතුව මේ නගර සභාවට වෙච්ච ආලාභයට අසාධාරණය හොයලා අපි එකතු වෙලා එකට ක්‍රියාමර්ගයක් ගමු කියන ඉල්ලීම කරනවා.

**03 (09)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම මම ඇත්තටම කණගාටු වෙනවා ගිය මැයි 9 වෙනිදා සිද්ධ වෙච්ච දේ සම්බන්ධව අපේ මන්ත්‍රීවරුන්ගෙ දේපළ හානියට වගේම, අපේ ගරු ගාමිණි ලොකුගේ ඇමතිතුමාගේ ගෙවල් 3ක් විනාශ වෙලා තියෙනවා මුළු මුනින්ම අළුම වෙලා තියෙනවා මම ගොඩක් කණගාටු උනා මට ඇත්තටම ඇඩුනා හැමදාම උදේට ගියාම බත් ටිකක් කාලා එන්නේ ඒ ගෙදරින් එතුමා එක්ක එ නිසා ඒ ගැන ගොඩක් කම්පාවට පත් වෙනවා, ගරු නගරාධිපතිතුමනි ගිය මහා සභාවේ අපේ නගරාධිපතිතුමා පොඩි ප්‍රකාශයක් කරා ගිය පාර්ලිමේන්තු මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට යන්න බැරි උන හේතුව ගිය කාල සීමාවේ වරිපනම් වැඩිකරපු නිසා කියලා, එ වගේම ගරු ජනාධිපතිතුමා කිවුවා වරිපනම් ගාස්තු වැඩිකරන්න එපා කියලා. වෙන කොහෙවත් වැඩි කරලා නෑ මොරටුවේ විතරයි මොරටුමුල්ල, විල්ලෝරාවත්ත, කඩලාන තියෙන හැම පොඩි ලැලි ගෙදරකම මඩුවක් කරනවා මේ මිනිස්සු එකට කාර්තුවකට ගෙවනවා 250ක්කාර්තුවකට වත්තක් ගත්තොත් ඒ වත්තේ තියෙනවා කඩ 10ක් පොඩි පොඩි කඩ ඒ කඩ 10ට 250ක් ගෙවනවා එ වාගේ හැම චුටි කඩයකටම ගැහුවා 5000ක් රුපියල් 5000ක් ගෙවා ගන්න යන්න බෑ නමුත් කොරොනා වාගේ වසංගත ප්‍රශ්න ආවා පහුගිය කාල සීමාවේ එතකොට මොකද උනේ ඇඳිරිනිතීය ආවා ඊට පස්සේ ආර්පීකේට ගිහින් බඩු ගෙන්න ඕන ආර්පීකේට ගිහින් බඩු ගන්න පර්මිට් එකක් ඕන එතකොට AG ඔෆිස් එක දෙන්නේ නාගරාධිපතිතුමා වරිපනම් ගෙවලා ආවොත් විතරයි. එජී ඔෆිස් එකට කිවුවා වරිපනම් කොලේ නැතුව දෙන්න එපා කියලා එතකොට මේකේ පොළිම තිබ්බා අන්න අරහෙට සල්ලි ගෙවන්න 5000 ගානේ මිනිස්සුන්ට

5000ක් ගෙවා ගන්න බෑ ඇත්තටම නමුත් එ මිනිස්සු 5000 ගෙවුවේ ජිවත් වෙන්න ඕන නිසා 250, 5000ක් කරා කියන්නේ කියක්ද එ වගේම ගරු නගරාධිපතිතුමනි 2500ක් මගේ හෝලෙයට තිබ්බෙ 2500ක් ගෙවන්න එක පාරට 2500ය 17500ක් කරා මම එතකොට එ අවස්ථාවේ මිලියන 10ක් ගන්න සෙලාන් බැංකුවෙන් ලැස්තිකරගෙන තිබ්බා එක ගන්න හදනකොට මට අනුකූලතා සහතිකේ අවශ්‍යයි එක ගන්න මන් වරිපනම් ගෙවන්න ඕන. කියක්ද ගෙවන්න ඕන එක්ලක්ෂ අනූතුන්දහක් ගෙවන්න ඕන ඒ සම්බන්ධව වුඩ මාණිකායක් ඒ වුඩ මාණිකායට මන් කිවුවා මේක අපිට 2500 ගානේ ගෙවන්න හදලා දෙන්න කියලා ඒ වුඩ මාණිකාය කියනවා මේක නගරාධිපතිතුමාගේ ඕඩර් එකක් එක මෙවා කරන්න බෑ එක්ලක්ෂ අනූතුන්දාහම ගෙවන්න ඕන කියලා ඊට පස්සේ මන් ගෙවුවා එක්ලක්ෂ අනූතුන්දාහක්, ඇත්තටම මේ නගර සභාවට බදු ගෙවන අයගේ සල්ලි වලින් තමයි අපි මේ වාහන අරන් තියෙන්නේ මේ වාහන ඔක්කෝම විනාශ වෙලා ගිහින් තියෙනවා එ විනාසේ අපිට දාරාගන්න බෑ එක ඇත්ත එ වගේම ගරු නගරාධිපතිතුමා සීයට 10,15,20 ට පොළියට අරගෙන මිනිස්සු කොළඹ ගිහිල්ලා බඩු ගෙනල්ලා පෙමන්ට් එකේ දාලා වික්කා එ බඩු ටික උස්සගෙන ඇවිල්ලා මේකේ ඇතුලේ ලම්පු තෙල් දාලා විනාශ කරා එතකොට හෝස් ගාලා යන්නේ නැද්ද මේ මොරටුවේ ජනතාව ගොඩක් විකුණන්නේ පිළියන්දල, කැස්බෑව මොරටු පාලම අයිනෙ තමයි ඒ මින්ස්සු ජිවත් වෙන්නේ එ මිනිස්සුන්ට ජීවත් වෙන්න දුන්නේ නෑ මේ මොටුවේ එ මිනිස්සුන්ට ජිවත් වෙන්න දුන්නේ නැති ප්‍රතිඵල තමයි ඔය ඇවිත් තියෙන්නේ නැත්තම් ලංකාවේ කිසිම නගර සභාවක් ගිනි තියලා නෑ මේක ගිනි තියන්න හේතුව මොකද එ මිනිස්සු පලිගන්න වේදනාවකින් හිටියේ එ වේදනාව තමයි ඔය පිට කරේ. එ මිනිස්සුන්ට වේදනවාක් තියෙනවා එ මිනිස්සුන්ගේ බඩු ටික මේක ඇතුලේ දාලා ගිනි තියලා විනාශ කරා එ විනාශේ මුල තමයි ඔය තියෙන්නේ ගරු නගරාධිපතිතුමා කටුබැද්දේ කැම්පස් එක ලඟ අවුරුදු 50ක් තිස්සේ බත් විකුණනවා එ ඉස්සරහා එ බත් ටික ගෙනල්ලා විනාශ කරලා දැම්මා එ මිනිස්සු අපිට ඇවිත් කියනකොට අපිට කියන්න දෙයක් නෑ එ මිනිස්සු කියනවා අනේ අනුර මන්ත්‍රීතුමා අපි කොච්ච කාලයක් මෙතන බත් විකුණනවද බත් ටික ගෙනල්ලා නගර සභාවෙන් විසිකලා දැම්මා බත් ටික විකුන ගන්න දුන්නේ නෑ එවා සාප මේ නගර සභාවෙන් දෙන්න පුළුවන් වද තිස්දෙකම දීලා තියෙන්නේ මේ මිනිස්සුන්ට ගරු නගරාධිපතිතුමා මේකේ නාගරික කොමසාරිස්තුමා හිටියට වැඩක් නෑ එකවින්ටන් හිටියට වැඩක් නෑ ප්‍රධානියා නගරාධිපතිතුමා, දෙක වුඩ මාණිකාය, තුන කොමසාරිස්, හතර තමයි එකවින්ටන් තේරෙනවද අපේ මේ ඔසඳ මන්ත්‍රීතුමා අපේ කීල්ස් සුපර් එකේ ගෙට එහා පැත්තේ අනුකූලතා සහතියක අරන් දෙන්න හැදුවා නමුත් එක කැන්සල් කරා ලක්ෂ 15ක් ඉල්ලුවා ලක්ෂ 15ක් අනුකූලතා සහතිකය දෙන්න මේවා තමයි නැති කරන්න බොහොම ස්තුතියි.

**03 (10) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. පිලිප් ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා</u>**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම අවුරුදු 04ක මන්ත්‍රීවරයෙක් උනත් මගේ දේශපාලනයට අවුරුදු 50කට වැඩි, නමුත් සේනක මන්ත්‍රීතුමාලා දන්නවා මන් එදා මොන දේශපාලනය කරත් මම සුහදව දේශපාලනය කරපු මනුස්සයෙක්. නිශාන්ත මන්ත්‍රීතුමා දන්නවා මගේ දේශ පාලනය මොකද්ද කියලා, මම කාටවත් අබමල් රේණුවක වරදක් කරලා නෑ. මගේ දේශපාලන පක්ෂය වෙනුවෙන් මට ඕන තින්දුවක් ගන්න මට අයිතියක් තියෙනවා මගේ දේශපාලන පක්ෂය වෙනුවෙන් මට ඕන තැනක යන්න අයිතිය තියෙනවා, නමුත් මගේ ගෙදරට පහර දුන්නේ මට අත දික් කරන්න පුළුවන් එ කියන්නේ මගේ ගෙදරට පහර දීපු මිනිස්සු කවුද කියලා මන් ඇහෙන් දැක්කා ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමා දන්නවා මම දේශපාලනය කරේ කාගෙන්වත් දේවල් කඩා වඩා ගන්නවත්, හොරකම් කරලාවත් අරක්කු විකුණලවත් නෙවෙයි මන් දේවල් හදා ගත්තේ මම දහඩිය මහන්සියෙන් හම්බ කරලා ඔබතුමා දන්නවා මට ව්‍යාපාරයක් තිබුණා එ ව්‍යාපාරය කරලා හම්බකරපු දේවල් තමයි මේ මම මේ දේශපාලනයෙන් සතපහක් වංචා කරලා හදා ගත්තු එවා නෙවෙයි, අරක්කු විකුණලා හදාගත්තු එවාත් නෙවෙයි, මම හොරකම් කරලා හදාගත්තු එවත් නෙවෙයි ගරු නගරාධිපතිතුමනි නමුත් මගේ නිවසට පහර දුන්නේ, මම මේ දේශපාලනයකට මඩ ගහනවා නෙවෙයි නිශාන්ත මන්ත්‍රීතුමා දන්නවා මං එදා කාලේ ඉදලා වාමාංශික දේශපාලනයක් කරපු කෙනෙක්, මගේ ගෙදරට පහර දුන්නේ ජනතා විමුක්ති පෙරමුනේ නාගරික මන්ත්‍රීවරයාගේ මල්ලී ඇතුළු කණ්ඩායමක්. මගේ අහෙන් දැක්කා බොබි මන්ත්‍රීතුමාගෙ ගෙදට ගහලා ඔන්න එනවා ප්‍රැන්සිස් අයියේ කියලා ගැහැණු දෙන්නෙක් කෑගහනවා මම මගේ ගෙදර ජිවත් වෙන්නේ තනියම මගේ පොඩි පුතා ගෙදරට එන්නේ ර.10න් පස්සේ එයාගේ ව්‍යාපාර වහලා කරලා එද්දි ර. 10 විතර වෙනවා මම ගෙදර ජිවත් වෙන්නේ තනියම මම එ ඉන්න අවස්ථාවේ මගේ ජීවිතේට මන් ආසායි මම ඉස්සරහා දොර වහලා පිටිපස්සේ දොරෙන් එළියට බහිනවා තාප්පේ ගාවට වෙලා බලන් ඉන්නවා ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීතුමාගේ මල්ලි කඩුවක් අරගෙන අනුර කියන පුද්ගලයා මන් හොඳින් දන්නවා කොරලවැල්ලේ කුඩු විකුනන පුද්ගලයෙක් එ මිනිහත් එක්ක

ඉස්සරහින් එනවා ඇවිල්ලා මන් හැන්ගිලා බලන් ඉන්නවා මගේ ගෙදරට පහර දෙනවා එතකොට කියනවා ඕකාව ඇදලා ගනින් ඕකගේ අතපය කපලා දාන්න කියලා මගේ ජීවිතේට මන් ආසායි එක නිසා මන් පැනලා යනවා මම පැනලා යනකොට තව 15ක් විතර පාරේ ඉඳගෙන හත්දෙනෙක් එක්ක ඇවිල්ලා මගේ ගෙදරට පහර දෙනවා. දේශපාලන පළිගැනීම් ගන්නවනම් ගරු වැඩබලන නගරාධිපතිතුමනි මම අවුරුදු 50ක් දේශපාලනය කරා මගේ ගෙදරට කවුරුත් අද වෙනකම් ගලක්වත් ගහලා නෑ මට කාටවත් අත දික් කරන්න අවශ්‍ය නෑ නමුත් මම පක්ෂයකට මඩ ගහන්න හදනවා නෙවෙයි මගේ ගෙදරට වෙච්ච අසාධාරනය ඇහෙන් දැක්කා මගේ හිතට වේදනයි අවුරුදු 50ක් දේශපාලනය කරලත් මගේ ගෙදරට කවුරුත් ගලක් ගහලා නෑ, අපිට අබමල් රේණුවක වචනයක්කියලා නෑ මම මේ සභාවට අපු දවසේ ඉඳලා මගේ මේ සහෝදර මන්ත්‍රීවරු මාත් එක්ක කතා කරන්නේ අපි එක පක්ෂයක මිනිස්සු වගේ කිසිම කෙනෙක් මට වචනයක් කියලා නෑ නමුත් අපේ හිතට වේදනයි අච්චර කල් කොරළවැල්ලේ ජීවත් වෙලා, මම කොරළවැල්ලේ ඇටේකින් පැළ වෙච්ච මිනිහෙක් අතු කැළක් හිටවපු මිනිහෙක් නෙමෙයි, මේ වගේ අසාධාරණ විදියට මගේ ගෙදරට පහර දීලා මගේ ලේලිගේ බඩු ටිකට ගල් ගහලා කුඩු කරලා මගේ පුතාගේ දරුවා ගෙදර එන්නේ නෑ බයට ආවාම කියන්නේ සීයා මම මේ ගෙදරට එන්නේ නෑ ඔයා මට වෙන ගෙයක් හදලා දෙන්න කියලා, දේශපාලනය කරලා අපිට ලැබුනේ මෙච්චරයි එ කියන්නේ දේශපාලනය කරලා මගේ ගේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාගෙ මල්ලිටකුඩු කරන්න පුළුවන් කමක් තිබුනා, අයියගේ හයිය අරගෙන මල්ලී මගේ ගේ කුඩු කරා කියන එක මන් මේ අවස්ථාවේ කියනවා මම එක කියන්න බය වෙන්න ඕන නෑ, මන් හැම දෙනාටම කියන්නේ මේ වගේ ජාරා විදියට පළිගන්න එපා දේශපාලනය දේශපාලනය විදියට කරන්න ඕන.

**03 (11) <u>මහා නගර සභා මන්ත්‍රී - කේ. පී. එම්. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි තාමත් මේ න්‍යාය පත්‍රයේ පෙත්සම් පැමිණිලි සන්දේශ අයිතමය යටතේ තමයි ඉන්නේ, කාරුණාකරලා ඉන්න මේ තත්වය අහගෙන හිටියොත් මේ සමාජයේමේ දේශපාලනය මීට වඩා ගැඹුරින් තේරුම් ගන්න අවබෝධකර ගන්න ඕන ඔයගෝල්ලෝ හැම දෙනාම දන්නවා දීර්ඝ කාලයක ඉඳලා නිශාන්ත ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෙක් විදියට මේ සභාව නියෝජනය කරද්දි ඔයගොල්ලෝ සහ අපි අතර තිබ්බ එ දේශපාලන සම්බන්ධය අර දේශපාලනයට එහා ගිය කොන්ත්‍රාත් එකක අපි අතර ගොඩ නැගුනා එක පිලි ගන්නවා එ නිසා ගරු නගරාධිපතිතුමනි ඌ වගන්තිය යටතේ යෝජනාවක් තියෙනවා යෝජනාව තියෙන්නේ මීට ආදාලව එ නිසා මේ සභාව දැන්වත් මන් ඉතා ඕන කමින් ඉල්ලා හිටිනවා එ කියන්නේ මේ සමාජය යම් මට්ටමකට ගිනි දැල් පල්ලේහාට ගිහින් තියෙන්නේ කොයිවෙලාවේ ඇවිලෙයිද දන්නේ නෑ අපි කවුරුත් එක, හොඳින් මිනිස්සු හාමතේ අද මිනිස්සුන්ගේ ඉන්ධන ප්‍රශ්නේ යම් ප්‍රමාණයකට අද කියන කතන්දරයට එකඟ නැති උනත් යම් ප්‍රමානයකට අඩු වෙලා අද ඉඳන් විදුලිය කැපෙනවා ඒ නිසා දෛනික ජීවිත ගෙවා ගන්න බැරි මිනිස්සුන්ගේ විශාල අදෝනාවක් කෝපයක් ලෙස තාමත් තිබෙන වෙලාවක එ නිසා නිකන් ඔය 9 වෙනිදා ප්‍රහාරයට ආදාලව සිද්ධ වෙච්ච ප්‍රතිප්‍රහාරයේදි සිද්ධියට අපි කිසිසේත් එකඟ නෑ,ප්‍රචන්ඩත්වට එකඟ නෑ 88ට 89 සිදුවීම් වලින් පස්සේ 8 දෙනෙක් ගහලා වෙඩි තියලා මරද්දි ගල් කැටයක් අරගෙන කටවත් හිංසනයක් කලා කියලා චෝදනා නෑ, මේ එක තැනක විශාල පිරිසකගෙන් එක්කෙනෙක් ජවිපේ මන්ත්‍රීවරයෙක්ගේ මල්ලී කෙනෙක් කියලා දැන් චෝදනාව ගෙනවනම් ඔහු තමයි මේ විනාසේ කරේ එක අපරාධයක් සාහසික අපරාධයක් එක නිසා මේ සිදුවීම් ඇතුළේ දැන් කිවුවනම් එ හිටපු අනිත් පිරිස මොන පක්ෂ වලද කියලා දන්නවද කියනවද එහෙම නෑ එ නිසා මේක වෙන දේශපාලන පක්ෂයකට ගෙනියලා තමන්ගේ එ හිතේ වේදනාව හරි ප්‍රැන්සිස් මන්ත්‍රීතුමා එක හරි එකට එකඟයි තමන්ගේ ගෙට ගහනවනම් යමෙක් ඇවිල්ලා එ වේදනාව මන් අද මේ කරන කතාවට වඩා ඔබේ පපුවට දැනෙන එකක් දැක්කට පස්සේ කෙනෙක් ඉන්නවා එක ඔබ දැක්කේ එක හරි, හැබැයි අපි එවෙලෙම කතා කරලා කිවුවා වහාම නීතිමය පියවර ගන්න. නීතිමය ක්‍රියාමාර්ග වලට යන්න. එකෙන් කියන්නේ නිකන් සහසික විදියට ජනතා විමුක්ති පෙරමුණ, එහෙම කරන්න එපා. මේක ජනතා විමුක්ති පෙරමුණ කිසි තැනක උගන්නලා ප්‍රකෝප කරලා පක්ෂය විදියට මේක කලා කියන එක කියනවනම් ගරු උප නගරාධිපතිතුමනි එක සහසිකයි එක නිසා මම මේ යෝජනාවට කතා කරන්න හිටියේ මොකද මේ හැම මන්ත්‍රීවරයෙක් එක්කම අබමල් රේනුවකවත් පුද්ගලික ප්‍රශ්නයක් නොවී. එ නිසා ගරු නගරාධිපතිතුමනි මට මේක අවුලනනත් පුළුවන් මේක නිවන්නත් පුළුවන් එකයි මන් කියන්නේ ගිනි ගනිමින් තියෙන,

(සභාවේ සෝෂා)

<u>**වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු මන්ත්‍රීතුමනි, මැයි 9 වෙනිදා වෙච්ච සිද්ධියෙන් තව හානි වෙච්ච මන්ත්‍රීවරු ඉන්නවා එ නිසා අවස්ථාව දෙමු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - කේ. පී. එම්. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි පෙත්සම් හා පැමිණිලි අයිතම යටතේ මට ඕන වුනේ අර මේ මේක කියපු නිසා එකට පිලිතුරක් දෙන්නයි ඊට පස්සේ මේ පොදු සමාජය ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා මට විනාඩියක් දෙන්න

<u>**මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා තිලකසිරි ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ දුවගේ විවහා මංගලා වෙනුවෙන් තමයි බාර් එකෙන් මුදල් ගෙවලා තමයි ගත්තේ, එතුමට වාහනයක් නෑ එ නිසා බයික් එකේ තමයි අරක්කු ටික ගැට ගහගෙන ගියේ මේක හැන්සාඩ් ගත වෙනවා එ නිසා කාරුණා කරලා ඔබතුමා මේක ඉල්ලා අස්කර ගන්න.

(සභාවේ ඝෝෂා)

මම ඔබතුමාට ගරු කරන මන්ත්‍රීවරයෙක් එ නිසා තමයි මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරේ ඔබතුමා කැමතිනම් කරන්න නැත්තම් එපා. මම ඔබතුමාට අදත් ගරු කරනවා මේ ප්‍රකාශය ඇතුලෙත් එක මන් කියනවා, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරේ කැමතිනම් කරන්න නැත්තම් නිකන් ඉන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - කේ. පී. එම්. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ මම ඉල්ලා සිටින දේ තමයි. මේ සභාවෙන් මොනවා හරි පිහිටක්මොරටුවේ ජනතාව බලාපොරොත්තු වෙනවා මොරටුවේ ජනතාව ජනතාවගේ පැත්තෙන් පත්වේලා තියෙන පීඩාකාරී තත්ත්වය පොදුවේ මේ සභාවට අවස්ථාවක් හම්බවෙලා තියෙනවා, මේ සභාව ජනතාවගේ සභාවක් මේ සභාවේ මුදල් මහජනතාවගේ මුදල් මේ ජනතාව පීඩාවට පත්වෙනවනම් එ පීඩාවට පත්වෙන මහජනයාට සහනයක් සරනක් පිහිටක් වෙන එක මේ සභාවේ වැඩක්, ඉතිහාසයේ මේ සභාවේ එවැනි වැඩ කටයුත්තක් සිද්ධ නොවිච්ච බව පිහිටක් වෙනවනම් ඒ පිහිට ඇතුලේ වෙන යම් මොකක් හරි බලාපොරොත්තුවක්තියෙන බව තමයි මේ ජනයා දන්නේ එ නිසා මම එවා ගැන කතා කරන්න යන්නේ නෑ. ගරු නගරාධිපතිතුමනි අපි සභාවක් විදියට අඩුම තරමේ පාසල් දරුවන්ට පොත් බෙදා දෙන්න, නෑ මම හිතනවා මේ වේලාවේ එ කියන්නේ අපිට ඕන වෙලාව නෙවෙයි මේ වේලාවේ මහජනයාගේ ඉතා අහිංසක මිනිස්සු තමන්ගේ දරුවට පාසලට ගෙනියන්න තියෙන අම්පන්න පත්පොත් අරගන්න බැරිව ඉතා වේදනාවක ඉන්න වේලාවක් අවම වශයෙන් අපි කරන දෙයක් මේ සභාව මේක අවස්ථා දෙකක කරපු දෙයක් එ නිසා මේ පෙත්සම් පැමිණිලි අයිතමය යොදා ගන්නේ අපිට පුළුවන්නම් දින දෙක තුනක් ඇතුළත මෙන්න මේ දරුවන්ට පොත්පත් ටිකක් හරි දෙන්න මේ සභාවට එහෙම නැත්තම් අපි විශාල කාලයක් තවදුරටත් අපි මේ සංවාදයේ නියෙලමින් කාලය අවසාන වෙලා අපි යන්න යනවා. එ නිසා අඩුම තරමේ අපි ඉතා ඕන කමින් ඉල්ලනවා මොරටුවෙ අහිංසක ජනයාගේ දිළිදු ජනයාගේ දරුවන්ට අපි හැම වසරකම එ ප්‍රධානය කරන ලද පොත් පත් ටික මේ දින දෙක තුනක් ඇතුළත මොන විදියෙන් හරි එ ජනයාට ලබා දෙන්න. මේ සභාව ඔබේ මේ ඔබේ බදු මුදල් වලින් ඔබට පිහිටක් ඔබට සරණක් මොකද ගරු නගරාධිපතිතුමනි මේ සභාවේ දේපළ වලට පහර දීලා තියෙනවා දැක්කම මට මගේ දැසේ කඳුලු වැක්කෙරුනා මම දීර්ඝ කාලයක් මේවා පූජනීය දේපළ ලෙසයි දකින්නේ එකෙක් පොල්ලෙන් ගහනකොට මම බඳලා අල්ල ගත්තා ඌ පොල්ල උළුක්කරා මට ගහන්න එ නිසා අපි අරගල කරේ උගුර ලේ රහා වෙනකන් කෑගැහුවේ මේවා රකින්න මේවා ජනතාවගේ දේවල් මම ඔවුන්ට කෑගහලා කිවුවා මේවා සමන්ලාල්ගේ දේවල් නෙවෙයි මේවා උඹලගේ දේවල් මේවා ඔයගොල්ලන්ගේ ළමයිගේ දේවල් එ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ පැත්තේ විදුරුවට විතරක් ගැහුවා තව හත් අට දෙනෙක් එකතුවෙලා එ පෙළපාලිය තල්ලු කරලා පාරට දා ගත්තා හවස්වරුවේ සිද්ධ වෙච්ච එක තමයි ගිනිතැබීම එ නිසා ගරු නගරාධිපතිතුමනි සියළු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා හිටින්නේ තර්ක විතර්ක කරගමු, දේශපාලන මත වාද වලට හැප්පෙමු දේශපාලනයේ බොහොමයක් සිදුවීම් අපි ඉගෙනගෙන තියෙන්නේ හඩා වැටෙන්නවත් කොක් හඩලා සිනා සෙන්නවත් නෙවෙයි. සිද්ධ වෙච්ච වරද නිවැරදි කර ගන්න පුළුවන් තැනට අපි අපේ අරගලය කර ගමු. පුද්ගලිකව අපි කාත් එක්කවත් අපිට ගැටුම් නෑ හැම තිස්සේම දේශපාලනය ඉක්මවා ගිය පුද්ගලික හිත් රීදීම් ඇති වෙනවනම් එවා අවම කර ගන්න වලක්වගන්න

උත්සහ කරමු, අපි හැමදාම මන්ත්‍රීවරු නිතර දකින මුහුණ බලන කතා කරන, අපිට බෙදා ගන්න දෙයක් නෑ එ නිසා අපි සභාවක් ලෙස ඔබ පළවෙනි වාතාවට ඔබ ඔය දූරය දරන්නේ ඔබට ඔය දූරය දරන්නවත් අඩුම තරමේ මේ සභාවේ වගකිව යුත්තා තමන්ගේ නියෝජ්‍ය නගරාධිපතිවරයාටවත් එ බලතලවත් ප්‍රධානය කොට වැඩ කරන්නවත් මානසික තත්වයකින් සිටිය කෙනෙක් නෙවෙයි, මම ඔහුට තනියෙන් චෝදනා කරන්නේත් නෑ එ නිසා අද අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවනම් ඔහු තවමත් නගරාධිපති අවස්ථාවක් තියෙනවා මේ නගරසභාවේ මන්ත්‍රීවරුන්ට මම කියන්නේ අඩුම තරමේ මේ මොරටුවේ ජනතාවගේ දරුවන්ට පොත්පත් ටික අපි දෙමු, පොත්පත් දෙන යෝජනාවවත් අපි මේක සම්මත කරගන්න තින්දුවක් අරගමු. නැත්තම් අපි අද දවසේම එක එක්කෙනාගේ මේ සංවාදය ඉවර වෙනකොට මේ සභාව ඉවරයි අන්තිමට කරපු දෙයක් නෑ, එ නිසා ජනතාවගේ පැත්තෙනුත් හිතලා ජනතාවගේ වෙනුවෙනුත් කරන්න පුළුවන් දේ ගැන හිතලා මම පෙත්සම් පැමිණිලි යටතේ ඉල්ලන්නේ මේ දෙන දේ ඉක්මන් කරලා දෙන වැඩපිලිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03 (12) <u>මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු වැඩබලන නගරාධිපතිතුමනි, මම හිතන්නේ මේ සභාවට සිදුවෙලා තියෙන අගතිය සම්බන්ධව බොහො දෙනා කතා කළා නිෂාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීත්මා මතක්කලා වගේ පෙත්සම් හා පැමිණිලි යටතේ එ තරම් කාල වේලාවක් අපිට ගන්න බෑ අපේ සභාවේ අනිත් කටයුතු ගැන බැලුවම, හැබැයි එතුමා බොහො වේලාවක් අහගෙන දරාගෙන ඉදලා අපිට අපේ අදහස් ඉදිරිපත් කරන්න තියෙන වේලාවේ එ කාරණය මතුකළා කොහොම උනත් අපි එතුමට මෙය හදිස්සියෙ මතක්වීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමාව මේ සියළු අවුල අස්සේ සුබ පතනවා සුබ පතන්නේ හිතේ සතුටවෙන ආකාරයෙන් දැකලා එතුමයි ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ගරු නගරාධිපතිතුමා මේ අවාසනාවන්ත සිදුවීමේදී ඔබතුමාට වැඩ පවරන්න තීරණය කරනකොට එකටයම්මැදිහත්වීමක් කරපු කෙනෙක් විදියට එක ආරංචි වෙච්ච සමහර මන්ත්‍රීවරු අන්න බොබියා දුවලා ගිහිල්ලාසමන්තට අරක අරන් දීලා අපි හැදුවේ වෙන වැඩක් කරන්න එක කරගන්න බැරි උනා කියපු අය අද මේ සභාවේ ඔබතුමාට සුබ පතනවා දැක්කම මට ඉතාම සතුටක් දැනෙනවා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඒකයි මගේ සතුට ඒ නිසා ගරු වැඩබලන නගරාධිපතිතුමනි මේ සභාවට වෙච්ච හානිය සම්බන්ධව මේ ලැබිච්ච ගණනය කිරීම කොතරම්ද කියලා තාම අපිට හරි ඉලක්කම නෑ කෝටි 10 කියනවා, 15යි කියනවා, 20යි කියනවා මන්ත්‍රීවරයෙක් විදියට අපිට තාම වගකිවයුතු විදීයට මේ සභාවේවත් ප්‍රකාශයක් ලැබිලා නෑ,මෙක කවුරු හරි කරපු අය කියපුවද ලියපු අය කියපුවද කියලා අපි දන්නේ නෑ හැබැයි සමහර අය එහෙම කියනවා මෙච්චරයි කියලා කොහොම උනත් මේ මොරටුවේ මහජනතාවගේ බදු මුදල් මොරටුවේ මිනිස්සුන්ට සේවය කරන්න තියෙන ආයතනයේ තියෙන දේවල් ඒ දේපළ විනාශ කිරීම මොන යම් හේතුවක් මත හෝ සිදුකිරීම වැරදී එක හෙලා දකිනවා. ගරු නගරාධිපතිතුමනි, ඊළඟ කණගාටු දායක කාරණය තමයි මට පුද්ගලිකව සිදුවෙච්ච ඒ තමයි එදා දින සවස් භාගයේ මේ නිවාස වලට පහර දීමේ කටයුත්ත කොරළවැල්ල ප්‍රදේශයේ අරම්භ කරේ මගේ නිවසේ මගේ නිවස කියන්නේ ගරු වැඩ බලන නගරාධිපතිතුමා ඔබතුමා දන්නවා මන් කුළි නිවසියෙක් එ ප්‍රදේශයේ ධාර්මිකවජීවත් වෙන දෙපළක් අවුරුදු 10ක් ඉතා අඩු කුලි පදනමකට මටදීලා තිබ්බ නිවාසය මම ජීවත් වෙන නිවසට තමයි ඇවිල්ලා පහර දුන්නේ මේකට අපහු නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා ඇවිලෙන්නේ නෑ කියලා මන් විශ්වාස කරනවා ජනතා විමුක්ති පෙරමුණේ කොරලවැල්ල නාගරික මන්ත්‍රීවරයා රංගන ප්‍රනාන්දු මන්ත්‍රිවරයාගෙ මල්ලී තමයි එකට මුලිකත්වය අරගෙන කටයුතු කරේ, එක මෙහෙයුවේ එක අපි දැක්කා ඊට කලින් මට සතියකට දෙකකට කලින් පණිවිඩයක් එවනවා නගර සභාවේ වැඩ කරන සේවකයෙකුගේ අතේ උබටත් ගහනවා බොබියටත් ඇවිත් ගහනවා. මන් රංගන මන්ත්‍රීතුමාට කිවුවා මල්ලී මෙහෙම කියලා තියෙනවා මට යන්න වෙන ගෙවල් නෑ මම කුලි ගෙදර එතන ඉන්නේ මන් ඉන්න වෙලාවක එන්න කියන්න කතා කරන්න මන් හිතුවේ නෑ ලයිට් නැති වෙලාවක එයි කියලා ලයිට් නැති වෙලාවේ සහවර පිරිසක් එක්ක ආයුධ අරන් ඇවිල්ලාමේ පහර දිම කරේ. එකට මම ආදාල ස්ථාන වලට පැමිණිලි කරලා තියෙනවා අවශ්‍ය නිත්‍යානුකූලව කටයුතු කරලා තියෙනවා, නිශාන්ත ප්‍රදිනාන්දු ජනතා විමුක්ති පෙරමුණේ සංවිධායකතුමාට අපේ දීර්ඝකාලීන දේශපාලන හිතවතාට කතා කරලා කිවුවම එතුමා වගකිමෙන් කිවුවා ප්‍රශ්නයක් නෑ අපි එ අයට කලිනුත් කියලා තියෙනවා මේවා කරන්න යන්න එපා කියලා ඔබ නිත්‍යානුකූලව කටයුතු කරන්න කියලා එතුමට ගෞරවයක් විදියට මන් කියනවා එතුමා මට එක එ වෙලාවේ කිවුවා අපේ සුදේශ් මන්ත්‍රීතුමාත් මට එහෙම කිවුවා ඉතින් එක නිසා, හැබැයි මගේ නිවසට පහර දීලා ඉවර වෙලා ප්‍රැන්සිස් මන්ත්‍රීතුමාගේ නිවසට පහර දුන්නෙත් එ කණ්ඩායම ප්‍රැන්සිස් මන්ත්‍රීතුමාගේ නිවසට පහර දීලා ඉවර වෙලා කොරළවැල්ලේ

ඉන්දික ප්‍රනාන්දු සහෝදරයාගේ ගෙදරටත් ගිහින් පහර දුන්නා එ ගෙදර විදුරුව බින්දා, විදුරු බින්දා විතරක් නෙවෙයි එ සහෝදරයාගේ හිතවතෙක්ගෙ ළමෙක්ගෙ උපන් දිනයක් වෙනුවෙන් එ ගොල්ලෝ අරක්කු බොතලයක් පානය කරන්න අරන් තිබුණා එ අරක්කු බොතලයේ තුන්කාලත් අරන් ගියා එගොල්ලෝ මන් කිවුවා එවා ගණන් ගන්න එපා පෝය දවස් වලට එයාලට අරක්කු ඕන වෙනවා එ නිසා වෙන්න ඇති කියලා මන් කිවුවා හැබැයි රංගන ප්‍රනාන්දු මන්ත්‍රීතුමා උදේ ඉන්දික සහෝදරයාගේ ගෙදරට ගිහින් කිවුවා ඉන්න මන් විදුරු ටික දාලා දෙන්නම් කියලා මගේ සහෝදර මන්ත්‍රීතුමා මටවත් අපේ ප්‍රැන්සිස් මන්ත්‍රීතුමාටවත් කතා කරලා එක කිවුවේ නෑ එකයි අපේ කණගාටුව එක කිවුවනම් මේ ප්‍රශ්නය මීට වඩා අඩුවෙන් බේරගන්න තිබුණා එක නිසා මම ඒ කටයුත්ත ගැන ඊට වඩා කතා කරන්නේ නෑ හැබැයි ගරු වැඩබලන නගරාධිපතිතුමනි මගේ නිවසේ විදුරු ටික බින්දා කවුරුත් දන්නවා මන් ව්‍යාපාරයක් විදියට මුද්‍රණ කටයුතු කරගෙන යනවා මගේ සෝකේස් එකක් තිබ්බා විදුරු ප්‍රින්ට් නොකරපු මග් ටික තිබ්බා සියල්ල සුණු විසුනු කළා, ෆොටො කොපි ගහනවා ගෙදර වෘත්තියක් විදියට කරන දෙයක් ෆොටො කොපි බන්ඩල් ටික අරගෙන ගියා එ වගේ අනිත් දේවල් වලට මේ රටේ කරපු දේවල් දැක්කම මේ සභාවට කරපු දේවල් දිහා බැලුවම එවා අපිට ලොකු දේවල් නෙවෙයි අපිට එවා දරගන්න පුළුවන් එ නිසා අපි එවා දරාගෙනම ඉන්නවා, හැබැයි ගරු නගරාධිපතිතුමනි මන් සතුටු වෙනවා අපේ දරුවෝ පිළිබඳව මගේ දරුවා තීරණය කරා කුඩු කරපු විදුරු වලට එ විදුරු දාලද බලන්න පහුගිය දවස් ටිකේ අපේ පාරෙන් ගිය අය දකින්න ඇති වෙසක් එකට අපේ දරුවෝ කැටයම් කපලා මෙත්තා මුදිතා කරුණා උපේක්ෂා කියලා අලවලා අපි එ විපත ඒ විදියට සැමරුවා අපි එ විදියට දාරා ගත්තා එක අපිට උගන්වපු නිසා මේවා නෙවෙයි අපේ ජීවිත වල අපිට සිද්ධ වුණේ අපිට වෙඩි තිබ්බා වෙඩි තිබ්බ වෙලාවේ මිනිස්සු අපිට කිවුවා අද වෙඩි තියපු ක්‍රමය ඇතුළේ අපි එකට ජීවත් වෙන කාලයක අපි ඉන්නේ කියලා වෙඩි තියපුවයි වෙඩි වැදුනුවයි වෙඩි තියපු ක්‍රමය මේ ඔක්කොම එකට එකතු වෙලා තියෙන වේලවක් ඉතින් නගරාධිපතිතුමනි මේක ගැන අපි තවත් කතා කරන්න උත්සහ කරන්නේ නෑ එක නිසා අපි ඉතාම ගෞරවයෙන් මේ හැම දේශපාලන පක්ෂයකටම කියනවා දේශපාලන ජයග්‍රහන මිනිස්සු ලබනවා දේශපාලන පරාජයන් ලබනවා බිඳ වැටීම් ඇති වෙනවා පසු බැසීම් ඇති වෙනවා හැබැයි එවා සමරන්න ඕන එ විදියට නෙවෙයි අපේ දේශපාලන ඉතිහාසය තුළ මේ අවුරුදු 15, 16 කාලේ මන්ත්‍රීවරයෙක් හැටියට විතරක් නෙවෙයි ඊට කළිනුත් අපි විවිධ දේශපාලන ජයග්‍රහන ලබලා තියෙනවා රතිඤ්ඤා කරලක් මෙහෙම කරලා වෙනත් අපේක්ෂකයෙක්ගේ හෝ වෙනත් නිවසකට දාලා නෑ මිදුලකට දාලා නෑ එහෙමයි අපි දේශපාලනය කරලා තියෙන්නේ කොරලවැල්ලේ දේශපාලනය කරපු අය දන්නවා අපේ ගම් වල ඡන්ද පෙට්ටිය උස්සනකොට දේශපාලන පක්ෂ වල නියෝජිතයෝ ඇවිල්ලා ඡන්ද පෙට්ටිය උස්සනකොට කැගහලා හැබැයි සාමෙන් විසිර යනවා තිසරමන්ත්‍රීතුමත් දන්නවා කාලයක් අපේ පැත්තේ දේශපාලනය කරලා තියෙන නිසා ඒතුමා දන්නවා අපි කොහොමද දේශපාලනය කරේ කියලා අපේ වෛරයක් තරහක් නෑ අද ඉල්ලීම කරන්නේ දේශපාලනය කියන්නේ මිනිහට තාඩන පීඩන එල්ල කරන එකට නෙවෙයි එ නිසා ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් යටතේ මීට වඩා දීර්ඝව කතා කරන්නේ නැතුව නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීවරයා කාරණයක් ඉදිරිපත් කරා එ තමයි මේ වෙලාවේ මේ සමාජය විපතට පත්වෙලා ඉන්න වෙලාවේ අපි මොකක් හරි කරන්න ඕන කියන එක අපි ගිය සභාවෙත් මතක් කළා, මම ගිය සභාවෙන් උපුටා දක්වනවා මේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කතා කරාට පස්සේ අපි කිවුවා අපි කවුරුත් ඉන්නේ පෞද්ගලික දේවල් කතා කරන්න පුළුවන් තැනක නෙවෙයි අද අපි ඉන්නේ අපිව මහජන නියෝජිතයෝ වශයෙන් පත්කරපු ජනතාව වෙනුවෙන් යම් මැදිහත් වීමක් කරන්න අවශ්‍ය වෙලාවක කියලා එදත් අපි කිවුවා. ඒ නිසා වාහා වාහාම මහජන නියෝජිතයෝ හැටියට මොනවද පෙරලා හෙට දවසේ මොරටුවේ ජනතාව වෙනුවෙන් කරන්නේ කියන කාරණය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න කියන කාරණය පිළිබඳ ආදරණීය ඉල්ලීම කරනවා.

**03 (13)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මුලින්ම ඔබතුමාවැඩබලන නගරාධිපති දූරයසඳහා පත්වීම සම්බන්ධයෙන් උණුසුම් සුබ පැතුම් එක් කරනවා. විවාද කරන්න අවස්ථාවක් නොවුනත් සභාවේ බොහො මන්ත්‍රීවරු මේ සුවශේෂී තත්ත්වය ඇතුලේ ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධ එ ගැන උත්තර දීම කෙසේ වෙතත් මම මගේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ගන්නවා ගරු නගරාධිපතිතුමනි ගිය සභා වාරයේ මම මේ ස්ථානයේ නැගිටලා ප්‍රකාශ කරා බොහොම ඉක්මනට විශාල කැළඹීමක් මේ විදියට ගියොත් අපේ රටේ සිදු වෙන්න පුළුවන් කියලා හැබැයි හරිම කණගාටුයි මැයි05 වෙනිදා සභාව තිබුනේ මැයි 9වන දා එ කලකණ්නි දිනය උදා කරා කියලා මන් කියන්නේ උදා උනේ නෑ උදා කළා ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, දැන් මෙතන

සමහර අය මේ සියළු පව් සමන්ලාල් ප්‍රනාන්දු කියන මුව හමට තඩිබාන්න පටන් ගත්තා ඒ සමන්ලාල් නගරාධිපතිවරයා 9 වෙනිදා කරපු එ වැඩ කිසිදු ආකාරයකින් අනුමත කරන්නේ නෑ එක සම්පූර්ණයෙන් හෙළා දකිනවා. හැබැයි එක පවිච්චි කරලා රට කරපු අවලන් වැඩේත් එ විදියටම හෙළා දකිනවා ගරු වැඩබලන නගරාධිපතිතුමනි හැබැයි මේකේ ඇත්ත වගඋත්තර කාරයා ඒක්ක කතා කරන්නේ නෑ දැන් මේකේ ඇත්ත වගඋත්තර කාරයා සමන්ලාල්ද නෑ මගේ කියවීම අනුව ඒක ගොදුරක් මේකේ ඇත්ත වගඋත්තර කරු ජොන්ස්ටන්ද නෑ ඒ ගොදුරු සනත් නිශාන්ත මන්ත්‍රීතුමා ඒ ගොදුරු මේ තත්ත්වයට රට පත් කරපු මහ මොළකාරයා ගැන කවුරුත් කතා කරන්නේ නෑ ගොල්ෆේස් ඒකේ මහත්වරු කතා කරන්නේත් නෑ අනිත් පාර්ශව කතා කරන්නෙත් නෑ කවුද රට මෙතනට ගෙනාවේ ඒ අපදාව මිනිස්සුන්ට ඇති කරේ කවුද, මොන කුමන්ත්‍රණ අනුවද මේක සිද්ධ උනේ ඒ ගැන කතා නෑ ඒ වෙනුවට ඒකේ ප්‍රතිඵල ඒ කියන්නේ ඒකේ පලය ගැන කතා කරනවා මුදුන් මුල ගැන කතා කරන්නේ නෑ ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මට යුතුකමක් තියෙනවා ඒක ගැන යම් මැදිහත් වීමක්, අදහසක් දක්වන්න ගරු නගරාධිපතිතුමනි, මිනිස්සු පාරට බැස්සේ මිනිස්සුන්ට වේදනාවක් ඇතිවෙච්ච නිසා ඒ වේදනාව ඇති වුන නිසා තමයි මිනිස්සු පාරට බැහැලා කළු කොඩි අරගත්තේ, සමහර මිනිස්සු කළු කොඩි අතට දුන්නා සමහරු ස්වේච්චාවෙන් කළු කොඩි ගත්තා අරගෙන මේ අරගලයට මැදිහත් උනේ ඒ අරගලයේ ඇත්ත හේතු හොයනවා වෙනුවට ඒකට ප්‍රතිවිරුද්ධව අමන තකතීරු වැඩ කරපු නිසා තමයි අවසානයේ මේ නස්පැත්තිවලට මුහුණ දුන්නේ අඩන්න ඉන්න ඒකාට ඇහැට අඟිල්ලෙන් ඇන්න නිසා තමයි මේ දේ සිද්ධ උනේ මේක බලාපොරොත්තුවෙන් හිටියේ සමහරු කරගන්න බැරිව හිටිය වැඩේ කරලා දුන්නා අන්න ඒක කරලා දුන්න මොළකරු ගැන අපි කතා කරන්න ඕන ගරු නගරාධිපතිතුමනි, අපි අනේක වාරයක් දුක් වෙනවා ඒ උදේ ඇතිවෙච්ච අවාසනාවන්ත සිද්ධිය වගේම මේ සභාව විනාශ කරපු ඒක. මේ සභාව විනාශ කරපු ඒක ගැනනම් වෙන කතාවක් නිර්මානය කරන්න හදනවා මම කියන්න කැමති ගරු වැඩ බලන නගරාධිපතිතුමනි පාර්ලිමේන්තුවේ ඉතා අහිංසක මන්ත්‍රීවරයෙක් වන අමරකීර්ති අතුකොරළ මන්ත්‍රීතුමාව ඉතා සාහසික විදියට ඝාතනය කරා , ඒ සිද්ධිය වුණ වෙලාවේ මන් වෙසක් බඩු විකුණන ගමන් හිටියේ රථ ගාලේ මට ආවා ජංගම දුරකථනයට ෆේස් බුක් හරහාඅමරකීර්ති අතුකොරළ මන්ත්‍රීතුමාතමන්ගේ තුවක්කුවෙන් වෙඩි තියාගෙන සියදිවි නසා ගත්තා කියලා මම බැලුවා මේ සීන් ඒක මොකද්ද කියලා මම හිතුවා ජනතාවගේ ප්‍රහාරයට මුහුණ දෙන්න බැරිව ඒහෙම ඒකක් කරගත්තද කියලා මගේ හිතේ තිබුණා මම ඒක විශ්වාස කළා හැබැයි බලාගෙන ගියාම ඒ මන්ත්‍රීතුමාව ඝාතනය කරපු උන්ම වෙන්න ඕන එ වැඩේ කරේ තමන් මරපු ඒක නිවැරදි කරගන්න හැදුවා මිනිමරුවෝ තමයි ඒ වැඩේ කරේ දැන් මට ඒක මතක් උනේ මේ සභාව ගිනි තියන්න සභාවේ තැනකින් පෙට්‍රල් ගත්තා නිකන් අපිට මවන්න හදනවා මේ සභාව කාගේ හරි දේශපාලන උවමනාවක් මත ගිනි තිබ්බා කියලා ඒතකොට ඒකයි අරකයි දෙකම ඒකයි මට අනුවනම් ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ඉතාමත් කණගාටුයි මොකද මේ වගේ සිද්ධි වලට අපි දේශපාලනයේ ඕන තරම් මුහුණ දීලා තියෙනවා නමුත් අපේ සභාවේ මම පෞද්ගලිකව මගේ අතිශය කණගාටුව එල කරනවා විශේෂයෙන් අපේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල් වලට පහර දීම සම්බන්ධව. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි අපේ ගෙවල් බේරුනා කියලා සමහරු හාස්‍යයෙන් කිව්වා මම මේ මොරටුවේ මහල් නිවාස 3ක් හදන්න දායක වුණ කෙනෙක් මට තාම ගෙයක් නෑ මම ඉන්නේ කුලියට කෙසෙල් අජිත්ගේ නිවසක තමයි මම කුලියට ඉන්නේ මට නිවසක් නෑ ඒවගේම ගෙවල් තියෙන බොහොමයක් අපේ මන්ත්‍රීවරුන්ට මේ අවාසනාවන්ත සිදුවීමට මුහුණ දීමට සිදු නොවීම සම්බන්ධවද මන් සතුටු වෙනවා. මේ අවාසනාවන්ත සිදුවීමට මුහුණ දීමට අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ට සිදුවීම සම්බන්ධ කණගාටු වෙනවා වගේම අපේ බහුතරය මේ දේට මුහුණ නොදීම සම්බන්ධ අපි සතුටු වෙන්න ඕන අරුට ගහමු මුට ගහමු කියලා කට්ටිය කතා උනා එහෙම අරංචි එන්න ඇති හැමොටම, ගරු වැඩ බලන නගරාධිපතිතුමනි මේ ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා ඒතුමා කුලියට ඉන්නේ ඒතුමාට කිවෙච්ච නැති ඒකක් මන් කියන්න ඕන ඒතුමා මේ වෙලාවේ නැති උනත් මේ වෙනකොට ඒතුමා කුලියට ඉන්නේ එතුමට ඒ කුලි නිවසින් යන්න වෙලා තියෙන්නේ එ මිනිස්සු කැමති නෑ මෙහෙම වෙද්දි ගෙවල් දීලා තියන්න, අද එතුමට ගෙයක් නෑ යන්න තැනක් නෑ ඔසද මන්ත්‍රීතුමා එතුමගේ දරුවන්ගෙ ප්‍රශ්න කිව්වා හරිම හිත් වේදනායි අනුර මන්ත්‍රීතුමා මේ හැමොම මල්ලිකා මන්ත්‍රීතුමිය, ප්‍රැන්සිස් මන්ත්‍රීතුමා මේ හැමොම ගොල්ෆේස් ගියාද කියන්න අපි දන්නේ නෑ එහෙම ගිහිල්ලා ප්‍රහාර එල්ල කළානම් එක වෙනම එකක් නමුත් එහෙම නොවි රූස්වීමට ගියානම් ඒ රූස්වීම කරපු ඒක හරිද වැරදිද කියන එක වෙනම කතාවක් මං ඊළඟට එ කතාවට එනවා නමුත් මෙහෙම ඇවිල්ලා ගෙවල් වලට ගහපු එකනම්, මගේ දේශපාලන කියවීමට අනුව කියන්නේ මේ මැයි 09 වන දා පත් වෙච්ච ඒ ත්‍රස්ත ප්‍රහාරය මිට වඩා වර්ධනයෙන් ඉස්සරහට සිදුවෙන්න පුළුවන් කියලා බයක් මට තිබුණා තාම අපි ඒ හතුරට

ඕන කරන පිටිය හදලා තියෙන්නේ, හතුරට ඕන කරන ප්‍රශ්නය හදලා තියෙන්නේ කවුරුත් ජනතාව විදින ඇත්ත ප්‍රශ්නයට විසඳුම් සොයන්නේ නෑ තමත් පාර්ලිමේන්තුවේ අහන්නේ බහුතරය, කාටද ඇමති කවුද , වරප්‍රසාද මොනවද, වරප්‍රසාදනම් නැතිකරගන්නවා කියනවා එත් මිනිස්සුන්ගේ ඇත්ත ප්‍රශ්නයට විසඳුමක් හොයලා නෑ එ නිසා මේ මිනිස්සුන්ගේ පපු කැකෑරෙමින් තියෙන්නේ ඒ කැකෑරෙන ප්‍රශ්නය පවිච්චි කරලා තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් එ මිනිස්සුන්ව පවිච්චිකර ගන්න පුළුවන්කම තමක් තියෙනවා එ නිසා ඒ ප්‍රහාරය නැවත වෙන විදියකට එන්න පුළුවන් එවා අවබෝධ කරගන්න ඕන හෙට අපේ ගෙවල් වලට එන්න ඕන විපක්ෂයේ කවුරුහරි කියනවනම් එහෙම නැහැයි කියලා නෑ අපි කාටත් එහෙම වෙන්න පුළුවන් අනාරක්ෂිත බවක් අපිට තියෙන්නේ එ නිසා අවසානයේ ගරු නගරාධිපතිතුමනි මම එදත් ඉල්ලුවේ අපි හැමොම එකට එක් වෙලා වැඩ කරන එක අපි එකතු වෙමු එකතු උනොත් විතරයි මේ ප්‍රශ්නයට පිළිතුරු තියෙන්නේ කවුරු හරි හිතනවනම් රාජ්‍යයක් ආරාජික කරලා වට්ටලා මිනිස්සුන්ව පාරට බස්සලා ලේ හලලා ඊට පස්සේ තමන්ගේ දේශපාලන බලාපොරොත්තු ඉටුකරගෙන ඊට පස්සේ තමන්ගේ දේශපාලන බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගන්න කියලා මතක තියාගන්න ඉතිහාසයක් එහෙම හිතපු හැමොගේම ඔළු කුඩු පට්ටන් වෙලා අවසානයේ මේ රටේ සතුරු බලවේගයි ජයග්‍රහනය කළේ දැන හෝ නොදැන අපි ක්‍රියාත්මක වෙන්නේ ඒ සතුරු බලවේග හරහා අපි කතාවක් අහලා තියෙනවා වැද්දා වටු කුරුල්ලාන්ට දැලක් එලුවා ඒ වටු කුරුල්ලෝ ටික සමූහිකව එකට එකතු වෙලා ඒ දැල අරගෙන පියෑඹුවා කියලාගරු නගරාධිපතිතුමනි ඒ කතාව වෙනස් විදියකට ලියැවෙන්න තිබුණා වැද්දගෙ අරමුණු ඉටුකර ගන්න වැද්දට ඕන උදව්ව කරන්න වඩු කුරුල්ලෙක් නැතුව කපුටෙක් හිටියනම් වඩුවෝ සියල්ල උඩට යන්නේ වැද්දගේ හොද්දට යනවා එක නිසා මේකේ මහමොළකරුවෝ කවුද කියලා ජනතාව තේරුම් අරන් ඉන්නවා හැබැයි අපි තේරුම් අරන් නෑ අපි හැමොම අපේ දේශපාලන වැඩේ කර ගමු හැබැයි ඇත්ත සතුරා හරියට හඳුනගෙන එ සඳහා පෙළගැහෙන්න ඊට එරෙහි වෙමු කියමින් මමත් ඌ වගන්තිය යටතේ යෝජනාවක් දලා තියෙනවා ඉල්ලන්නේ සිස්ටම් වෙන්ජනම් අපි බැන ගමු රණ්ඩු වෙමු ඔනේනම් ගෙවල් ගිනි තියාගමු හැබැයි මේ රටේ ඉදිරියට එන භායානක අර්බුදයට රටට කන්න නැති වෙන තත්වයට එ අර්බුදය මොරටුව මහ නගර සභාව මැදිහත් වෙලා අපි මොරටුව ආදර්ශයක් විදිහට හැම බිම් අගලකම වගා සංග්‍රාමයකට යන්න අපි හැමොම ජනතාව පොළඹවන්න ඌ වගන්තිය යටතේ තියෙන යෝජනාව ක්‍රියාත්මක වෙන්න කියලා පියළු පක්ෂ වලින් ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා

**03 (14)** <u>**මහ නගර සභා මන්ත්‍රී - ඩී. ඩබ්. ඒ. රන්දූ නිරෝෂන මහතා**</u>

ගරු වැඩබලන නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන් අපි ඔබතුමාට සුබ පතනවා එ වගේම ස්තුති වන්ත වෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම හැටියට අපි ගිය සභාවේදි ඉල්ලීමක් කළා අපිට විපක්ෂයේ වෙනම කණ්ඩායමක් හැටියට අසුන් ගන්න ලැස්ති කරන්න කියලා ඉතින් ඒ වෙනුවෙන් අද දිනයෙදි මම හිතන්නේ මේ මන්ත්‍රීතුමාගෙන් මෙහාට පක්ෂ රැස්වීමේදී කතා වුණ පරිදි ආසන පනවන්න බෑ කිවුවා යම් වියදමක් දරන්න වෙනවා මයික් හයි කරන්න අපි කැමති නෑ මේ වෙලාවේ සභාවට වියදමක් දරන්න වෙනවට නමුත් අද දිනයේදී අපි විපක්ෂයේ කණ්ඩායමක් හැටියට අපිට ආසන පැනවීම සම්බන්ධව අපි ඔබතුමාට ස්තුතිය වන්ත වෙනවා එවගේම ගරුනගරාධිපතිතුමනි, ගිය 9 වෙනිදා සිදුවුණ අවාසනාවන්ත සිද්ධිය ගැන බොහො මන්ත්‍රීවරු කතා කළා ඒ ගැන විශේෂයෙන් වැඩිපුර කතා කරන්න දේයක් නෑ එදා උදේ වුණ සිද්ධියත් හවස වුණ සිද්ධියත් ඒ දවස් කිහිපයේම සිදුවු ක්‍රියාදාමයම අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියටත් පුද්ගල්කවත් අනුමත කරන්නේ නෑ ඒ වගේම අපේ නගර සභාවේ සේවකයන් ඇතුළු ඒ කණ්ඩායම රැගෙන යාමත් අපි අනුමත කරන්නේ නෑ ඒ වගේම මේ මොරටුව නගර සභාවට වුණ විශාල හානිය අපි අනුමත කරන්නේ නෑ, ඒ වගේම අපේ නාගරික මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් ඔවුන්ට සිදුවුනු පහර දීම් සහ ගෙවල් වලට සිදුවුන පහර දීම් අපි හෙළා දකිනවා,පක්ෂයක් හිටියට අපි ඔවුන්ට අපේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා එ වගේම ගරු නගරාධිපතිතුමනි මේ සිද්ධින්ට මූලික වෙච්ච අයට මේ වෙනකොට අධිකරණ ක්‍රියා මාර්ග ගනිමින් ඉන්නවා අපි ඒ අතරදි දකිනවා මේවට කිසිම සම්බන්ධයක් නැති අහිංසකයොත් අත්අඩංගුවට ගන්නවා අපි දැක්කා මේ අතරේ මිස් වෙන කට්ටියක් ඉන්නවා මන් ගාව ඒකට සාක්ෂි තියෙනවා මේ සිද්ධිය වෙන්නේ 9 වෙනිදා 11 වෙනිදා වෙනකුනුත් මිනිස්සුන්ට පහර දෙන්න ගෙවල් කඩන්න විශේෂයෙන් මේ නාගරික මන්ත්‍රිවරු ඇතුළුව නම් ප්‍රකාශ කරලා මගේ නමත් තිබ්බා මට කිසිම සම්බන්ධයක් නැති ආයතනයක් මට තියෙන්නේ එක ව්‍යාපාරයයි මොඩන්ක්‍රාෆ් ෆර්නිචර්ස් කියන මගේ ආයතනය මගේ නමට තියෙන්නේ එතකොට එක හැර වෙනත් ආයතනයක් මගේ නමින් ප්‍රකාශ කරලා එවා කඩන්න විනාශ කරන්න කියලා උල්පන්දම් දීලා මේ වෙබ් සයිට් ඒකක යනවා එතකොට මෙවට ක්‍රියාත්මක වෙන්නේ නැද්ද සමාවෙන්න එක ෆේස් බුක් ප්‍රොෆයිල්

එකක් එකේ නම මම කියන්නේ නෑ එතකොට කට්ටිය හොයන්න ගන්නවා එතකොට තව අපි එකට දෙන්නේ තව උත්තේජනයක් ඕනේනම් මම ඔබතුමාට දෙන්නම් ඔනිම වෙලාවක සාක්ෂි ඇතුව, මේවා වලින් මේ මන්ත්‍රිවරුන්ට ගහන්න උත්තේජනය දෙනවා මේවා හොයන්නේ නැද්ද එවා හොයලා අපි ඔවුන්ට විරුද්ධව ක්‍රියාත්මක වෙන්නේ නැද්ද, මම ඇත්තටම ඔය සිද්ධිය වෙනකොට ගිය 07වන දා මම ළමයට ඩෙංගු හැදිලා ලංකා හොස්පිට්ල් එකේ ඇඩ්මිඩ් කරනවා ඒ දවස් ටිකම මම උදේ හවස යනවා එනවා නමුත් 9 වෙනිදා මේ සිද්ධියත් එක්ක මට යන්න වෙන්නේ නෑ මම 10 වෙනිදත් ඉදලා 11 වෙනිදා යන්නේ 11 වෙනිදා මම ගිහිල්ලා උදේ වරුවේ එතන ඉන්නකොට හවස් වෙනකොට මට පණිවිඩයක් එනවා මගේ නමත් දාලා ෆේස් බුක් ඒකේ මෙහෙම යනවා කියලා ඒතකොට මගේ බිරිඳ කියනවා ඔයා යන්න එපා ගෙදර ඔයා නවතින්න කියලා එතකොට අපිත් අසරණ වෙලා පස්සේ වයිෆ් මට කියනවා ඔයා මෙතනින් එහාට දේශපාලනයට යන්න එපා කියලා, ගරුනගරාධිපතිතුමනි අපි තරුණ මන්ත්‍රීවරු හැටියට අද මේ දේශපාලනයට ඇවිල්ලා ඔබතුමන්ලා දන්නවා මම ජීවත් වෙන්නේ දේශපාලන වශයෙන් මට කාටවත් ඇඟිල්ලක් දික් කරන්න පුළුවන් විදියට නෙවෙයි, පක්ෂ විපක්ෂ බෙදයකින් තොරව කවුරුත් මට අල්ලස් ගත්තා හොරකම් කරා කියලාවත් ඇඟිල්ලක් දික් කරන්න එන්නේ නෑ, එ විදියට මම ජීවත් වෙන්නේ හොඳ බීජ වපරපු නිසා මට හොඳ ප්‍රථිපල ලබන්න පුළුවන් ඒ නිසා මගේ ගෙදරට ගහන්න ආවේ නෑ, මම කියන්නේ නෑ අනිත් අය නරක දේවල් කළා කියලා මම යම් විදියකට ජීවත්වුන නිසා මට ප්‍රශ්නයක් ආවේ නෑ , එතකොට මගේ බිරිඳ දරුවෝ මට මින් ඉදිරියට දේශපාලනය කරන්න එපා කියනවනම් මේ රට සිස්ටම් චේන්ජ් ඒකක් ඉල්ලන්නේ, මුලු රටම ඉල්ලන්නේ මේ වයසක දේශපාලත්ඥයෝ අයින් වෙන්න තරුණ කණ්ඩායම් ඕන කියනවා මේ 225 ම එපා කියනවා හැබැයි එහෙම කියලා මෙහෙම සිද්ධින් වෙනකොට අපි කොහොමද අනාගත තරුණ පරම්පරාවට කියන්නේ ඔබලා දේශපාලනයට එන්න ඇවිත් දේශපාලනය කරන්න හොරකම් නොකරන දේශපාලනයක් කරන්න කියලා අපි ඉල්ලන්නේ කොහොමද, හොරකම් නොකරන්නනම් අපි උගත්, රැකියාවක් තියෙන පිරිසක් බලාපොරොත්තු වෙනවා හැබැයි ඔවුන් එයිද මෙහෙම තත්වයක දේශපාලනය කරන්න, අද මට බයයි මට ඉදිරි දේශපාලන තින්දුවක් ගන්න වෙයි සමහරක් විට එක මන් නැවත සිතමින් සිටිනවා, එදා නගර සභාව ගිනිතියනවා කියනකොට මට ඇත්තටම ඇඩුනා මම එදා මගේ යළුවෝ එක්ක ඉන්නකොට, මම දරුවෝ දෙන්නා එක්ක තනියම නිසා යළුවො ඇවිත් හිටියේ ඔවුන් කතා වෙනකොට මට ඇඩුනා අපිට මෙහෙම හැගිමක් තිබ්බට මින් ඉදිරියට එහෙම හැඟිමක් බලාපොරොත්තු වෙන්න බැරි වෙයි අපෙන් විතරක් නෙවෙයි ඉස්සරහට එන පුද්ගලයන්ගෙනුත්, මෙහෙම කරලා 9 වෙනිදත් උසීගැන්නුවා 11, 12ත් උසී ගැන්නුවා ඔවුන්ට ක්‍රියාත්මක වෙන්න අපි දන්නවා අපි කියන්නේ නෑ මෙහෙම ප්‍රසිද්ධියෙ කියන්නේ නෑ මම ඔබතුමාට කියන්නම් පුද්ගලිකව මොකද නැත්තම් මේක හොයන්න ගන්නවා කට්ටිය, ඔබතුමා මේ සම්බන්ධව ඕනෑම වෙලවක පරික්ෂන කරන්න අපි ඒනවා ඔබට උදව් උපකාර කරනවා කරුණා කරලා හොයන්න මේවා කරන අයට දඩුවම් දෙන්න කියන ඉල්ලීම කරනවා, වෙලාව නස්ති කරන්න කැමති නෑ විශේෂයෙන් මේ අයාචනා හා පෙත්සම් යටතේ අපි මේ වෙලාවේ අපි කතා වෙනවා වගා සංග්‍රාමයක් ගැන අපිට ඉස්සරහට ආහාර හිඟයකට මුහුණ දෙනවා කියලා ජනතාව එක්ක කතා කරද්දි මොනවද ඔයාලා කරන්නේ මොනවද කරන්න බලාපොරොත්තු යම් යම් පුද්ගලයෝ අපෙන් ප්‍රශ්න කරනවා මම හිතන්නේ ගරු නගරාධිපතිතුමනි කිහිපදෙනෙක් එක්ක කතා කරාම කට්ටියක් කියනවා මොරටුවේ ඉඩ අඩුයිලුකට්ටියක් කියනවා මොරටුවේ මේවා කරලා වැඩක් නැලු ඒ කියන දෙවල් නෙවෙයි අපි උත්සහ කරමු මට කිහිප දෙනෙක් කිව්වු අදහස තමයි අපේ මොරටුවේ විශාල පාසල් ප්‍රමාණයක් තියෙනවා රාජ්‍ය ආයතන ගොඩක් තියෙනවා මේවා එක්කසු කරගෙන ෆේස් බුක් වල ඉන්න හොඳ ක්‍රියාකාරින්, එ ගැන කියන්න ඕන ෆේස් බුක් වල හොඳ ක්‍රියාකාරීන් ඉන්නවා එහෙම අය නිසා තමයි පහුගිය දවස් වල මමත් තෙල් ගහගත්තේ ඇත්තටම මම ඔවුන්ට ස්තුති කරනවා මොරටුව මහ නගර සභාව හැටියටත් ඔවුන් කළ සේවයට පසුගිය දින වල ඉතින් එවැනි කණ්ඩායම් එකතු කරගෙන අපිට මේ වගාව අරම්භ කරන්න බැරිද ගාලු පාර මධ්‍යයේ ,රාජ්‍ය ආයතන වල මේවා කවුරුහරි කඩාගෙන යයි කමක් නෑ මොරටුවේ පුද්ගලයෙක් කයි මොරටුවේ නොවන පුද්ගලයෙක් හරි කඩාගෙන කයි අපිට පුළුවන්නම් එක පැලයක් හරි වවන්න ඉදිරියට එන ආහාර හිඟයට අපි ක්‍රියාත්මක වෙමු අපිට අදර්ශයක් වෙන්න පුළුවන් කියලා මන් විශ්වාස කරනවා අපිට ඌ වගන්තිය යටතේ අද ආහාර හිඟය ගැන යෝජනාවක් ඇවිත් තියෙනවා එකට මගේ සහ බොහෝ දෙනෙකුගේ අදහස් එකතු කරන්න කියන ඉල්ලීම කරමින් ඔබතුමාට නැවතත් ස්තුති වන්ත වෙමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

**03 (15)** <u>මහ නගර සභා මන්ත්‍රී - එම්. කුමාර රාජරත්න මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මුලින්ම ඔබතුමාට සුබ පතනවා මුලසුන හෙබවීම හේතුවෙන් එ වගේම රටේ පවතින අයහපත් දේශපාලන තත්ත්වය ගැන මුලින්ම ගොඩක් දේශපාලන නායකයන් අදහස් ප්‍රකාශ කරා විශේෂයෙන්ම වැඩ බලන ගරු නගරාධිපතිතුමනි අපි මේ ඉන්න සභාව අද අනාරක්ෂිත තැනක් බවට පත් වෙලා තියෙනවා, ඒ වගේම සභාවේ සම්පත් විශාල වශයෙන් විනාශ වෙලා තියෙනවා එ නිසා මන් විශ්වාස කරනවා නිදහස් අරගලයක් කරන පුද්ගලයන් අතින් නෙවෙයි මේ විනාශය උනේ කවුරුවත් තමන්ගේ ගෙට ගල් ගහගන්නේ නෑ එ නිසා කොටි ගාණක දේපළ හානියක් අපේ සභාවට වෙලා තියෙනවා අපේ රන්දූ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ මොරටුව මහා නගර සභාවේ ලාභාලතම මන්ත්‍රීවරයා හැටියට මටත් එ වෙලාවේ මගේ ඇස් වලට කඳුලක් ආවා ගොඩක් මේ සභාවේ නොගැටුනත් ලොකු සංවේදි කමක් ඇති වුණා අපේ ගෙදරට ඇවිත් ගල් ගහලා ගියා වගේ හැඟීමක් දැනුනා එහෙම දැනුනේ වෙන දෙයක් නිසා නෙවෙයි මේ මොරටුවේ ජනතාවගේ සම්පත් , එක නිසා මේ මෝඩ තකතීරු පිරිසක් එල්ල කරපු ප්‍රහාරයක මිසක් අර නිදහස් අරගලයක් කරපු පිරිසගේ සටනක් නෙවෙයි මේ තරම් විනාශයකට මුළ පිරුවේ කියලා මන් කියනවා. එත් එක්කම සභාවට එ වගේ විනාශයක් උනා වගේම විශේෂයෙන්ම අපේ ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීවරයාගේ නිවසට එ වගේම ප්‍රැන්සිස් ප්‍රනාන්දු මන්ත්‍රීවරයාගේ නිවසට, එ වගේම මල්ලිකා මන්ත්‍රීතුමියගේ නිවසට, අනුර මන්ත්‍රීතුමාගේ නිවසටත් ව්‍යාපාරික ස්ථානයට එ වගේම ප්‍රහාර එල්ල වෙනවා, එ වගේම ඔසඳ මන්ත්‍රීවරයාගේ නිවසටත් එතුමාගේ සහෝදරයාගේ ව්‍යාපාරික ස්ථානයටත් ප්‍රහාර එල්ල උනා එ නිසා ගරු වැඩබලන නගරාධිපතිතුමනි මේක හොඳින් සැළසුම් කරලා යම්කිසි දේශපාලන හස්ථයක් වෙන්න පුළුවන් යම් කිසි අදෘෂ්‍යමාන බලවේගයක් එ වෙලාවේ ක්ෂනිකව ක්‍රියාත්මක උනා අරගල භූමියට පහර දුන්නු යම් යම් කණ්ඩායම් ගැන අපි ප්‍රසාධය ප්‍රකාශ කරන්නේ නෑ එ මොකද ඕනෑම දේශපාලන නායකයෙක්ව තමන්ගේ මතයත් එක්ක ලෙන්ගතු කර ගන්න ඕනෑම කෙනෙකුට අයිතියක් තියෙනවා හැබැයි මෙතන ඉන්න අපේ මන්ත්‍රීවරුත් ගියේ එතන තියෙන අරගල භූමිය සුද්ධ කරලා ගෙදර එනවා කියලනම් එකට අපි කිසි වෙලාවක අත උස්සන්නේ නෑ ගරු නගරාධිපතිතුමනි සභාව විනාශ විමත් සමඟ අපේ ගරු ක්‍රිශාන්ත මන්ත්‍රීතුමාගේ මන් හිතනවා එතුමා මන්ත්‍රීවරයෙක් උනාට පස්සේ එතුමාගේ යාළුවෙක් දුන්න බයිසිකලයක් එතුමා එකේ තමයි සභාවට ආවේ ගියේ එකත් පුච්චලි විනාශ කරලා දැම්මා එ වගේම නගරාධිපතිතුමාගේ පෞද්ගලික ලේකම් ප්‍රියනාත් මෙන්ඩිස් මහතාගේ බයිසිකල් එකත් පුච්චලා දැම්මා හැබැයි මම දැනුවත්ව ක්‍රිෂාන්ත විජේරත්න මන්ත්‍රීවරයා කියනවා මට බයිසිකලයක් ගන්න වත්කමක් නෑ මම මේ දවස් වල පදින්නේ මගේ පුතාගේ බයිසිකලය පුතා වැඩට යනකොට මම යන්නේ බස් එකේ එතකොට පාරේ බස් එකේ යන එකත් මන්ත්‍රීවරයට ප්‍රශ්නයක් වර්තමාන තත්වයත් එක්ක එ නිසා ගරු නගරාධිපතිතුමනි මේ අපි බලාපොරොත්තු වෙච්ච තත්වයක් නෙවෙයි බොබී මන්ත්‍රීතුමාගේ ගෙදරටයි ප්‍රැන්සිස් මන්ත්‍රීතුමාගේ නිවසට ගල් ගහනකොටයි අපිටත් ගෙවල් වල ඉන්න තත්වයක් තිබුනේ නෑ හැබැයි ගෙදර හිටියා එ බය අපිටත් තියෙනවා මම හිතනවා නගරාධිපතිතුමාගේ ගෙදර ගිනි තියෙනකොට සේනක ගරු මන්ත්‍රීවරයත් බය වෙන්න ඇති රවිනාත් ගුණසේකර මන්ත්‍රීතුමත් බය වෙන්න ඇති එ වෙලාවේ පක්ෂයක් පාටක් නෙවෙයි බැලුවේ එ නිසා තමයි මම කියන අර නිදහස් අරගලයේ සත්‍ය නිවැරදි තරුණ බලවේගයන් අතින් නෙවෙයි මේක සිද්ධ වුනේ ගරු වැඩබලන නගරාධිපතිතුමනි එකත් එක්කම අපේ රන්දූ මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ සමාජ මාධ්‍ය ජාල මේකට කිසිම සම්බන්ධයක් නැති මන් නියෝජනය කරන පිවිතුරු හෙළ උරුමය පක්ෂය මගේ පක්ෂයේ නායකයා උදය ගම්මන්පිල මැතිතුමා හැබැයි මෙහෙම විනාශයක් වෙනවා කියලා උදයයි, විමලුයි මීට වෙලස්සනින් අවුරුද්දකට කලින් කිව්වා. එක සමහර නායකයෝ ඇහුවේ නෑ එක අවාසනාවකට කරුණක්, දැන්වත් තේරුන් අරන් ඇති කියලා අපි විශ්වාස කරනවා අපේ මුහුණුත් අරගෙන සමහර සමාජ මාධ්‍ය ජාල දාලා තිබුණා මූණ රවුම් කර කර, ඒ සමහරක් අයගේ පුද්ගලික අරමුණු ඉටු කර ගන්න උත්සහ කරන අවස්ථා වෙන්න පුළුවන් හැබැයි මේ සම්බන්ධයෙනුත් නීතිය අනිවාර්යයෙන් ක්‍රියාත්මක වෙන්න ඕන පොලීස්සිය පිළිබඳ මේ වෙනකොට විශ්වාසය සම්බන්ධ යම් යම් දේවල් තියෙන්න පුළුවන් හැබැයි මේ සියළු දේවල් වැඩබලන නගරාධිපතිතුමනි විනිවිධ බාවයකින් වෙන්න ඕන, එත් එක්කම ගරු වැඩ බලන නගරාධිපතිතුමනි දැන් තියෙන මේ ආර්ථික තත්ත්වයත් දේශපාලන තත්වයත් මේ වෙලාවේ අපේ නිශාන්ත මන්ත්‍රීතුමා කියන විදියට මොන විදියට පුපුරලා යයිද අපි දන්නේ නෑ හැබැයි අපි හැමොම එ ඇත්තට මුහුණ දෙන්න ඕන හෙට දවසේ ගල් පහර වදින්නේ මගේ නිවසටද නැත්තන් අර හොඳයි කියන සුන්දරයි කියන මන්ත්‍රීවරයෙක්ගේ නිවසටද කියලා අපි දන්නේ නෑ හැබැයි මේ වෙලාවේ අපි සියළු දෙනාම කණ්ඩායමක් විදියට එකතු වෙලා කටයුතු කරන්න ඕන වෙලවක් මේක එකට හොඳම පූර්වාදර්ශය තමයි පළවෙනි වතාවට තමයි පක්ෂ

නියෝජනය කරන සංවිදායකවරුත් එක්ක සාකච්චා කරන්න මේ සභාවේ එහෙම අවස්ථාවක් උදා උනේ මේකෙන් ගන්න පුළුවන් හොඳ දේවල් අපි ගන්න ඕන මේකෙන් බැහැර කරන්න ඕන දේවල් අපි මේකෙන් බැහැර කරන්න ඕන එ නිසා මන් හිතනවා කාලය යන නිසා මේ වෙච්ච හානිය ගැන තව කතා කරන්න යන්නේ නෑ, නමුත් අර අරගල භූමියේ අර අරගලය කරපු ඔවුන්ට වෙච්ච අසාදාරනයටත් එ වගේම මගේ සහෝදර නාගරික මන්ත්‍රීවරු, නගරාධිපතිතුමාගේ ජීවිත එ දේපළ හානි සිදු කරපු අයට මගේ විරෝධයත් පල කරනවා වගේම විශේෂයෙන්ම ගරු නගරාධිපතිතුමනි මට තවත් කරුණක් කියන්න තියෙනවා පැමිණිලි පෙත්සම් යටතේ එ තමයි දකුණු කලාපය මේ දවස් වල දැන් වැස්ස පටන් ගත්තා මට මතකයි නගරාධිපතිතුමා ඔය පුටුවේම ඉදගෙන සභා තුන හතරකට කලින් එතුමාත් කිවුවා අපේ ගරු ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමත් මේක මතු කළාගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමත් මතු කළා මොකද මේකේ ලොකුම ප්‍රශ්නේ තියෙන්නේ අපි තුන්දෙනාට දකුණු කලාපේ, අනිත් අයටත් නැතුව නෙවෙයි, නගරාධිපතිතුමා ඔය පුටුවේ ඉදන්ම මේ නිලධාරින්ට උපදෙස් දුන්නා දැන් නිකන් අර දේශපාලන අදිකාරියත් එක්ක අපේ මන්ත්‍රීතුමා මතක් කරා වගේම ෆේස් බුක් එකේ මගේ නමම මෙන්ෂන් කරලා දැන් මේ දානවා අවුරුදු 3කට කලින් එතකොට මේ පුටුවේ ඉදන්ම මම කියනවා කොරලවැල්ලේ ජනතාවට බොට්ටුවක් අරන් දෙන්න කියලා ඒක බොට්ටුවක් දැන් අවුරුදු 4ක් ගිහිල්ලා මට කියන්න වෙනවා බොට්ටු කිහිපයක් දෙන්න කියලා මොකද දැන් නගරාධිපතිතුමා දේශපාලන අධිකාරිය අතේ තියාගෙන ඇතුලේ ඉදන් එදත් උපදෙස් දුන්නා යන්න ගිහිල්ලා බලන්න බලලා මේකට යම් කිසි විසදුමක් දෙන්න කියලා සමහර විට නිලධාරි ඉන්න ඇත්තේ ප්‍රයෝගිකව මේක බලාගන්න වහලක් උනොත් වැස්සට තෙමෙන්න එපැයි තෙමෙන තැන් පෙනෙන්න වඩ්ඩා කොච්චර දක්ෂ උනත් වැඩක් නෑ වහින්නම ඕන තෙමෙන තැන් පෙනෙන්න ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අලුත් අද්දැකීමක් ගන්නත් එක්ක අපේ මේ නිලධාරි ටික පොඩ්ඩක් වතුරට බස්සමු, මන් හිතන්නේ මොවුන්ට ඒක තමයි අවශ්‍ය තාවය තියෙන්න ඇත්තේ, අවුරු 3ක් ගිහිල්ලත් නගරාධිපතිතුමනි ජනතාව අපෙන් අහනවා පොල් ගෑවද කියලා ඇත්ත තමයි අපේම අණ්ඩුවකුත් තියාගෙන අවුරුදු 4ක් එක තමයි මන් කිවුවේ එදා මන් ඉල්ලුවේ එක බොට්ටුවයි අද මන් බොට්ටු කිහිපයක් ඉල්ලනවා අඩුම ගානේ එහෙම හරි ප්‍රවාහන පහසුකම් ටික සපය ගන්න එක පැත්තක මුහුද තියෙනවා අනිත් පැත්තෙන් ගඟ තියෙනවා අපිට ලස්සන වැඩ පිළිවෙලක් කරන් යන්න පුළුවන් තවත් මැද ඇළක් හදලා සංවර්ධනය මනින්නේ පාර හදලාවත් එක්කෝ පාළමක් සංවර්ධනය මනින්නේ කවදාවත් පාරක් කාණුවක් හදලා නෙවෙයි හැබැයි මීට කලින් තිබුණ දේශපාලන තන්ත්‍රයත් මේකට වග කියන්න ඕන එකෙන් අපි අත පිහිද ගන්න නරකයි ඔක්කෝම නිලධාරින්ගේ පැත්තට දාලා ඒ මොකද සමහරක් අය එදා පාරවල් කාපට් කරගෙන ගියා වතුර බහින එක ගැන හිතුවේ නෑ සමහරක් පැති ගත්තොත් කඩලාන වගේ පැති ගත්තොත් ඊට වඩා අපි පොඩි වාසනාවන්ත වෙන්න ඕන වෙන දේකට නෙවෙයි මේ පැත්තෙන් ළඟ මුහුද මේ පැත්තෙන් ගඟ ඉතින් ජාතික ප්‍රතිපත්තියක් හදමු වැඩපිළිවෙලක් හදමු කිය කිය සාකච්චා කරා කරා තාම මේ වෙනකන් ඉටු වුනේ නෑ ඒ නිසා මන් කියනවා මන්ත්‍රීවරයෙක් වෙලත් ලැජ්ජ වෙනවා අවුරුදු 4ක් ගිහිලලත් මට ඒ දේ කර ගන්න බැරි උනා රටේ මහා අය ෆේල් වගේම අපිත් ෆේල් එ නිසා මන් ඉල්ලීමක් කරනවා නගරාධිපතිතුමා ඔය පුටුවේ වාඩි වෙලා අලුත් නැවුම් අද්දැකීමක් ගන්නත් එක්ක මේ නිලධාරින් එක්ක එකතු වෙලාපුළුවන්නම් අපිට එතනට යන්න බැරි උනත් දැන් අවුරුදු 3ක් තිස්සේ කියලා කරගන්න බැරි උනා, අනිවාර්යයෙන් නිලධාරින් එතනට යවන්න සමහරක් තැන් වලට නගරාධිපතිතුමනි ලොකු දේවල් කරන්න ඕන නෑ එක ගලියක් දැම්මනම් ඇති රත්තරන් පොලවක් තියෙනවා අපිට දෙහිවල ගල්කිස්ස ගත්තම වතුර බැහැලා යන්න පැය ගානක් යනවා අපේ පැය බාගෙන් බැහැලා යනකොට වතුර ටිකත් පොලවට උරා ගන්නවා හැබැයි මේ වෙනකන් අපිට බැරි වෙලා තියෙනවා අපිට මේකට උත්තරයක් හොයන්න වැස්සට කලින් අපි කියනවා අපි මෙතනට ඇවිල්ලා කැගහනවා නගරාධිපතිතුමත් කැගහනවා නිලධාරි මේ කනෙන් අහලා මේ කනෙන් පිට කරනවා ඒ නිසා වැඩ කරන නිලධාරින්ට අපි හරි ආදරෙයි වැඩ කරගන්න බැරි නිලධාරින් එක්ක අපි ගෙවන්නේ මේ අන්තිම අවුරුද්ද වෙන්න පුළුවන් සමහර විට ඊලඟ මැතිවරණයෙදි අපි ඔක්කෝම ගෙදර ඉන්න පුළුවන් අද පාර්ලිමේන්තුවේ 225ම එපා කියනවා වගේ එන මැතිවරණයෙදි අපි ඔක්කොම ගෙදර ඉදලා අපි නොහිතන පිරිසක් එන්න පුළුවන් හැබැයි එ අය අපිට සාප කරනවා හැබැයි මම නොහිටියත් මම විශ්වාස කරනවා මන් වගේම නිලධාරින් කවුරුත් මේ සභාව නියෝජනය කරන්න බෑ මේවා වෙනස් වෙන්න ඕන.මේවා අලුත් වෙන්න ඕනා.ඒ නිසා අපි හොයන සිස්ටම් චේන්ජ් ඒක අපිට මෙතනින් පටන් ගන්න පුලුවන්.ඒ.නිසා නිලධාරීන් මාත් ඒක්ක තරහ වෙන්න ඒපා මම කතා කරන්නේ වැඩ කරන්නේ නැති නිලධාරීන්ට.අවුරුදු 03ක් ගිහිල්ලත් ඊලග වසරෙදිත් මං ඒක කියනවනම්.ඔබත් ලැජ්ජ වෙන්න ඕනා මමත් ලැජ්ජ වෙන්න ඕනා.මේ

ඔක්කොම නියෝජනය කරන්නේ මොරටුව මහ නගර සභාව.එක නිසා වැඩ බලන නගරාධිපතිතුමනි, එක නිසා ඔබතුමාගෙන් නැවතත් නැවතත් ඉල්ලීමක් කරනවා.මේ වැස්ස දවස්වල ප්‍රායෝගිකව හෝ මේක මිනිස්සු අතරට ගිහිල්ලා විශේෂයෙන් දකුණු කලාපයට ප්‍රමුණතාවය දීලා ඒ කටයුතු ටික කරන්න ඔබතුමාට අවශ්‍ය සහයෝගය ලබාදෙන්නම් අපේ පැත්තෙන් නිධාරීන්ව සම්බන්ධ කරන්න ඔබට නැවත හැකියාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරන ගමන් අවසාන වශයෙන්ම නැවතත් ඒ සියලුම මන්ත්‍රීවරුන්ටවුන අසාධාරණය ඒ අරගල භූමියේ අයට මගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු කොමසාරිස්තුමනි කුමාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ ඇත්තටම මේක මාගේ ඒරියා එකෙත් ගාලු පාර හැදුවට පස්සේ තියෙන ප්‍රශ්නයක් මේක. මේ ප්‍රශ්නේ ඔබතුමා දන්නවනේ ඒ නිසා ඒ කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරු සමඟ අපේ නිලධාරින් ස්ථාන පරික්ෂාවක් සඳහා ලබන සතියේම යවලා එකට අවශ්‍ය පියවර ගන්න කියලා මම නියෝගයක් වශයෙන් නිකුත් කරනවා.

**03 (16)** <u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මට පෙර කතා කරපු මන්ත්‍රීවරුන්ගෙන් මා හට සැහෙන්න තර්ජනයක් මොකද මා විසින් එහෙම නැත්තම් මාගේ සහොදරයා විසින් පසුගිය දින සිදුවෙච්ච ඒ සිදුවීම සම්බන්ධ ලොකු ප්‍රහාරයක් එල්ල උනා මං එකට වචනයක්වත් නොකිය හිටියොත් එක පිලිගැනීමක් වෙනවා, මන් වැරදි කරුවෙක් වෙනවා එ නිසා නගරාධිපතිතුමනි මොකද එ සම්බන්ධව නීතිමය පැත්තේ තියෙන කාරණයක්, අද තක්ෂණය දියුණුයි කාට හරි ඕනැම කෙනෙකුට ෆොන් එකක් තියෙනවා කැමරා තියෙනවා කාට හරි ඕනැම කෙනෙකුට මගේ සහොදරයා, මාත් කියනවා අරගලේ හිටියා අරගලය කියන්නේ මෙතන කරපු අරගලේ දැන් තිබ්බොත් දැනුත් යනවා හෙට තිබ්බොත් හෙටත් මන් අරගලේට යනවා මොකද එ අරගලේ කරන්නේ මමවත් මගේ පක්ෂයවත් අරගලේ කරන්නේ රජයේ දේපල වලටවත් පෞද්ගලික දේපලකටවත් හානියක් කිරීමේ අරමුණින් නෙවෙයි මොකද එ මොහොතේ මගේ සහොදරයා ගිහින් තියෙනවා එ ස්ථානයේ ඉදලා තියෙනවා කියලා දැන් මේ මන්ත්‍රීවරු ගොඩක් ප්‍රකාශ කරා මේකට සම්බන්ධ නොවිච්ච අයත් මේකට රක්ෂිත බන්ධනාගාරගත කරලාතියෙනවාබලාගෙන හිටියත් අරගෙන තියෙනවා මගේ සහොදරයත් එ ස්ථානයේ ඉදලා තියෙනවා නමුත් ප්‍රහාරය එල්ල කලේ මගේ සහොදරයා නෙවෙයි ඔහු කිසිම දේකට සම්බන්ධ වෙලා නෑ නමුත් තව නමක් කිවුවා මට කියන්න තියෙන්නේ මොකද එ පුද්ගලයා කුඩු විකුණනවා එ ප්‍රශ්න ගොඩක් කිවුවේ නමුත් ඔහු පහුගිය මැතිවරණයේදි පොහොට්ටුවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දේශපාලනය කරපු පුද්ගලයෙක්, සේනක මන්ත්‍රීතුමා, තිසර මන්ත්‍රීතුමා ඇතුළු මේ සියළු දෙනා මන් ගැන දන්නවා මන් කිසිම මොහොතක වරදක් කරලා නෑ ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීදූරය හම්බ වෙච්ච එක ගැන අද මට සතුටක් තියෙන්නේ මොකද මන්ත්‍රිදූර කාලය තුලවත් ඊට පෙරවත් නියෝජ්‍ය නගරාධිපතුමා දන්නවා මගේ අතින් කිසි කෙනෙකුට වරදක් වෙලාත් නෑ වරදක් කරලත් නෑ මට 2000 වර්ෂයේ තමයි සමාජ සත්කාර වලට මන් මැදිහත් වෙලා තියෙන්නේ කුමන හෝ ක්‍රිඩාවකට යොමු වෙලාජාතික ජාතික කණ්ඩායම නියෝජනය කරන ක්‍රිඩකයෝ බිහිකරලා මොරටුව ගමට නායකත්වය දීලා මොරටුව කොරලවැල්ල කියන ග්‍රාමය රට පුරා ගිහිල්ලා සැම තරහයකින්ම ජයග්‍රහන ගමට ගෙනාව පුද්ගලයෙක් මන් මොකද අදටත් මන් මන්ත්‍රීවරයා වෙන්න කලින් සැම අවුරුද්දකම දරුවන් 100කට 200කට පොත්පත් දෙනවා ක්‍රීඩා උත්සව පවත්වනවා මොකද මන් කාගෙවත් අරන් නෙවෙයි මන් මගේ ව්‍යාපාරයේ එවා වලින් තමයි කරන්නේ මොකද කතාවක් තියෙනවා එල තියෙන තැනට තමයි ප්‍රහාර එල්ල කරන්නේ මා හට මේ එල්ල කරපු ප්‍රහාරය මන් කියනවා මොකද කඩුවකුත් අරන් ආවා කිවුවා වීඩියෝ තියෙනවනම් පෙන්නන්න කඩුවක් තියා කිසි දෙයක් අරන් ආවේ නෑ මගේ තාත්තා මට දීලා තියෙන අත්දැකීම අනුව මොකද මන්ලා දෙන්නටම කියනවා සිදුවීමක් මල්ලීගේ අතින් උනානම් මම එකත් දාලා දෙනවා, නමුත් ක්‍රීඩාංගන මාවතේ මඩුවක් තියෙන කෙනෙක් ඉන්නවා ඔහුත් මගේ වයසේ ඔහු මගේ තාත්තාගෙ වයසේ කෙනෙක් උනානම් මම කකුල් දෙක අල්ලා හරි වදිනවා එ නිසා මම මේ අවස්ථාවේ කියන්නේ නීතිමය පැත්තේ තියෙන දේවල් වලින් වරදක් වෙලා තියෙනවනම් දඩුවම් කරන්න කිසිම ගැටළුවක් නෑ මම මේ චෝදනා එක හෙළා වැරදි කියලා ප්‍රකාශ කරනවා මොකද එක අසත්‍යක් මෙහෙම සිදුවීමක් වෙලා නෑ එ නිසා මේ වගේ බොරු චෝදනා කරලා මටවත් මගේ පක්ෂයටවත් මඩගහන්න ලැස්තිවෙන්න එපා මට මේ මන්ත්‍රීදූරය දෙද්දිත් පක්ෂයෙන් බලන දෙයක් තමයි හොඳ කෙනෙක්ද කියලා මට සතුටුයි මේ මන්ත්‍රී ධූරය ලැබීම ගැන මේ අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා මම මේ සියළු චෝදනා ප්‍රතික්ෂේප කරනවා ස්තුතියි.

**03 (17) මහ නගර සභා මන්ත්‍රී - එම්. බී. මල්ලිකා ජයවති ප්‍රනාන්දු මහත්මිය**

ගරු වැඩබලන නගරාධිපතිතුමනි, පසුගිය 9වන දින සම්බන්ධව මටත් කියන්න දෙයක් තියෙනවා, එදින උදේ වරුවේ මම නගර සභාවට පැමිණියා ඇවිත් අපි අරලියගහ මන්දීරයට ගියා මම නෑ කියන්නේ නෑ මම ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කරන කෙනෙක්, මම නගර සභාවට ආපු වෙලාවේ එතන යම් සිදුවීමක් උනා එතනදී වීඩියෝ ගත කළා කරපු කෙනොගේ මන් නම් ගම් සඳහන් කරන්නේ එ කරන්න ගිය වැඩෙන් ලොකු කසුතුසුවක් ඇති වුණා පස්සේ තව පිරිසක් ඇවිත් මේක අන්දෝලනවය ලක් උනා එකෙන් ජනතාවට වැරදි ආකල්පයක් ගියා , මේ අපු අයට තිබුණා මේ කට්ටිය ගියාට පස්සේ ඇවිත් කොමසාරිස්තුමා ඉන්නවා ලේකම්තුමා ඉන්නවා එ අය එක්ක සාකච්චා කරන්න තිබුණා එහෙම නොකර ඇවිත් ප්‍රශ්නයක් ඇතිකළා, එ දෙයින් තමයි මොරටුව ඇවිස්සුවේ මේ වැඩේ මන් තරයේ ප්‍රතික්ෂේප කරනවා, වෙන පක්ෂයක් යනකොට අපි කරදර කරන්නේ නෑ , මන් මන්ත්‍රීදුරය අරන් දැන් අවුරුදු4ක් වෙනවා මගේ දෑත් පිරිසිදුයි, මට එදා ආයතන කම්ටුව තිබුණ මම අරලියගහ මන්දීරයට ගිහින් ඇවිත් කම්ටුවට සහභාගි වෙන්න එන්න වාහන අපහසුකම් තිබුණා මම කෑම එකත් තියලා ගියේ කම්ටුවට සහභාගි වෙන්න ඕන නිසා නමුත් මට බස් එකේ එන්න බැරි උනා, රත්මලානට එද්දි හවස 4 පහු උනාඑතකොට මට පණිවිඩයක් එනවා එගොඩ උයන ප්‍රදේශයෙන් මගේ නිවසට ගහලා ගෙදරට එන්න එපා කියලා, මගේ දුව අසනීපෙන් ඉන්නේ විදේශ ගතවෙලා එයත් මට ගෙදර යන්න එපා කියලා අඩ අඩ කොල් කරා, පස්සේ මම මගේ මිතුරෙකුගෙ ගෙදරට ගියා මම රෑ ගෙදර ගිහින් බැලුවා විදුරු කුඩු කරලා වහලට ගල් ගහලා ගෙට පනින්න හදලා, පොලීසියෙන් ආවා ගමේ අය කිව්වා ආව අයව අඳුරන්නේ නෑ කියලා, ගමේ අය දුක් වෙනවා මේ සම්බන්ධව මම එ අයට කිව්වා 88, 89 ත් මෙහෙම තමයි භීෂනේ කියලා, මම හිටපු වෙලාවේ ආවනම් මම ගහනව ආවනම් බය නෑ, මම එකෙක්ව මරාගෙන හරි මැරෙනවා මම සමසමාජ පක්ෂයේ වෙලත් මට ගමට වැඩ කරන්න සහයොගය දුන්නේ මේ නගරාධිපතිතුමා පක්ෂ භේදයක් බැලුවේ නෑ මට ඉන්නේ පාර්ලිමේන්තුවේ එක මන්ත්‍රීතුමයි මට එතුමගෙන් ප්‍රතිපාදන ලැබෙන්නේ නෑ එ නිසා එ සියල්ල මට දුන්නට මම නගරාධිපතිතුමට විශේෂ ස්තූතිය පුද කරනවා මම එතුමට ගරු කරනවා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි තවද මේ පොඩි ළමයි අපයෝජනයට ලක් කරනවා එකක් දෙකක් නෙවෙයි, මව්වරු දරුවේ වතුරේ ගිල්ලවලා මරණ කාලයක් මේ රටට වෙලා තියෙන දේ හිතා ගන්න බෑ කාන්තවක් හිටියට මේ වෙන දේවල් බලන් ඉන්න මට බෑ, මෙවට රජයක් වශයෙන් නීතිය හරියට කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03 (18) මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා**

ගරු වැඩබලන නගරාධිපතිතුමනි, මම ඔබතුමගෙන් අවසර ඉල්ලනවා අපේ අභිනවයෙන් පත්වුනු ශ්‍රී ලංකා රජයේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට එක්සත් ජාතික පක්ෂයේ සුබ පැතුම් එක් කිරීමට එ වගේම මේක අවස්ථාවක් කර ගන්නවා වැඩ බලන නගරාධිපති හැටියට එතුමට පූර්ණ බලය ලබා ගෙන මේ ලැබුණ කාලයෙදී ඔබතුමන්ගේ කාර්යය සර්ථකව කර ගැනීමටත් මොරටුව මහ නගර සභාව ඉදිරියට ගෙන යාමටත් දෙයයී ශක්තිය ලැබෙන්න කියලා මම සුබ පතනවා ගරු නගරාධිපතිතමනි අපි කවුරුත් දන්නවා මම කතා කරන්නේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මොකද වැඩි කාලයක් ගන්න ඕන නෑ අපි කවුරුත් දන්නවා මේ රටේ දින 54ක් තිස්සේ අරගලයක් පැවැත්වෙනවා ගොල්ෆේස් පිට්ටනියේ එ අරගලය මුළු රට පුරාම ව්‍යාප්ත වෙලා ගොඩක් ජනතාව මේ අරගලයට ඔවුන්ගේ සහයෝගය දක්වනවා මේ පනිවිඩය බොහෙමෙ සමකාමි එකක් වෙලා තිබුනේ මේ අරගලයෙන් මිනිසුන්ය කිසිම හිංසාවක් පීඩාවක් කරේ නෑ නමුත් අපි දන්නවා 9 වෙනිදා අරලියගහ මන්දීරයෙදි පැවැත්වු හිටපු අගමැතිතමාට ජනතාව සුබ ප්‍රර්ථනා කරන්න ගිය වේලාවෙදී අපි දන්නවා එතනිනු පස්සේ ඇති උන සිද්ධිය ගැන එ කෙදී අපේ නගර සභාවට සහ නගරාධිපතිතුමා එකට විශාල සහයෝගයක් හා සම්බන්ධයක් තිබුණා කියලා අපි දැන් දන්නවා එදා අපේ සේවය කරන සේවකයන් 370ක් පමණ එත්මා සමහ අරලිය ගහ මන්දීරයට ගිය බවට අනාවරණය වෙලා තියෙනවා, මම දැන ගන්න ලැබුණ විදියට එයින් 70ක් පමණ එ ගොල්ලන්ගේ ෆින්ගර් ප්‍රින්ට් එක තියලා තමයි ගිහින් තියෙන්නේ, එ කියන්නේ ඔවුන් සේවයට වර්තා කරලා මේක ඉතාමත්ම වැරදි ක්‍රියාවක් එක නොකළ යුතු ක්‍රියාවක් එක නගරාධිපතිතුමා කරලා තියෙනවා එතුමට කියන්න පුළුවන් මම එතුමට කලින් හියපු නගරාධිපතිවරයා නමුත් අපි කිසාම අවස්ථාවක එක්සත් ජාතික පක්ෂයේ කිසිම කටයුත්තකට අපේ සේවකයින් පෙළඹුවෙත් නෑ ගෙනිච්චේත් නෑ, මේ නොකළ යුතු ක්‍රියාවක් සිදුකිරීමෙන් මේ රටේ ලොකු ව්‍යසනයක් ඇති වුණා එදා ගෝඨා ගෝ ගමටත් මයිනා ගෝ ගම හිටපු අහින්සකයන්ට ගහලා කාන්තාවන්ට ගහලා එ අයව ප්‍රකෝප කරා ප්‍රකෝප උනු ජනතාව මේ රට තුල විශාල විනාසයක් කළා මේ විනාශය

කරනකොට අනිත් අය මේකට සම්බන්ධ උනේ ඇත්තටම එ වෙලාවේ ඇතිවුණ ආවේගයට තවත් සමහරක් මේකට සම්බන්ධ වුනේ හොරකම් මැරකම් කරන්න,මගේ අවධානය ගියා එ වෙලාවේ 1983 දෙමළ කොලහාලය වෙලාවේ සහ 88,89 කාලයේදී මේවැනිම දේවල් සිද්ධ වුණා 1983දී කඩ සාප්පු වලට ගහලා සිංහලයින්ව ආරක්ෂා කරන්න ඕන කියලා ජාතී ප්‍රේමය තියෙනවයි කියන උදවිය කඩ කුඩු කරලා කරපු එවා වගේම දෙයක් තමයි මේ සිද්ධ වුනේ. නොකළ යුතු දේවල් කිරීම තුළින් ඇති වුණ ප්‍රශ්නයක් මේක එක එතනින් නතර වුනේ නෑ අනිත් රාජ්‍ය ආයතන වලට මේ ප්‍රශ්නය ඇති වුනේ නෑ මොරටුවට විතරයි මේක වුනේ මේ නගර සභාවට පමණයි මේක වුනේ එකට හේතුව වුනේ අපෙ නගරාධිපතිතුමා කණ්ඩායමක් එතනට එක්ක ගිහින් මෙතුමා එතන ඉස්සරහින්ම හිටියා මේ කටයුත්තෙදී, මට කලින් කතා කරපු කතිකයින් කිවුවා මේ වෙච්ච ආලාභය ගැන, ගණනය කරලද කියලා දන්නේ නෑ හරියට මිලියන 100ක් වගේ කිවුවා එ ගාන කොහොම වෙතත් කැබ් 4ක් ත්‍රීවිල් 4ක් නැත්තම් 5ක් මෝටර් සයිකල් විනාශ කිරීම සහ අපේ මේ තියෙන බිල්ඩින් විනාශ කිරීම නිසා අපි නැවත මේවා හදන්න ඕන මේවා හදන්න යන්නේ මහජනත ජනතාවගේ මුදල් එ මිලියන 100 තිබුනනම් අපිට කාණු බොක්කු, පාරවල්, මාතෘ සායන හදන්න අපිට ඉතුරු වුණ සල්ලි, මේ ක්‍රියාව කරපු අය ගැනත් අපේ විශාල කණගාටුවක් තියෙනවා , මම නැවත කියන්නේ මේ නගරාධිපතිතුමා මෙතනින් පොළඹවගේන ගිහින් කරපු ක්‍රියාවකට ප්‍රතික්‍රියාවක් තමයි මේ සිද්ධ වුනේ, අපේ නගර සභාවට වුණ හාන්ය වගේම මන්ත්‍රීවරු කිහිප දෙනෙකුට තමන්ගේ දේවල් අහිමි වුණා මේ අයට වුණ දේවල් වලට අපි කණගාටු වෙනවා මේවා අපි කිසිසේත් අනුමත කරන්නේ නෑ, ජනතාව මීට වඩා සන්වේදි විය යුතුයි. ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට මන් විරුද්දයිනම් මන් ඔබතුමාගෙ කාර්යාලේ ඉස්සරහා බෝඩ් එකක් උස්සන් හිටියට කමක් නෑ නමුත් ඔබතුමා ජීවිත කාලයක් හම්බකරපු දේවල් විනාශ කරන එක අපි කොහෙත්ම අනුමත කරන්නේ නෑ, තවත් දෙයක් මිනිස්සු දැන් ඉල්ලන්නේ සිස්ටම් චෙන්ජ් එකක් හැමෝම කියන්නේ උගත් බුද්ධිමත් අයව ගෙන්න කියලා, එදා උන සිද්ධියෙන් උගත්බුද්ධිමත් අය දේශපාලනයට එන්නේ නෑ

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු විපක්ෂ නායකතුමා එහෙම උනෝත් දේශපාලනයට එන්නේ අනුර මන්ත්‍රීතුමා කියපු වගේ අය තමයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි මට ඉතාම භායානක තත්ත්වයක් අපි මේක අවබෝධ කර ගන්න ඕන අපිට ඕන සිස්ටම් චෙන්ජ් එකෙන් ඉල්ලන්නේඋගත්බුද්ධියක් තියෙන මිනිස්සුන්නම් මට හිතන්න බෑ ඊළඟ ඡන්දයේදී එ වාගේ අය එයි කියලා, එ නිසා දේශපාලත්ඥයෝ වශයෙන් මේක තේරුම් අරගෙන වැරදි හදාගෙන අපේ ජනතාව සන්සුන් කර ගන්න පුළුවන්නම් අපිට ඉදිරිගමනක් තියෙනවා අවසාන වශයෙන් අගතියට පත් සියළු දෙනාට අපේ කණගාටුව ප්‍රකාශ කරනවා අපි යහපත් මොරටුවක් නිර්මාණය කරන්න බලමු කියමින් මම නිහඬ වෙනවා.

**03 (19)** <u>මහ නගර සභා මන්ත්‍රී - එස්. කේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 09 වෙනිදා කියන්නේ ජාතියට තවත් අඳුරු දවසක් එක මොරටුවේ අපිට වැඩියෙන් අඳුරු දවසක් වෙනවා මොකද ලංකාවේම අපේ නගර සභාවට විතරයි මේ වගේ විශාල හානියක් උනේ ගරු නගරාධිපතිතුමනි, නගර සභාවක කෙරෙන ආමාරුම කාර්යය තමයි සෞඛ්‍ය සේවකයන් කරන්නේ කුණු පටවනවා කුණු කරත්ත වල යනවා හරියට අමාරු වැඩක් කරන්නේ මන්ත්‍රීවරයෙක්ට කිවුවෝත් සේවකයෝ නැති දවසට මේ කුණු ට්‍රැක්ටරයක් අරන් ගිහින් කුණු ටික පටවන්න කියලා මම හිතන්නේ නෑ එක්කෙනෙක්වත් එක කරයි කියලා, අපි දන්නේ නැති උනාට ගරු නගරාධිපතිතුමනි කුණු අදින සේවකයාට වඩා අන්ත පහත් රැකියාවක් කරන සේවකයෙ තමයි අදහනාගාර වල සේවය කරන්නේ මොකද කුණු වලින් තියෙන මහ ජරාම කුණ තමයි මළකුණ, මෙවා අතගාන මිනිස්සු එක්ක මේ සභාවය කොටි ගානක ලාභයක් කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මම කියන්නේ මේ නගර සභාවේ එදා ගිනි ජාලා ඇවිලෙද්දි කොලාහල කාරයෝ මේ කරපු ප්‍රහාරය එදා දවස මට අමතක වෙන්නේ නෑ මගේ අම්මා මැරුණ වෙලේ මම ඇඩුවේ නෑ එත් එදා මන් ඇඩුවා මේ නගර සභාවට කොටි ගණනක් ඉතිරිකරපු මම මේ සභාව විනාශ කරද්දි ලොකු වේදනාවක් වුනා මට එක මේ ඔක්කොම මන්ත්‍රීවරුන්ට වඩා මම වැඩ කරපු මන්ත්‍රීවරයෙක් නිසා මට කියන්න හයියක් තියෙනවා මේ වෙනුවෙන් කොමසාරිස්තුමා ඇතුළු නිලධාරින් මොකද්ද කරපු සාධාරණය මොරටුව පොලිසීයෙන් මොකද්ද කරපු සාධාරණය කියන්න මම දන්නේ නෑ, අපි බදු ගෙවන සමස්ත ජනතාවක් දෙස බැලිය යුතුයි මොරටු පොලීසියෙන් මේවාට සදාරණයක් බලාපොරොත්තු වෙන්න බෑ, මගේ දූරකථනය

නැති වෙලා දැන් අවුරුදු 2ක් ගියා එත් තාම වෙච්ච සාධාරණයක් නෑ එවා කරන්න බැරි පොලිස්සිය කොහොමද මේවා කරන්නේ, මම යෝජනාවක් කරනවා මන්ත්‍රීතුමනි සියළු මන්ත්‍රීවරුන්ගේන් ස්ථිර කරගෙන මේ නගර සභාවට සිදු කරපු ප්‍රහාරයට කාට උනත් කමක් නෑ ජොශ්ඨ පොලිස් අධිකාරිවරයෙක් යටතේ විශේෂ කොමිසමක් පවත්වලා විශේෂ පොලිස් කණ්ඩායමක් යටතේ මේවා හොයන්න ඕන ගරු නගරාධිපතිතුමනි මේ කරපු අයට නැවත මෙවැනි දෙයක් කරන්න බැරි වෙන්න දඩුවම් දෙන්න ඕන ගරු නගරාධිපතිතුමනි, පුද්ගලික තරහක් තියෙද්දි එ මිනිහා වැටුනම එ මිනිස්සුන්ට පහර දීලා වැඩක් නෑ ගරු නගරාධිපතිතුමනි මන් වැඩිය කතා කරන්නේ නෑ මට ඕන මේකට මේ සභාවට වෙච්ච අසාධාරණයට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලමින් මම නිහඩ වෙනවා.

**03 (20)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි මෙතන ඉදන් හඩ නගනවානම් මෙතන ඉන්න බලධාරීන් හා තීන්දු තීරණ ගන්න ආණ්ඩු පක්ෂයේ ඔබතුමන්ලා අපේ හඩට නිහඩනම් අපි එක්කො මෙය එළියට ගිහින් කථා කරන්න ඕනා. නැත්නම් අපට කිසිම විසඳුමක් නෑ. අපේ රට අභාග්‍යසම්පන්නයි. ආර්ථික අර්බුදයක අපේ රට තියෙන්නේ. මොරටුවේ එදාවේල හම්බකරන් කන ජනතාව ඉන්නවා. මේ අය කොහොමද යැපෙන්නේ. බඩු මිල සියයට පනහට වැඩියි. උද්ධමනය සියයට පනහට වැඩියි. නගර සභාවේ බජට් එක අරගෙන අපි බලමු මොරටුව ජනතාවට සහන දෙන්න අපට අරමුදලක් වෙන් කරගන්න පුළුවන්ද කියලා. මොරටුව දානපතියන් එක්ක කතා කරලා බලමු. යම්කිසි මුදලක් එකතු කරගන්න පුළුවන්ද මේ ජනතාව වෙනුවෙන් සහන සලසන්න කියලා. ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි, ලංකාව පුරා ප්‍රජා මුළුතැන්ගෙවල් ඇති කරන්න ඕනා. අපිට බැරිද මොරටුව මහා නගර සභාවේ මූලිකත්වයෙන් ප්‍රජා මුලුතැන්ගෙයක් පිහිටුවලා මොරටුව ජනතාවට කන්න දෙන්න. එදා කොරෝනා වලට කළා වගේ දැන් තිබෙන දැවෙන ආර්ථික ප්‍රශ්ණෙටත්, මොරටුව නගර සභාව ඉදිරිපත් වෙලා අපි තීන්දු තීරණ ගමු කියලා මම ඔබතුමාට මුලින්ම යෝජනා කරනවා.

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, දෙවනි කරුණ තමයි, මොරටුව මහා නගර සභාවට මැයි 09 වෙනිදා වුන අභාග්‍යසම්පන්න සිද්ධිය සම්බන්ධයෙන් ඒයට සම්බන්ධ විමර්ශන හරියටම සිදුවෙනවාද කියලා ගැටළු තියනවා. මේ සම්බන්ධයෙන් දැනට මොරටුව අධිකරණය විසින් සැකකරුවන් කිහිපදෙනෙක් අත්අඩංගුවට අරගෙන තියනවා. අදට දින 24 ක් වෙනවා. නමුත්, මේ සම්බන්ධයෙන් අපක්ෂපාතිව පරීක්ෂණ කරනවාද කියලා අපිට ගැටලුවක් තියනවා. මේ නඩුව උසාවියේ කතා කරනවා මම අහගෙන හිටියා. මෙහි ලොකු ප්‍රශ්නයක් තියනවා. නගර සභාවේ සී.සී.ටී.වී දර්ශන බැලුවද, නාගරික කොමසාරිස්ගෙන් හා නාගරික ලේකම්ගෙන් කට උත්තර ගත්තද, ආරක්ෂක සේවයේ සිටින සෑම පුද්ගලයෙක්ගෙන්ම කට උත්තර ගත්තද. මට රජයේ දේපළ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්න කිරීමක් තියනවා. මෙයට කිසිම සම්බන්ධයක් නැති පුද්ගලයන්ව අත්අඩංගුවට ගන්නවා. වීඩියෝවල මුහුණ තිබ්බ පලියට පුද්ගලයන්ව අත්අඩංගුවට ගන්න බැහැ. මිනිසුන්ට මුලික අයිතිවාසිකම් වලට හානියක් වෙන්න බැහැ. නගර සභාවට වෙච්ච අසාධාරණයට සාධාරණයක් වෙන්න ඕනා. මෙය පොලිසියට දීලා හරියන්නේ නැහැ. මෙය සී.අයි.ඩී දාලා කරන්න ඕනා. මේ පරීක්ෂණ ගැන අපි සෑහීමකට පත්වෙන්නේ නැහැ. නගර සභාවේ අලාභ හානිය මිලියන පනහක්, කවුද මේවා හදන්නේ. මේවට වගකිවයුතු පුද්ගලයෝ කවුද කියලා දන්නේ නැහැ. පක්ෂ පාට භේදයකින් තොරව වැරැද්ද කරපු මිනිසුන්ට දඩුවම් දෙන්න ඕනා. මේ සම්බන්ධ පරීක්ෂණ විධිමත්ව කරන්න. නාගරික මන්ත්‍රීවරු සියලු දෙනා ලිඛිතව අත්සන් කරලා ලියමුක් දෙමු මේ පරීක්ෂණ සී.අයි.ඩී.එකට දෙමු කියලා.

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මැයි 09 වෙනිදා උදේ මමත් නිරෝෂන් මන්ත්‍රීතුමත් අපේ මන්ත්‍රීවරු කණ්ඩායමත් නගර සභාවට ආවා. නගරාධිපතිතුමා විසින් බස් රථ ගණනාවකට සේවකයන් ගෙනියනකොට අපිත් අපේ අප්‍රසාදය පලකළා. ඒ වෙලාවේ අපි දුරකථන වලින් රෙකෝඩ් කරලා සමාජයට මුදා හැරියා ඒක මහජන නියෝජිතයන් හැටියට අපේ වගකීමක් නිසා. ඒ සම්බන්ධයෙන් අපි ප්‍රශ්න ගණනාවක් යොමු කරලා අපි විසින් කොමාසරිස්තුමාට ලියුමක් භාරදුන්නා. අද වෙනතුරු ඒ ලියුමට අපිට පිළිතුරු ලැබිලා නැහැ. (පිළිතුරු ලබාදීලා තියනවා) පිළිතුරු ලැබිලා නම් මම ඒ කරුණ ඉල්ලා අස්කර ගන්නවා. අපි එදා රෙකෝඩ් කරනකොට අපිට අසාධාරණකම් සිද්ධ වුණා. නගර සභාවේ සේවකයෝ අපිට පරුෂ වචනයෙන් බැන්නා. ඒ සම්බන්ධයෙන් ඒ පුද්ගලයන්ට විරුද්ධව කටයුතු කළාද කියලා මම කොමසාරිස්තුමාගෙන් අහනවා. අදාළ පුද්ගලයන්ට ඉදිරියේදී මොනවාද ගන්නා ක්‍රියාමාර්ග අපට දැනුම්දෙන ලෙසත්, ඔබතුමන්ලාට කියා සිටිනවා.මේ ආර්ථික ව්‍යසනයට සාධනීය පියවර ගැනීමට සභාවක් හැටියට එකතු වෙමු කියලා කියනවා.

එපමණක් නොවෙයි, මැයි 09 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. අපි දේශපාලන භීෂණය අනුමත කරන්නේ නැහැ.

**03 (21)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාට සුභාශිංසන පුදකරනවා. අද දවසේ තමන්ට සිදුවෙච්ච දේපළ හානි ගැන කථා කළා. හැමෝම දුකට පත්වෙලා ඉන්න මේ වෙලාවක අපි සතුටු වෙන්න හොඳ නැහැ. එතුමන්ලා වෙනුවෙන් අපගේ කණගාටුව ප්‍රකාශ කරනවා. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන 341 ක් තියනවා. මොරටුව මහා නගර සභාවට විතරක් මේ වගේ හානියක් වුනේ ඇයි කියන ප්‍රශ්නය අපි හැමෝටම තියනවා. ඒකට ප්‍රධානම හේතුව රාජපක්ෂවරුන් ප්‍රමුඛ හිටපු අගමැතිතුමා. මොරටුව මහා නගර සභාවට මේ හානිය සිදුවුනේ මොරටුව නගර සභාවේ නගරාධිපතිවරයා ඇතුළු කණ්ඩායම එම ස්ථානයට ගිය නිසා. මේ වගේ තත්ත්වයක් නැවත නැවත ඇති නොවන්න වගබලා ගන්න ඕන. වසර 04 ක් පුරාවටම අපි නගර සභාව ඇතුලේ සිස්ටම් චේන්ජ් එකක් ගැන කථාකළාට කිසිම චේන්ජ් එකක් සිදුවුනේ නැහැ කියලා ඔබ මම හැමෝම දන්නවා. මේ රටේ මධ්‍යම රජයෙන් හැම දෙයක්ම සිදුවෙන්න ඕනා කියලා දෙයක් නැහැ. අපේ රටේ මහා නගර සභා 24 ක් තියනවා. රටේ ජනතාව බඩගින්නේ පසුවෙද්දිත් මහා නගර සභා වලින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. රට පත්වෙලා තියෙන තත්ත්වය ගැන හැමදාම කතා කරනවා මිසක්, සිස්ටම් චේන්ජ් එකක් ගැන කතා කරනවා මිසක්, ඔය පුටුවට ආවම කිසිදු නායකයෙකුටවත් අවශ්‍ය වෙන්නේ නෑ අවශ්‍ය ක්‍රමවේදයක් හදන්න. ඔබතුමා ඔය පුටුවේ ඉන්න ටික කාලයකට හරි මොරටුව ජනතාවට කිසියම් මුදලක් වෙන්කරලා ඉතා කුඩා ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03 (22)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. සුසන්ත පෙරේරා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මගේ ජීවිතයේදී 1983, 1987 කලබල දැක්කා 1989 කලබල දවස්වල විල්ලෝරාවත්ත ප්‍රජාශාලාව, මාතෘ ළමා සායනයත්, සමූපකාරයත් ගිනි තියනකොට පුදුම වේදනාවක් ඇති වුනා. ඒ වෙලාවේ අපි බැලුවේ නැහැ මේ නගර සභාවේ නගරාධිපති, මහා නගර සභා මන්ත්‍රී කවුද කියලා. ඒ වගේම විශාල වේදනාවක් ඇති වුනා මැයි 09 වෙනිදා මහා නගර සභාව ගිනි තිබ්බම. මම විරුද්ධ වෙනවා මහා නගර සභාව ගිනි තිබ්බට. මෙයට කඩිනම් විසඳුමක් අවශ්‍යයයි. උදේ ඇවිල්ලා මෙතන වීඩියෝ කරපු මන්ත්‍රීවරුන්ට බැරිවුනා දවල් ඇවිල්ලා වීඩියෝ කරන්න. දවලුත් වීඩියෝ කරානම් තමයි වටින්නේ, එතකොට ගිනි තිබ්බේ කවුද කියලා බලාගන්න පුලුවන්. ඒගොල්ලෝ ඒ වෙලාවේ එන්න බයයි, කුහක දේශපාලනය. අපිනම් නගරාධිපතිතුමත් එක්ක බීලා නැහැ. සමහර අය වැඩ කරන්නේ අරක්කු අඩියට. සමහර අය කියන්න පුළුවන් අර පක්ෂයෙන් කරා මේ පක්ෂයෙන් කරා කියලා මගේ පෞද්ගලික මතය නම් මේක ගිනි තියන්න කවුරුහරි වචනයකින් හරි සම්බන්ධ වුනානම් අත්අඩංගුවට ගන්න ඕන. අපි නායකයන් වෙනුවෙන් අපි ගියා වැරැද්දක් වුනා. එයට දඬුවමක් ලැබුණා. නමුත්, ඒ දඬුවම් විඳින මිනිස්සුන්ට මෙතන නිකං මඩ ගහන්න එපා. හොරුන්ව ආරක්ෂා කරනවා අපි දැක්කා. මොකද අපේ ගමේ හොරු ඒ හොරුන්ට පැනලා යන්න උදවු කළා අපි දැක්කා. මගේ මන්ත්‍රීවරුන්ට අරියාදු කළා. මමත් පෞද්ගලික අරියාදු වලට ලක්වුණා. මම මගේ ගමේ මිනිස්සුන්ට ස්තුතිවන්ත වෙනවා දේශපාලන පක්ෂ භේදයකින් තොරව මාව ආරක්ෂා කලාට. නැත්නම් මගේ ගෙදරටත් ගහනවා. ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා නගර සභාවට වෙච්ච අලාභයට දැඩි දඬුවම් දෙන්න කියලා. ඒ වගේම මම කණගාටුව ප්‍රකාශ කරනවා මගේ මන්ත්‍රීවරුන්ට වෙච්ච අලාභයට සහ ඔවුන්ට ඇති වූ වේදනාවට

**03 (23)** <u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ජනතා විමුක්ති පෙරමුණ විදියට බලාගෙන හිටියා මේ සම්බන්ධයෙන් යෝජනාවක් "ඌ" වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට. නමුත්, දැන් යෝජනාව ඉදිරිපත් කෙරුවාට වැඩක් නැහැ. දැන් ඒ විවාදය සිද්ධවෙලා. යෝජනාව ඉදිරිපත් කරන්න ඉන්න පාර්ශවයෙනුත් තාම පෙත්සම් පැමිණිලි ඒ නිසා දැන් අපිට මේ යෝජනාව වැඩක් නැහැ නගරාධිපතිතුමනි. මැයි 09 වෙනිදා සිදුවීම විවිධ පුද්ගලයෝ තම තමන් දකින විදියට, තම තමන් කැමති විදියට විග්‍රහ කර ගැනීම බොහෝමයක් සිද්ධ වෙනවා. අපි විරුද්ධ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළේ තම තමන්ට කැමති විදියට මෙය විග්‍රහ කරගන්න පුලුවන්. මෙය අහඹු සිදුවීමක් නෙමෙයි, මෙය කාටවත් වෙච්ච අත්වැරැද්දක් නෙමෙයි, මෙය දේශපාලන ගමන් මගේ සන්ධිස්ථානයක් මහා දැවැන්ත ආර්ථික අර්බුදයක් මේ රට බංකොලොත් කරලා ඉවරයි. මගේ රටේ ජනයා විශාල පීඩාවකට ගොදුරු වෙලා. ඒ ජනයාගේ පීඩාවන් වෙනුවෙන් මේ රටේ තරුණ ප්‍රජාව නිර්පාක්ෂිකව

දේශපාලන භේදයකින් තොරව මේ ජනයාගේ දෛනික ජීවිත පත්වෙලා තිබෙන ඉරණමෙන් බේරා ගැනීම සඳහා අරගල භූමියකට, එක භූමියකට අරමුණු ගණනාවක් සමඟ සංවිධාන විශාල ප්‍රමාණයක් ඒකරාශී වෙලා. මෙහි කේන්ද්‍රස්ථානය ගාලුමුවදොර පිටිය මෙය ප්‍රධාන පාඨය ජනාධිපතිවරයා  කියන එක. අපේ රටේ එක පැත්තක ජනයා තමන්ගේ ජීවිතවල දෛනික කටයුතු කරගන්න බැරි අසීරුතාවයක, වේදනාවක, පෝලිම් වල අඳෝනා නඟනවා. දෙස් දෙවොල් දෙනවා. දරුවෝ බඩගින්නේ හාමතේ අද දෛනික ප්‍රවෘත්ති වාර්තා වෙනවා. මිනිසුන්ට කන්න නැහැ. ඒතරම් අතිශය බියකරු භයානක තත්ත්වයකට රට ඇදගෙන වැටුනා. ගරු නගරාධිපතිතුමනි, 2/3 බලයක්, හැටනම ලක්ෂයක මහා ජන වරමක්, මේ පළාත් පාලනවල සියලු බලය ඒ නිසා දැවැන්ත ජන වරමක්, සහිත පාලනයක් පොදු ජන එක්සත් පෙරමුණ දැන් අපි මූලික කාර්යය අමතක කරලා කැල්ලෙන් කැල්ල අමතක කර මන්ත්‍රීවරු තමන්ගේ පෞද්ගලිකත්වය මතුකරමින් මෙය විග්‍රහ කරන්න හදනවා. මෙය වැරදියි. සමන්ලාල් මහත්තයාගේ අප්‍රසාදය පලකරන්න අප්‍රසාදය නෙමෙයි. සමන්ලාල් මහත්තයත් මෙහි ගොදුරක්. සමන්ලාල් මහත්තයාට අප්‍රසාදය නෙමෙයි මේ ධූරය දාලා වහාම යන්න කියන්න තරම් වැරදි කන්දරාවක් තියනවා. මේ ආයතනයට ඔහු කරපු. මම සැලකිය යුතු ලෙස මේ සභාවේ කියලා තියනවා. පොදු ජන එක්සත් පෙරමුණේ ජනාධිපති ධූරයත්, අගමැති ධූරයත්, ඒ වගේම ආණ්ඩු පක්ෂයත් ව්‍යාප්ත කරගත්ත දැවැන්ත විරෝධතාවයන් රටපුරා ගොඩනැගෙමින් තියෙනවා. ඒ වගේම අපි දැක්කා ජනාධිපතිවරයා විසින් අගමැතිවරයාට ධූරය දාලා යන්න කියපු මොහොතේ අපි දැක්කා අගමැතිවරයාගේ සමුගැනීමේ අවස්ථාව සඳහා තමන්ගේ ප්‍රාදේශීය සභා, නගර සභා, මහා නගර සභා ප්‍රධානියෝ ප්‍රමුඛ නියෝජිතයෝ යම් ප්‍රමාණයක් අරලියගහ මන්දිරයට ගියා. ඇත්තටම ගියේ අගමැතිවරයාට සමුදීමට නම් ඒ ගැන ගැටලුවක් නැහැ. ඇඟිලි සලකුණු තියපු හැත්තෑවක් ගියා, වැසිකිළි ඇතුළේ හිටපු සේවකයන් ඇදන් ගියා. මේක තමයි නගරාධිපතිවරයාට එරෙහිව තිබෙන චෝදනා. ඇත්තටම නායකයාට සමුදෙන්න තිබෙන අවංක චේතනාවෙන් නම් මේ නගර සභාවේ සේවකයෝ බලහත්කාරයෙන් අරගෙන යන්න ඕනා නැහැ. අවංකව මේ රටට ආදරය කරන මිනිස්සු ඕන තරම් අරගෙන යන්න තිබුණනේ. මොකක්ද මේ කළේ උදේ පාන්දර බස් ටිකක් ගෙනල්ලා ගැහුවා නගර සභාවේ සේවකයෝ බස් වලට පටවන්න ගත්තා. ඇත්තටම එදා හැසිරුනේ නගරාධිපතිවරයෙක් වගේ නොවෙයි, චන්ඩියෙක් වගේ. මම දැක්කා ඔහුගේ පුතා තරුණයකුට පහර දෙනවා නගර සභාව ඉදිරිපිට. මේගොල්ලෝ මේ රාජ්‍ය දේපළත් එක්ක, ජනතාවගේ ධනයත් එක්ක දීර්ඝ කාලයක් විගඩම් කළා. නගරාධිපතිවරයාගේ ජුන්ටාවක් ඉන්නවා. ඒ ජුන්ටාවේ ඉන්න පිරිස මේ ආයතනයේ වැඩ කරන්නේ නෑ. පොත් අත්සන් කරලා වෙන රස්සාවල් වලට යනවා. රටේ නායකයාට සමුදෙන්න අරගෙන ගියේ අවිහිංසාවාදී මිනිසුන් නෙමෙයි. ආරංචි විදියට අරන්ගිය පොලු වලට ඇණ ගහලා තමයි අරන් ගිහිල්ලා තියෙන්නේ. ආයතනයේ වැඩ කරන සේවකයෝ අරගෙන යන්න පුලුවන්ද. මේ භූමිකාව තවදුරටත් ප්‍රචන්ඩත්වය වර්ධනය කරන භූමිකාවක්. මේ අපි තවදුරටත් අහගෙන ඉවසගෙන හිටපු කාලය හොඳටම ඇති මහත්වරුනි, මතක තියාගන්න ඔය භූමිකාව තමයි අර ගෝල්ෆේස් ගිහිල්ලා අගමැතිවරයාගේ රැස්වීමේදී සනත් නිශාන්තගේ කතාව, ජොන්ස්ටන්ගේ කතාව අවසානයේදී මෙය තමයි වේලාව, ගෝල්ෆේස් බහින්න වේලාව කියලා කිව්වේ අපිද? ගෝල්ෆේස් අරගලය කරන අවිහිංසාවාදි තරුණයන්ට පහර දුන්නේ කවුද? මේ රටේ ජනයා විශ්වාස කලා තමන් මුහුණදීලා තියෙන තත්ත්වය නිසා තමයි ගෝල්ෆේස් ඒකේ තරුණයෝ අරගලය කරන්නේ කියලා. ඒ තරුණයක්ට පහර දෙනකොට, ඒක මාධ්‍ය හරහා කියනකො,ට මිනිසුන්ගේ හිතට වේදනාවක් ආවා. මේ ගහන්නේ තමන්ට කියලා දැනුණා. මිනිසුන්ට කේන්තියක් ආවා. අපේ නගර සභාවේ ගිනි නිවන රථවලට ගැහුවේ තරුණියන්. ගල් වලින් ගැහුවේ. මින් දවස් තුනකට පස්සේ කියනවා නගරාධිපතිතුමාගේ කාමරයේ තිබෙන ෆයිල් සීල් කරන්න ඕන කියලා. සමහර මිනිස්සු රඟපානවා පුදුමයි. දැන් මාස දෙකකට කලින් සමන්ලාල් එක්ක එකට හිටිය මිනිස්සු. ඒ ෆයිල් ටික සීල් කරන්න තියෙන වේලාවේ මේ තාප්පෙන් පැනලා ගාවින් මහත්තයාගේ පුතා ආවේ අපිට උදව් කරන්න වෙන්න පුළුවන්. ඒ මනුස්සයාට ඉතාමත් තුච්ච විදියට පහර දෙන්න පටන් ගත්තා, එළියෙ ඉඳන් ආව මිනිස්සු. අපිට ගහන එක නවත්තන්න බැරිවුණා. ඒනිසා මම කියන්නේ තමුන්නාන්සේලා අවංක වෙන්න. අපිට තව අනාගතයේ කෑම හිඟයක් එක්ක සාගතයක් එනවා. අපේ දරුවන්ටත් මේ බිමේ අනාගත පරම්පරාවත් අසරණයෝ කරලා ඉවරයි. අද අපේ ජීවිත නිවැරදි කරගන්න. මේ වරද පිළිගන්න. මේ පොදු පෙරමුණේ සමන්ලාල් ඇතුළු කණ්ඩායම විශාල වරදක් කලා. ආදාහනාගාරයට මම ගියා. පක්ෂයක් ලෙස මෙයට කරපු විනාශය සුළුපටු නැහැ. පොදු ජන එක්සත් පෙරමුණ මේ පාලනයෙන් ඉවත් විය යුතුමයි. තවදුරටත් පොදු ජන එක්සත් පෙරමුණට මේ රටත්, මේ නගරයත් පාලනය කිරීමට කිසිදු සදාචාරාත්මක හැකියාවක් නැහැ. වගකීම

එහෙම්පිටින්ම අත්හැරලා දාපු පාලනයක්. රටත් කෑවා. ගමත් කෑවා. ඒක නිසා දැන් ඕගොල්ලෝ යන්න. අපි බලමු ඉදිරියේදී යහපත් පාලනයක් මේ රටේ ජනයාට ගොඩනගන්න අවස්ථාව උදාකර දෙමු.

**03 (24)** **මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අද ඔබතුමා වැඩ බැලීම සම්බන්ධව අපගේ සුභාශිංසනය පිරිනමන අතර විශේෂයෙන් පසුගිය මාසයේ 09 වෙනිදා සිදු වූ සිදුවීම නිසා අගතියට පත්වෙච්ච අපගේ සහෝදර මන්ත්‍රීවරු සියලු දෙනාටම ශෝකය ප්‍රකාශ කරනවා. ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි විශේෂයෙන් මතක් කරන්න ඕන. අපි අධ්‍යනය කල යුතුයි. මේ ප්‍රශ්නය ඇත්තටම ඇති වුනේ සිස්ටම් එක වෙනස් කරන්න කියලා ඉල්ලපු ගෝගම ඉන්න තරුණයන්ට සිස්ටම් එක වෙනස් කරලා ගහපු නිසා තමයි මෙය වුණේ. නගර සභාවේ සේවකයෝ ටික සිස්ටම් එක වෙනස් කරලා නගර සභාවේ බස් අටක හාරසියකට ආසන්න ප්‍රමාණයක් නිවාඩු අනුමත කරන්නේ නැතුව ගිය නිසා තමයි මේ සිද්ධිය වුනේ. අපි මේ වෙලාවේදී මොරටුවේ ජනතාව විදියට ශෝකයට පත්වෙන අවස්ථාවක්. මොරටුව මහා නගර සභාවේ සමස්ත දේපළ ගිනිගත්තා. විනාශ වුණා. මොරටුව මහා නගර සභාවේ දේපළ ගිනිගත්තා විනාශ වුණා. කොමසාරිස්තුමා කියන විදියට කෝටි 10කට වැඩි ප්‍රමාණයක් විනාශ වෙලා තියනවා. මේවා අපේ සම්පත් මෙය කවුරු කළත් වැරදියි. ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධව විශේෂ පරීක්ෂණයක් කරන්න තියනවා. මේ අරගලයට මුවා වෙලා මංකොල්ල කාරයෝ, හොරු තමාගේ අරමුණ ඉටුකිරීමට කටයුතු කලා. මෙයට මුවා වෙලා අහිංසක මිනිස්සු අත්අඩංගුවට ගන්නවා වෙනුවට, සැබෑ පරීක්ෂණ කරලා සැබෑ විමර්ශන කරලා ඔවුන්ව අත්අඩංගුවට ගතයුතුයි. ඒනිසා තමන්ගේ තරහවට ඔවුන්ව අත්අඩංගුවට ගන්න එයට මන්ත්‍රීවරුන්ට ලිස්ට් දෙන්න බෑ. ඒනිසා නිසියාකාරව පරික්ෂණ කරලා මේ කටයුත්ත සිදු කල යුතුයි. හනුමන්තා ගිනිතිබ්බා වගේම සමන්ලාල් ප්‍රනාන්දු, ජොන්ස්ටන් ප්‍රනාන්දු, සනත් නිශාන්තලා, බැසිල් කියන හනුමන්තලා එකතුවෙලා මුළු රටම ගිනි තියලා ඉවරයි.

( සභා සෝෂා )

අද මිනිස්සුන්ට කන්න නෑ. සියයට පන්සියයකින් උද්ධමනය ඇති කරපු මේ ආණ්ඩුව රට ගිනි තිබ්බා වගේම රට කෑවා.

**03 (25)** **මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මැයි මාසේ 09 වෙනිදා සිද්ධිය ගැන මම කථා කරන්න උනන්දු වෙන්නේ නැහැ. මොකද බොහෝමයක්ම මන්ත්‍රීවරුන් ඒ ගැන කථා කළ නිසා. කෙටියෙන් කිව්වොත් මැයි මාසේ 09 වෙනිදා සිද්ධිය ඉතිහාස ගතවෙනවා 1983 කළු ජූලිය වාගේ මැයි 09 වෙනිදාත් ඉතිහාස ගතවෙනවා. මේ ක්‍රියාදාමය නිසා අප සභාවේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල් වලට සිදු වූ හානිය පිළිබඳ මම කණගාටුවට පලකර සිටිනවා. ඒ වගේම මොරටුව නගරයේ කීර්තියට වෙච්ච හානිය සහ මොරටුව මහා නගර සභාවට වෙච්ච හානිය සහ පාඩුව සම්බන්ධයෙන් විරුද්ධත්වය පලකර සිටිනවා.

**03 (26)** **මහා නගර සභා මන්ත්‍රී - එෆ්. බී. නිලංක සිල්වා මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඇත්තටම මේ මොහොතේ ආයාචනා හා පෙත්සම් යටතේ කතා කරන්න අදහසක් තිබුනේ නැහැ. නමුත්, මොරටුව මහා නගර සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් එක එක අදහස් ඉදිරිපත් කළා. ඒ සියලුම අදහස් වලට මම ගරු කරනවා. නමුත්, මම ඇත්තටම ආයාචනාවක් කරන්න හදන්නේ, මොරටුව මහා නගර සභාව සතුව තිබෙනවා සුවිශේෂී වූ ගිනි නිවීමේ සේවාවක් .එහි තිබෙන ගිනිරථ දෙකක් කවුරුන් හෝ විසින් හානියකට පත්කළා. දැන් එය පොලිසිය භාරයේ තිබෙනවා. එය නඩු භාණ්ඩයක් වෙලාද කියලා මම දන්නේ නැහැ. නීත්‍යානුකූල පදනම මම දන්නේ නැහැ. නමුත්, එහි වීදුරු කැඩිලා බිඳිලා ගිහිල්ලා තියෙන්නේ. දැන් වර්ෂා කාලයක් ඇවිල්ලා තියෙන්නේ. වතුර ඇතුලට කාන්දු වෙනවා. විශාල වටිනාකමක් ඇති රථ වාහන දෙකක්. වතුර ඇතුලට කාන්දු වෙනවා. දැන් වෙලා තියෙන්නේ විදුරු කැඩිච්ච හානිය විතරක් නම්, නඩු භාණ්ඩයක විදියට තවත් තියාගැනීමෙන් වෙන්නේ තවත් හානි ඒ රථ දෙකට සිදුවීම. කොමසාරිස්තුමා හා ඔබතුමා මැදිහත්වෙලා අඩුම තරමේ එම රථ දෙකට ආවරණයක්වත් අපි දාමු. අපේ දේ අපි රැකගමු, මෙතනින් එහාටවත් කියලා මගේ ආයාචනාව අවසන් කරනවා.

**03 (27)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා**</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මැයි 09 වෙනිදා උදේ දැනගන්නට ලැබුණා සේවකයන්ව අරගෙන යන්න එනවා කියලා. මම ඒ වෙලාවේ නගර සභාවට එනකොටම මට විරෝධය දක්වමින් මාත් එක්ක රණ්ඩුවටමයි ආවේ. ඒ අවස්ථාවේදී නගර සභාවේ සේවකයෝ ටිකත් එකතු කරගෙන නගරාධිපතිතුමා මට පරුෂ වචනයෙන් බැන්නා. ඉස්සරහට ඇවිල්ලා මට පරුෂ වචනයෙන් බැනලා මන්ත්‍රීවරුන්ගේ තියන ගරුත්වය එහෙමපිටින්ම නැති කරලා දිගින් දිගටම බාධා කළා. අපිට කමක් නැහැ සේවකයෝ අරන්ගියාට හැබැයි, සේවකයෝ අත්සන් කරලා යනවා නම් ඒකට අපිට බලන් ඉන්න බැහැ. ඒ මොකද අපි ජනතාවට ඒක කියන්න ඕක. ඒ ගැන කතා කරන්න ගියාම තමයි නගරාධිපතිවරයා ප්‍රමුඛ විරාන් සොයිසා මගේ දුරකථනය උදුරගෙන මට මරණීය තර්ජනය කරලා. මට කුණුහරපෙන් බැනලා. මට අපහාස කරලා. මට ගහලා මාව නගර සභා පරිශ්‍රයෙන් එළියට දාන්න තරම් කටයුතු කලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා**</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම දන්න නීතිමය පැත්ත ඒ සේවකයාව අධිකරණයට යොමු කරලා දැන් ඇපමත මුදා හැරලා තියෙන්නේ. අධිකරණ කටයුත්තක් කෙරෙන නිසා නැවත ප්‍රකාශයක් කිරීමට හැකියාව තිබේද?

<u>**මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා**</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම පැමිණිල්ලක් භාරදීලා තියෙනවා කොමසාරිස්තුමාට. ඒ පැමිණිල්ලට අපි බලාපොරොත්තු වෙනවා නගර සභාව ඉක්මණින් ක්‍රියාමාර්ගයක් ගනියි කියලා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, එදා සිදුවෙච්ච දේවල් ගැන අපිත් බොහෝසේ කණගාටුවෙනවා. එදා නගර සභාවේ දේපල විනාශ කරපු එක ගැන අපේ ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමාගේ ගෙදරට පහර දීපු එක ගැන අනෙක් සියලු මන්ත්‍රීවරුන්ගේ ගෙදරට පහර දීපු එක ගැන අපි කණගාටු වෙනවා. ඒ වගේ සුරංග මන්ත්‍රීතුමා කියපු බුදු පිළිමය ගිනි තියපු කවුරුහරි ඉන්නවා නම් ඒ අත් දෙක පිච්චෙන්න ඕන. ඒ බුදු පිළිමයට හානි කරපු කවුරු වුනත් කමක් නැහැ. අපේ අනුර මන්ත්‍රීතුමා, ෆ්‍රැන්සිස් මන්ත්‍රීතුමා මට ඒ වේලාවේ බොහෝම සහයෝගයක් දුන්නා. මන්ත්‍රීවරු දෙන්නා තමයි මාව අල්ලගෙන මට සෑම උදව්වක්ම කලේ. ඒනිසා මම එතුමන්ලා දෙදෙනාට ස්තුතිවන්ත වෙනවා.

**03 (28)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා**</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, එදා දිනයේ වෙච්ච සිදුවීම සම්බන්ධව පෞද්ගලිකව මාගේ කණගාටුව. ඒ වගේම 9 වෙනිදා දවස මුලු රටටම විශාල විනාශයක් වුන දවසක්. ඒ සම්බන්ධව මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මෙම සිද්ධියට පෙර දවස තුල අපි දැක්කා වීඩියෝ ක්ලිප්ස්වල. 8 වෙනිදා දවසේ එදා සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමා කථා කලා වගේ මෙහි මහා මොළකරු කොහෙද ඉන්නේ. එතුමා තමයි මේ ක්‍රියාදාමයට වගකිව යුත්තේ කියලා ප්‍රකාශ කරන්න ඕන. 8 වෙනිදා මහින්ද රාජපක්ෂ මැතිතුමාව හමුවෙන්න ගිහිල්ලා අපි දැක්කා ඒ නගර සභාවල සභාපතිවරු, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු, ඒ වගේම මහා නගර සභාවල නගරාධිපතිවරු ඒකරාශිවෙලා එතුමාට උත්තේජනයක් දෙනවා. ඉල්ලා අස්වෙන්න බලාපොරොත්තුවෙලා හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමාට යම් කිසි විදියකට කියනවා තමුන්නාන්සේ ඉල්ලා අස්වෙන්න එපා. තමුන්නාන්සේව අස්කරන්න දෙන්නැ. අපි බලාගන්නම්. ඒකට අවශ්‍ය වැඩපිළවෙල සකස් කරලා තියෙන්නේ කියලා. මීට වඩා ඉතාමත්ම හොඳ විදියට අපි නැවත තමුන්නාන්සේව ඒ තනතුරට පත්කරනවා කියන එක. මේක සැලසුම් සහගතව ක්‍රියාත්මක වුන ක්‍රියාදාමයක් ලෙස ප්‍රකාශ කරන්න ඕන. ඒ ගෝඨා ගෝ ගමට ගහන එකයි, මයිනා ගෝ ගමට ගහන එකයි ඉතාමත්ම සැලසුම් සහගතව වැඩපිළිවෙලක් ඇතිව කරපු ක්‍රියාදාමයක් ලෙස ප්‍රකාශ කරන්න ඕන. නමුත්, අපේ මේ සහෝදර සේවකයෝ දන්නේ නැහැ ඒ මිනිස්සුන්ව එක්කගෙන යන්නේ 9 වෙනිදා උදේ ඒ බස් ගෙනල්ලා සේවකයෝ 400ක් පමණ. ඒ වගේම තමන්ගේ දේශපාලන හෙන්චයියන්ව ඒකරාශි කරලා මේ ගෙනියන්නේ තමන්ව පාවලා දිමක් කරන්න කියන එක. එතන ගිහිල්ලා තමන්ගේ මතය දේශපාලන මතය ඉදිරිපත් කරානම් අපිට ඒකට කිසි ප්‍රශ්ණයක් නැහැ. නමුත්, සභාවේ සේවකයෝ නම් තමන් ඒ නිවාඩු ගතයුතු ක්‍රමවේදය ඒ ආයතන සංග්‍රහයේ තියෙනවා. ඒ නිවාඩු ගතයුතු ක්‍රමවේදය ඒවා අනුගමනය කරලා ඒ නිවාඩු ලබාගෙන ඒ තමන්ගේ දේශපාලන මතය ප්‍රකාශ කිරීම සඳහා එතන ඒකරාශි වුනානම් අපේ ප්‍රශ්ණයක් නැහැ. අපේ ඒ ගැන විරෝධතාවයක් නැහැ. සේවකයන් 78 පමණ ඒ නියමිත ක්‍රමවේදය අනුගමනය

කරන්නේ නැතිව බලහත්කාරයෙන් වෙන්න පුලුවන්, කැමැත්තෙන් වෙන්න පුලුවන්, ස්වෙච්ඡාවෙන් වෙන්න පුලුවන්, කෙසේ හෝ ඒ සේවකයන් ගිහිල්ලා එතන දේශපාලන අරමුණක් සඳහා පෙනී හිටියා කියන එක. ඒ වගේම ඒ පිරිසෙනුත් සැහෙන පිරිසක් අර අරගල භූමියට ගහනවා දකින්න ලැබෙනවා. ඒ වීඩියෝ දර්ශනවලින්. ඒ වගේම නොයෙකුත් පින්තූර මාර්ගයෙන් දැන් සේවකයින් යම්කිසි ප්‍රමාණයක් මේ වෙනකොටත් සී අයි ඩී එකෙන් අරගෙන තියෙනවා. ඒ වගේම නගරාධිපතිවරයා මේ වෙනකොට ඉන්නේ රැඳවුම් භාරයේ. ඒ වගේම ඔහුගේ පුතාත් ඊයේ වෙනකොට ඔහුවත් රිමාන්ඩ් කරනවා. මෙය කොහෙන් කෙලවර වෙයිද කියලා අපි දන්නේ නැහැ. මේවා සොයාගෙන යනකොට මේ සභාවේ සේවකයෝ බෝහොම අහිංසක සේවකයෝ මේ දුප්පත් සේවකයෝ තමන්ගේ රැකියාව අද දේශපාලනය හින්දා පූදකරලා තියෙනවා. අපේ සේවකයන් ගැන බොහෝම කණගාටුයි. ස්වෙච්ඡාවෙන් ගියානම් කැමැත්තෙන් ගියා නම් ඒක වෙනම පැත්තක්. නමුත්, මේ බලහත්කාරයෙන් තමන්ගේ රැකියාව කියන එක ඉදිරියට ගිහිල්ලා රැකියාවට තියෙන භය නිසා මේ අයව අරගෙන ගිහිල්ලා මේ ප්‍රයෝජනයට ගත්තා කියන එක. ඒ වගේම මේ සිද්ධාන්තයට මේ දවස පුරා ඇතිවුන ක්‍රියාදාමයට අපේ බොහෝම කණගාටුව ප්‍රකාශ කරන්න ඕන. මන්ත්‍රීවරු ගණනාවක් හිතවත් ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා අපිත් එක්ක දේශපාලනය එකට කරේ මගේ මුල්කාලයේ කොරලවැල්ලේ. ඒ වගේම ඔසඳ මන්ත්‍රීතුමා ඒ වගේම ෆ්‍රැන්සිස් මන්ත්‍රීතුමා, අනුර මන්ත්‍රීතුමා, මල්ලිකා මන්ත්‍රීතුමිය ඇතුළු මේ සියලුම මන්ත්‍රීවරුන්ට ඒ පහර දුන්න වැඩේ ගැන අපි බොහෝම කණගාටු වෙනවා. ඒ වගේම හෙලා දැකලා කථා කරනවා. ඒ අයට ලොකු පාඩුවක් වෙලා තියෙනවා. අපි ඒ ගැන කථා කරන්න ඕන. ඒ පාඩුව සභාවක් හැටියට අපි කොහොමද ඉදිරියේදී සභාවෙත් ප්‍රශ්ණ තියෙනවා. නමුත්, මේ මන්ත්‍රීවරුන්ගේ පැත්තත් අපි හොයලා බලන්න ඕන කියන එක මතු කරනවා. මම කියන්නේ මේ ක්‍රියාදාමයට මුල පිරුවේ අර මහා මොළකරු. ඒ මහා මොළකරුට අවශ්‍ය නැහැ මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවයන් හෝ ඒ ජනතාවගේ උවමනාවන් සම්බන්ධව වැඩ කටයුතු කරන්න හෝ ඒ පිළිබඳව කටයුතු කරන්න. ජනතාව පැත්තෙන් බැලිමක් ඒ මහා මොළකරුට අවශ්‍ය නැහැ. ඔහුට කෙසේ හෝ අවශ්‍ය වන්නේ බලය තියාගැනිම පමණයි. ඒ ද්විත්ව පුරුවැසියාට වුවමනා වෙන්නේ මේ රටේ ජාතියට අපේ මිනිස්සුන්ට කැක්කුමක් ඇල්මක් ඒ පුද්ගලයාට නැහැ කියන එක ප්‍රකාශ කරන්න ඕන. මේච්චර ආණ්ඩුව කඩා වැටෙනකොට මුල ඉඳලාම ගත්ත තින්දු තීරණත් එක්ක සියලුම තින්දු තීරණ අඩුපාඩු තියෙනකොට අද රටේ මිනිස්සු පීඩනයට ලක්වෙලා තියෙනවා මේ ගත්ත තින්දු තීරණ නිසාවෙන්. මහා පොලොවේ මිනිස්සුන්ගේ තියෙන අඳෝනා මොනවාද ගෝඨා ගෝ හෝම් කියන එක මේක තමයි යථාර්තය. මේක තමයි ජනතාවගේ ඉල්ලිම. අපි කියන්නේ නැහැ ජනාධිපතිවරයෙක්ට එකපාරටම ඉල්ලා අස්වෙන්න කියලා. නමුත්, යම්කිසි නිශ්චිත කාලසීමාවක් තුල මේ අයින්විම සඳහා වැඩ සටහනක් අනෙකුත් සියලුම පක්ෂ සමග එකතුවෙලා සර්ව පාක්ෂික ආණ්ඩුවක් හදලා මේ රට ඉදිරියට ගෙනියන්න අවශ්‍ය කරන වැඩපිළිවෙල සකස් කරන්න. අනෙකුත් සියලුම පක්ෂ එකතුවෙන අවස්ථාවේ මේ සඳහා අවශ්‍ය කරන ඉඩකඩ ලබා නොදී අපේ හිටපු නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන අපිට කණගාටුයි. අවංකවම මේ ජනමතය පිළිඹිබු වෙන්න තිබ්බ අවස්ථාව මොට කරලා විනාශ කරලා දැම්මා කියන එක කියන්න ඕන. මෙන්න මේකයි සැබෑ තත්ත්වය. අපි බලන් ඉන්නවා අපි රටට ආදරය කරන මිනිස්සු, ගමට ආදරය කරන මිනිස්සු, ඒ නිසාවෙන් අපි බලන් ඉන්නවා අපි සුභවාදිව බලනවා අපේ හිටපු නායකතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමා යම්කිසි ආකාරයකට මේ රට ගොඩගනියි, උස්සාහයක යෙදෙයි කියන ඒ සුභවාදි හැගිම ඒ ප්‍රාර්ථනාවත් සමඟ අපි ගමන් කරනවා කියලා ප්‍රකාශ කරන්න ඕන. ඒ වගේම මේ සභාවට විශාල අලාභයක් සිදුවුනා. ලොකු අගතියක් සිදුවුනා. මේක දේශපාලන කෝණ වලින් බලන්න නරකයි. මෙතන අපි හිතන්නේ නැහැ දේශපාලනයට සම්බන්ධ කිසිම කෙනෙක් නගර සභාවට හානියක් කරයි කියලා. මේ මොරටුවේ මිනිස්සු නගර සභාවට ආදරේයි. මේක දේශපාලන කෝණයකින් බලන්න එපා. ඒ වගෙ ලසු තැනකට අපි මේ ප්‍රශ්ණය ලක්ක රන්න අවශ්‍ය නැහැ. මේක පුළුල්ව දකිමු. මේ මිනිස්සුන්ගේ කෝපා විෂ්ඨවිම ගැන අපි හිතන්න ඕන. සමන්ත මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයෙක් හැටියට ඉඳලා තියෙනවා. නියෝජ්‍ය නගරාධිපතිවරයෙක් හැටියට ඉඳලා තියෙනවා. අද වැඩ බලන නගරාධිපතිවරයා මම සුභ පතනවා. නගරාධිපතිවරයත් මන්ත්‍රීවරුන්ට ගරු කරමින් මන්ත්‍රීවරුන්ගේ අදහස් උදහස් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරනවා. මම දැකපු අවුරුදු 12 තුල ඒ නගරාධිපතිවරයා මොරටුවට කරපු අවැඩ නිසා තමයි අපේ මේ සභාව විනාශ වුනේ කියන එකත් ප්‍රකාශ කරන්න අවශ්‍යමයි. පොඩි පොඩි මිනිස්සුන්ගේ දේවල් පර්චස් 2කේ මිනිස්සු වැසිකිලිය කඩනකොට බෝට්ටු වැඩපලක් කරන මගේ ඥාතියෙක්ට දේශපාලන කෝණයකින් බලලා ඒ මිනිහාව විනාශ කරලා දැම්මා කියන එක මුලු සභාවම දන්නවා. ඒ මිනිසාගේ විශාල මුදලක් ආර්ථික වශයෙන් බිංදුවටම වැට්ටුවා කියන එක කියන්න ඕන. මෙතන බාප්පාගේ පුතාද මහප්පාගේ

පුතාද කියන එක නෙමෙයි වැදගත් වෙන්නේ. සුරංග මන්ත්‍රීතුමා ඔබතුමාත් මනුස්සයෙක්. මන්ත්‍රී කෙනෙක් වෙන්න පුලුවන්. නමුත්, මනුස්සකම තමයි වැදගත් වෙන්නේ. කෝපාවිෂ්ඨ වුන මිනිස්සුන්ගේ අදෝනා තමයි ඒ මිනිස්සුන්ගේ ආතතිය තමයි මේ සභාවට ගහලා දැම්මේ. මේ වෙච්ච හානියට වගකිවයුතු මහා මොලකරු කවුරුත් දන්නවා. ඒ වගේම ඒකේ ඉත්තො බවට පත්වුන නගරාධිපතිවරයාත් අපි දන්නවා. ඒකෙත් පල්ලේහාට ගියාම සේවකයෝ ගැනත් අපි දන්නවා. මේ අගතිය ගැන හරි විශ්ලේෂණයක් කරන්න. මේක හරි තක්සේරුවට ලක්කරන්න වැඩපිළිවෙලක් සකස් කරන්න. මන්ත්‍රීවරු හැටියට සභාව හැටියට අපි සාකච්ඡා කරලා අපි හරි තින්දු තිරණ ගමු. තමුන්නාන්සේට අපි ශක්තියක් වෙන්නම්. ඒ වගේම අපි කියනවා මේ සම්බන්ධව අත්අඩංගුවට ගන්න මිනිස්සු ගැන පොඩ්ඩක් හිතන්න. මේ වැඩේ කරපු මිනිස්සු ගැන හරියට පොලිසිය හරහා අත්අඩංගුවට ගන්න ඒ අයට දඩුවම් දුන්නට අපේ කිසිදු ප්‍රශ්ණයක් නැහැ.

**03 (29)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ආයාචනා පෙත්සම් යටතේ අපි ගත්තේ මේ අයිතමයද කියන එකයි ප්‍රශ්නේ තියෙන්නේ. මම යෝජනා කරනවා අපි හාරදීලා තිබ්බා යෝජනාව සම්පූර්ණයෙන්ම විවාදයට ලක්වෙලා ඉවරයි. දෙපැත්තෙන්ම කථා කරා. ඇත්තෙන්ම ලොකු එකඟතාවයන් තියෙනවා. එදා 9 වෙනිදා ගිහිල්ලා පහර දුන්න එකට අප්‍රසාදය තියෙනවා. ඒ වගේම එදා රෑ ගිහිල්ලා නගර සභාවට පහරදීලා ගිනි තැබීම සම්බන්ධව අප්‍රසාදය තියෙනවා. ඉතින් ඒක දෙපැත්තෙන්ම කථා කරා. ඒනිසා මම හිතනවා මෙතනින් එහාට මේ යෝජනාව ගන්න දෙයක් නැහැ. අපි මෙතනින් එහාට මේ යෝජනාවට ඡන්දය විමසීමක් කරමු.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒක මේ අවස්ථාවේ කරන්න පුලුවන් දෙයක් නෙමෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ අවස්ථාවේදි ඡන්ද විමසීමක් කරන්න මේ අයිතමය යටතේ බැහැ. පළාත් සභාව නියෝජනය කරපු කෙනෙක් විදියට ඔබතුමා දන්නවානේ මට වැඩිය හොදට. යෝජනාවක් ඉදිරිපත්ව වුනේ නැහැ. අදහස් ඉදිරිපත් වුනා යෝජනාවක් ඉදිරිපත් වුනේ නැහැ ඡන්දය විමසන්න.

(සභා ඝෝෂා)

**03 (30)** <u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් මේ සභාවේ ආයාචනා හා පෙත්සම් අයිතමය යටතේ අඩකට වඩා මන්ත්‍රීවරු කථා කරලා තියෙනවා. පැය 5කට ආසන්න කාලයක් ඒ සම්බන්ධව කථා කරලා තියෙනවා. ඒනිසා මමත් එක කරුණක් ඉදිරිපත් කරමින් මීලග අයිතමයට යනවා. පලමුවෙන්ම මම මේ අවස්ථාවේ සුභ පතනවා ගරු නාගරික මන්ත්‍රී රන්දු විජේසූරිය මැතිතුමාට. එතුමාගේ උපන් දිනය සමරන මේ වෙලාවේ ඔහුට සුහම සුභ උපන් දිනයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම නිදුක් නිරෝගි ජීවිතයක් ගතකරන්න වාසනාව ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ මගේ අදහසකට අනුව මේ අවස්ථාවේදි මම ප්‍රකාශ කිරිමක් කරන්නේ අපි රටක් වශයෙන් ඉතාම අසිරු මොහොතකට පත්ව සිටින මේ අවධියේ ජාති භේදයෙන්, පක්ෂ භේදයෙන්, ආගම් වාදයෙන් තොරව අප රට මුහුණපා සිටින මේ අවස්ථාවේ අපිද මොරටුවේ සමස්ථ ජනතාවට වගකියනු ලබන ජනතා නියෝජිතයෝ වශයෙන් වෙනදාටත් වඩා ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් තව තවත් කැපවීමකින් අපගේ සේවය වහා ඉටුකල යුතු යැයි මා විශ්වාස කරනවා. ඒ වගේම අපේ රට පත්වී තිබෙන අර්ථික අර්බුදයෙන් ගොඩයෑම සඳහා වැඩසටහන් නිර්මාණය කල යුතුය. ඒ සඳහා ඔබතුමන්ලාගේ වටිනා අදහස් යෝජනා අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම තවද, අප සියලුම නාගරික මන්ත්‍රීවරු සහා අප පක්ෂයේ සිටින මොරටුව බල ප්‍රදේශයේ සිටින මාහාචාර්යවරු, ආචාර්යවරුන්ගෙන් සමන්විත විද්වත් මණ්ඩලයක් ස්ථාපිත කර එම අයගේද දැනුම උපයෝගි කරගනිමින් අපි මේ අවධියේ වැටි තිබෙන ආර්ථික අර්බුදය හා ඉදිරියේදි ඇතිවිය හැකි යැයි කියන ආහාර හිගය මඟහරවා ගැනිමට ක්‍රමෝපායන් සකස් කර ඒ සඳහා විසඳුම් සෙවීම අපගේ යුතුකම හා වගකිම වි ඇත. ඒ සඳහා අපද අපගේ සේවක මහතුන් හා නිළධාරින්ද පලමුව ආදර්ශමත් සේවයක් ඉටුකරන බවට සමාජයට සනාථ කල යුතුය. උදාහරණයක් වශයෙන් තම වැඩ කොටස නිසි පරිදි ඉටු නොකරන සේවක මහතුන්ගේ ඔවුන්ගේ සේවය උපරිම වශයෙන් ලබා ගැනිමට

කටයුතු කිරිම සියලුම අංශවල කාර්යයන් විධිමත් කර උපරිම සේවයක් ලබාදිමට කටයුතු කරමු. උදාහරණ වශයෙන් සඳහන් කරන්න පුලුවන් විශේෂයෙන් අපිට ලබා දෙන සේවය තුල සභාවේ නිත්‍යානුකුල නොවන කිසිදු ගණුදෙනුවක් සිදුවිමට ඉඩ නොදිම, අල්ලස් ගැනිම, පගාව ගැනිම, කොමිස් ලබා ගැනිම වැනි ක්‍රියාවන් මුළුමනින්ම නතර කිරිම අපගේ යුතුකම හා වගකීම විය යුතුයි. එසේ නොකලහොත් තවදුරටත් මේ රට ගොඩගැනිමට අපිට අපහසුවනු ඇත. දේශපාලනය කරන ඔබ අප සැමදෙනාම ජනතාව විසින් ඇත්කරනු ලබන දවස වැඩි ඈතක නොවනු ඇත. එම තත්ත්වයන් මඟහරවා ගෙන කටයුතු කිරිම අපගේ යුතුකම හා වගකිම කරගෙන මෙම සමාජයට අපහසුතාවයන් මගහරවා ගැනිම අප සැමදෙනා එක්ව කටයුතු කරමු. යැයි මා ඉතා විශ්වාසයෙන් හා ගෞරවයෙන් යුතුව සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

## 04. <u>ප්‍රශ්න</u> :-

04(1) මහා නගර සභා මන්ත්‍රී, එම්. තිසර රසාංජන මැන්දිස් මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න සභාවට ඉදිරිපත් කරන ලදි.

මොරටුව මහා නගර සභා බල ප්‍රදේශයක් වන මෝල්පේ ග්‍රාමයේ පිහිටි සිරිබරමැණිකේපුර ජනාවාසයෙත්, ඉඩම ග්‍රාමයේ පීරිස් මාවතේ පිහිටි බොල්ගොඩසිරිපුර ජනාවාසයෙත් ඇති බොහෝමයක් ඉඩම් කැබලි මොරටුව මහා නගර සභාවේ හිමිකම යටතට එකවිට ක්‍රියාත්මක වූ බිම් සවිය ව්‍යාපෘතිය යටතේ පත්කර ඇති හෙයින්, එම ජනාවාස දෙකෙහිම බිම් කැබලි කොපමණ සංඛ්‍යාවකට මොරටුව මහා නගර සභාව හිමිකම පැවේද යන්න බිම් සවිය ව්‍යාපෘතිය යටතේ පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක, කලාප අංක හා බිම් කැබලි අංක ලෙස සකස් කර ඇති ලැයිස්තුවක් මෙම ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

04 (2) 2019 පෙබරවාරි මස 07 වන දින මෙම ගරු සභාවේ මාසික රැස්වීමේදී, ගරු නගරාධිපතිතුමාගේ නිර්දේශය මත මුදල් කමිටුවෙන් අනුමත කර තිබූ පරිදි " සභාව සතු ඉඩම් මුදල් කමිටුවෙන් අනුමත කර තිබූ පරිදි " සභාව සතු ඉඩම් වල වසර ගණනාවක සිට පදිංචිව සිටින පදිංචිකරුවන් වෙත අදාල ඔප්පු ලබාදීමටත්, එසේ ලබාදීමේදී වර්තමාන තක්සේරු අනුව 1 % ක මුදලක් ඉඩම් ලාභීන්ගෙන් සභාව වෙත අයකර ගැනීමටත්, මෙම ගරු සභාව අනුමැතීය ලබාදුන් අතර, එම කටයුත්ත කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම ගරු නාගරික කොමසාරිස්තුමා වෙත පැවරීමටත් තීරණය කරන ලදී. ඒ අනුව, සිරිබරමැණිකේපුර ජනාවාසයෙත්, බොල්ගොඩසිරිපුර ජනාවාසයෙත් ඉහත සඳහන් කළ කැඩැස්තර සිතියම්වල සඳහන් බිම් කැබලි අංක අනුපිළිවෙලට අදාළ ඉඩම්වල හිමිකම, මොරටුව නගර සභාව විසින් ලබාදුන් පුද්ගලයින්ට අදාලව පහත දැක්වෙන විස්තර මෙම සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට ගරු කොමසාරිස්තුමාගෙන් ඉල්ලා සිටිමි.

1. බිම් කැබලි අංකය
2. ඉඩමේ ප්‍රමාණය (පර්චස්)
3. හිමිකම පවරා දුන් අයගේ නම හා ලිපිනය
4. සභාව වෙත බිම් කැබලි සඳහා අය කර ගත් මුදල් ප්‍රමාණයන්
5. හිමිකම පවරා දුන් දිනය
6. සභාව විසින් අය කර ගත් මුදල් සඳහා සභාව විසින් නිකුත් කරන ලද කුවිතාන්සිවල අංක සහ දිනයන්
7. එම මුදල් කුමන බැංකුවක, කුමන බැංකු ගිණුමක් යටතේ තැන්පත් කර ඇති ද වග

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ලබන සභාවේ දී ඒ සඳහා පිළිතුරු ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

## 05 <u>යෝජනා</u> :-

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, "ඌ"වගන්තිය යටතේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, නියමානුකූලව කිසිදු යෝජනාවක් ඉදිරිපත් කර නොමැති නිසා මෙය න්‍යාය පත්‍රයේ සඳහන් වෙලා නැහැ. "ඌ" වගන්තිය යටතේ යෝජනා දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අවස්ථාවේදි ඔබතුමාත් කථා කරා නිශාන්ත මන්ත්‍රිතුමාත් කථා කරා. හැමදෙනාම ඒකට අදාලව විශාල වශයෙන් කරුණු කාරණා පැය 5කට ආසන්න කාලයක් සිදුවුන බව අපි සැමදෙනාම පිළිගන්නවා. උදාහරණ වශයෙන් ගත්තාම මේ අවස්ථාවේ අපිට කරුණු කාරණා ගොඩක් තියෙනවා. විශේෂයෙන්ම නගර සභාව මේ අවස්ථාවේදි නියෝජනය කරන මන්ත්‍රිවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව අපි හැමදෙනාම මේ අවස්ථාවේ කටයුතු කරා. මොකද මේ වර්තමාන තත්ත්වයත් එක්ක.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ යෝජනාව දිහා මොරටුවේ මිනිස්සු බලාගෙන ඉන්නවා.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ සේනක මන්ත්‍රිතුමා ප්‍රමුඛ අට දෙනෙක් අත්සන් කරලා තියෙන යෝජනවා මේ සභාවේ ඇත්තටම මේ වෙලාවේ නොගෙන අපි ලබන සභාවේදි ගමු. මොකද මේ අවස්ථාවේ නගරාධිපතිතුමා මේ සභාවේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, සභාවට යෝජනාව ගෙනල්ලා තමුන්නාන්සේලා ඕනනම් ඡන්දයක් විමසන්න, ඒක ගන්නවාද නැද්ද කියන එක බලන්න.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, ඡන්දය විමසන්නේ විවාදයකට ලක්කරලා, න්‍යාය පත්‍රයට ඇතුලත් වෙන්න ඕන කරුණුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, විවාදය මන්ත්‍රිවරු කිහිපදෙනෙක්ට සීමා කරලා කරමු. වේලාව තිරණය කරලා.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, මේ සම්බන්ධයෙන් මේ යෝජනාව ගෙනල්ලා කරුණු කාරණා ඉදිරිපත් කරලා වාද විවාද වෙලා මේ කරුණු කාරණා මේ සභාවෙන් එළියට ගියාම. තමුන්නාන්සේලා දන්නවා මන්ත්‍රිවරු කිහිපදෙනෙක් අගතියට පත්වුනා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ යෝජනාව සාධාරණ යෝජනාවක්. මේකේ තියෙන්නේ එදා වෙච්ච සිද්ධියට අප්‍රසාදය පලකරලා

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, අගතියට පත්විමක් සිදුවුවහොත් මේ අවස්ථාවේ බලධාරියා වශයෙන් ඉදිරියේදි ඒ ප්‍රශ්ණ වලට මුහුණ දෙන්න සිදුවෙනවා. ඒනිසා කියන්න බැහැ. අපිට සඳහන් කරන්න බැහැ නියත වශයෙන්ම අදහස් ඉදිරිපත් කරලා යම් වැරදි අදහසක් ඉදිරිපත් වුනොත් ඒකේ වගකිම මට භාරගන්න

වෙනවා. මට මේ අවස්ථාවේ බලධාරියා වශයෙන්, ඒ වගේම ගරු මන්ත්‍රීතුමා අපි මෙය පළාත් සභාවේ නීති නිලධාරීගෙන් උපදෙස් ගත්තා පුද්ගලිකව කථා කරා. එතුමා පැවසුවා නඩු නිමිත්තක් යන නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, නඩුව මේකට අදාල නැහැ. නඩුව යන්නේ කොටුව උසාවියේ, අපි මේ කථා කරන්නේ මොරටුව මේ ස්ථානයේ මේ භූමිය තුල සිදුවුන සිද්ධියක් ගැන එකේ අප්‍රසාදය අපි පලකරන්නේ. ඒක නිසා නඩුවට මේක අදාල වෙන්නේ නැහැ.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබතුමා කියන එක මම පිළිගන්නවා. මේ කරුණු කාරණා දෙපාර්ශවය විසින් සාකච්ඡාවට ලක්කිරීම තුලින් මොනවාහරි අනවශ්‍ය කරුණු මතුවෙලා වාර්තා ගතවෙලා මාධ්‍යයට ගිහිල්ලා පත්තරවල ගියාම මේක ඇත්තටම අපි සභාවක් වශයෙන් අපි මන්ත්‍රීවරු පොඩ්ඩක් කල්පනා කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, යෝජනාව ගන්නවාද නැද්ද කියන එක ඔබතුමා තීරණය කරන්න. ඔබතුමා තීරණය කරනවා නම් මේ යෝජනාවට අදාල කාරණා මේ සභාවේ බොහෝ දීර්ඝ කාලයක් සාකච්ඡා කලා ඒනිසා යෝජනාව ගන්න ඕන නැහැ කියලා එක ඔබතුමාගේ තීරණය. බලපෑම් වලට යටවෙන්න ඕන නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමා මේ වෙලාවේ අසරණ වෙලා ඉන්නේ, ඒක පැහැදිලියි. මොකද හේතුව ඔබතුමාට උවමනාව තියෙනවා ඕක ඉදිරිපත් කරන්න සහ ලොකු බලපෑමක් තියෙනවා ඔබතුමාට මේක ඉදිරිපත් නොකර ඉන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මෙතුමා ඔබතුමාට බරපතල චෝදනාවක් කරන්නේ ඔබතුමා අසරණ වෙලාලු, ඔබතුමාට උවමනාව තියෙනවාලු යෝජනාව ඉදිරිපත් කරන්න මහා බරපතල චෝදනාවක් කරන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ගොනා හැරෙන කොට පොල් පැලයද කන්නේ තණකොල පැලයද කන්නේ කියලා පැහැදිලියි. ඒනිසා ඔය යෝජනාව තියෙන්නේ ලක්ෂ දෙකයි විස්සකට වෙච්ච අසාධාරණය සම්බන්ධයෙන් මානව හිමිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන්. ඔය යෝජනාව සම්බන්ධයෙන් මෙතන කථා වුනේ නැහැ. ඔය යෝජනාව සම්බන්ධයෙන් අපි කථා කරන්නම් හෙට එළිවෙනකම්, ඒක ප්‍රශ්ණයක් නැහැ. හැබැයි, ඔහොම ගියොත් ගරු වැඩබලන නගරාධිපතිතුමා එක පුද්ගලයෙක් නිසා මේ මොරටුවේ ඉන්න ලක්ෂ දෙකයි විස්සක ජනතාවට කරන අසාධාරණයක්. ඒනිසා අපි කියන්නේ මේකයි, ඔය යෝජනාව තියෙන්නේ සමන්ලාල් ප්‍රනාන්දු ඉල්ලා අස්වෙන්න කියලා යෝජනාවෙන් කියන්නේ, ඒ යෝජනාව ඔබතුමාට පුලුවන් ඔබතුමා තීරණය කරනවා නම් මෙහි තියෙන කරුණු සාකච්ඡාවෙලා තියෙනවා, තවදුරටත් මේක සාකච්ඡා කරන්න දෙයක් නැහැ, එහෙනම් අපි බෙදීමකට යමු කියලා තීන්දුවක් ගන්න පුලුවන් ඔබතුමාට. ඒනිසා අපිට ඔය යෝජනාව දිනනවා ද පරදිනවා ද කියන ප්‍රශ්ණයක් නැහැ. අපිට ඔබතුමා කියන එක අපි පිළිගන්නවා. මොරටුවේ මිනිස්සු බලාගෙන ඉන්නවා ඔබතුමා කියන එක. මොරටුවේ මිනිස්සු බලාගෙන ඉන්නවා. තවදුරටත් මේ හොරකමට, තවදුරටත් මේ වංචාවට, තවදුරටත් මේ අනීතික පාලනයට ඉඩ දෙන්නේ කවුද කියලා බලාගෙන ඉන්නවා මොරටුවේ ජනතාව.ඔබතුමා කියන එක හරි හැම මන්ත්‍රී කෙනෙක්ම ආරක්ෂා කරන්න ඔබතුමාට වගකීමක් තියෙනවා. අපි එක පිළිගන්නවා. මේකේ බෙදීමක් ගත්තොත් මිනිස්සුන්ට පැහැදිලියි චිත්‍රය කවුද මේකට ආදරය කරන්නේ කවුද මේකට ආදරය කරන්නේ නැත්තේ කියලා. ඒනිසා අපිට ගැටලුවක් නැහැ ගරු වැඩ බලන නගරාධිපතිතුමා අපි කියන්නේ මේකයි, අපි යෝජනාවක් දාලා තියෙනවා අපි දාලා තියෙන්නේ අපේ අදහස නෙමෙයි. මොරටුවේ සමස්ථ ජනතාවගේ

අදහස. ඒනිසා තවදුරටත් අපි කියන්නේ නගරාධිපතිවරයාට සාධාවාරාත්මක අයිතියක් නැහැ ඔය පුටුවේ ඇවිල්ලා වාඩිවෙන්න. එකයි අපි කියන්නේ.

වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබතුමාලා කියන පරිදි නගරාධිපතිවරයා ඉල්ලා අස්විය යුතුනම් එතුමාටත් මානව අයිතියක් තියෙනවා එතුමාගේ අයිතිවාසිකම් උල්ලංඝණය නොවන ආකාරයට මෙතනට පැමිණි අවස්ථාවක එතුමා ඉල්ලා අස්වෙන්න. මේ අවස්ථාවේ එතුමා බන්ධනාගාර ගතවෙලා ඉන්න නිසා ඒ කරුණ අපි සැලකිල්ලට ගෙන

(සභා ඝෝෂා)

මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම කියන්නේ දැන් අපිට මේ වෙලාවේ මේ සභාවේ ව්‍යවස්ථාවක් තිබෙනවා, මහා නගර සභා ආඥා පනත තියෙනවා, අතුරු ව්‍යවස්ථාව තියෙනවා, මහජන නියෝජිතයෝ හැමවිට ම ඒ නීති රාමුව ඇතුලේ තමයි කටයුතු කරන්නේ. එතකොට අපි උත්සාහ කරනවා නීති රාමුවෙන් පිට නොගිහින් කොහොමද මේ නීති රාමුව යටතේ අපේ රාජකාරිය කරන්නේ දැන් අපි උදේ ඉදලා ගත්තාම අපේ න්‍යාය පත්‍රයට අනුගතවෙමින් නෙමෙයි මේ පෙත්සම් අයිතමය යටතේ විශාල ලෙස විවාදයක් ගියේ. පෙත්සම් අයිතමය යටතේ විවාද කරන්න බැහැ. නමුත්, ඒක කලා ඒක නීත්‍යානුකූල නැහැ. අනෙක් එක ඒ විවාදය ඇතුලේ ඉතාම සංකීර්ණ කථාවක් කථා වුනා. ඒ කාරණාව බොහෝ කරුණු කාරණා නීතිය පිළිබද ප්‍රශ්ණත් මතු වුනා. නීතිමය කටයුතුත් කරන්න සිදුවීම ඒ ගැටලුවක් ඔබතුමාට නැහැ. දැන් ඔබතුමාට මේ ගැටලුව තියෙන්නේ මේ යෝජනාවට ඡන්දය විමසීම පිළිබද ප්‍රශ්ණයකට ප්‍රජාතන්ත්‍රවාදයට අනුව ගරු වැඩ බලන නගරාධිපතිතුමනි අපි හැසිරවිය යුතු වෙලාවක්. ඉතාම හොදින් හැසිරෙන්න ඕන වෙලාව මේක. ප්‍රජාතන්ත්‍රවාදයට ගරු නොකරන්න ගිහිල්ලා තමයි මේ මහා විනාශයන් සිද්ධ වෙන්නේ. ඒනිසා මන්ත්‍රීවරුන්ගේ අයිතියක් යෝජනාව භාරදුන්නා. ඔබ යෝජනාව භාරගත්තා. එතකොට ඒ යෝජනාවට අදාල කරුණු කාරණා ඊට පෙර විවාදයකට ලක්වුනා. ඕනනම් ඔබතුමාට පුලුවන් අපේ සමන්ලාල් නගරාධිපතිතුමා වගේ ඉවරයි ඉවරයි ඉවරයි කියලා කියන්න. හැබැයි ඒක නෙමෙයි ඉතාම ගෞරවයෙන් ඔබෙන් ඉල්ලනවා දැන් තමන්ට වාසි අවාසි තත්ත්වය හොයන්න එපා. තමන් මුහුණදෙන අපහසුතාවය එහෙම හිතන්න එපා. දැන් මේක ප්‍රජාතන්ත්‍රවාදයට අනුව මන්ත්‍රීවරයෙක් යෝජනාව භාරදුන්නා නෛතිකයි. නීතිමය පදනමින් යෝජනාව දැන් බෙදීමක් ඉල්ලනවා ඡන්ද විමසීමක් කරන්න.

මහ නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, තැටිය රත්වුන වෙලාවේ රොටිය පුච්ච ගැනීම මේගොල්ලන්ගේ අවශ්‍යතාවයක් තමයි. ඒගොල්ලො ඒක බලාපොරොත්තු වෙනවා තැටිය රත්වුනාම රොටිය පුච්ච ගන්න. ඒ වුනාට ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ අවස්ථාවේ රටේ තියෙන තත්ත්වයත් එක්ක අගතියට පත්වෙච්ච මන්ත්‍රීවරු ඉන්නේ ආණ්ඩු පක්ෂයේ පාරේ බැහැලා යන්න බැහැ. පෙට්‍රල් පෝලිමට ගිහිල්ලා අපිට පෙට්‍රල් ටිකක් ගහන්න බැහැ. ගෑස් පෝලිමේ ගිහිල්ලා අපිට ගෑස් ටිකක් ගන්න බැහැ.

(සභා ඝෝෂා)

වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා, ඔබතුමාට වර්තමාන තත්ත්වය පිළිබද මනා අවබෝධයක් තියෙනවා. එතුමා කිව්වා තාම ගිනිදැල් තියෙනවා කියලා. ඇත්ත ඒක අපි පිලිගන්නවා. මේ ගිනිදැල් තියෙන අවදියේ මේ යෝජනාව ගෙනල්ලා මේ නගරාධිපතිවරයා කියන්නේ මේ සිද්ධියට අදාල ප්‍රධාන කරුණක් වෙලා තියෙන්නේ. ඉතින් එතුමා පිළිබදව යෝජනාවක් ගෙනල්ලා ඡන්ද විමසීමක් කරා මේගොල්ලො පක්ෂව දුන්නා. මෙයාට විරුද්ධව දුන්නා කියලා කරුණු මතවාද සමාජය තුල සමාජ ගතවෙලා ෆේස්බුක් වෙබ් අඩවියෙන් ගිහිල්ලා මන්ත්‍රීවරුන්ගේ නම් සදහන් කරලා අගතියක් වුනොත්

(සභා ඝෝෂා)

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මිනිස්සු අමාරුවේ දාපු කෙනා අමාරුවේ වැටුනාට කමක් නැහැ.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ යෝජනාව බැහැර කරන්නේ නැහැ. එය නියමානුකූලව සභාවට ගන්න අපි නාගරික ලේකම්තුමාට ඒක භාරදිලා තියෙනවා. ඒනිසා ඔබතුමන්ලා මේ අවස්ථාවේ සභාව කරගෙන යන්න මේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සැලකිල්ලට අරගෙන පොඩ්ඩක් මේ අවස්ථාවේ උදව් කරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමා ඔය වැරදි කිරීමක් කරන්නේ සභාවට "ඌ" වගන්තිය යටතේ යෝජනාවක් ඉදිරිපත් වුණාම ඒක එවෙලේ යෝජනාවට ගන්නවා මිසක්, ඒක ඊලග න්‍යාය පත්‍රයට දාන්න කියලා බැහැ නගරාධිපතිතුමා. එහෙම දෙනවා නම්, යෝජක මන්ත්‍රීවරයාට කියන්න ඕන ඒක වෙනම ඉදිරිපත් කරන්න කියලා ලේකම්තුමාට. ඒනිසා ඔබතුමාට බැහැ "ඌ" වගන්තිය යටතේ ඉදිරිපත් කළ යෝජනාවක් ඊලග මහා සභාවට දාන්න. අපි කියන්නේ මෙය ඔබතුමාට කිසි ගැටලුවක් නැහැ මෙය ඡන්ද විමසීමකට යන්න. අපි ඕනනම් තර්ක කරන්නේ නැතිව ඉන්නම් කාලය නාස්ති වුණා කියලා හිතනවානම්.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම ඉල්ලන්නේ මේ වෙලාවේ ඔබතුමන්ලාගෙන් මේ යෝජනාවට ඡන්ද විමසීමකට යෑමේදි මන්ත්‍රීවරුන්ගේ තියෙන ආරක්ෂාව නැතිවෙලා අගතියකට පත්වුනොත් මේ අවස්ථාවේ මගේ වගකීම පැහැර හැරියා වෙනවා. මේවා විවාදයට ලක්වෙනකොට මේවා මාධ්‍යයෙන් ගිහිල්ලා එහෙම නැත්නම් මේවා වාර්තා ගතවෙලා. ඔසඳ මන්ත්‍රීතුමාට විරුද්ධව ෆේස්බුක් එකේ යනවා ඊලග ප්‍රහාරය දෙන්න ඕන මෙයාට. මදි කිව්වා ගැහුවා. ඉතින් ඔය වගේ දේවල් සිදුවුනොත් මන්ත්‍රීවරු වශයෙන පොඩි කැපකිරීමක් කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, සමන්ලාල් නගරාධිපතිතුමා මේ සභාවේ ඉන්න 400ක් ගැන එහෙම හිතුවේ නැහැ. ඒ අය බිල්ලට දිලයි අරගෙන ගියේ. ඒ ගියායින් පස්සේ මොරටුවේ ජනතාවගේ දෛනික රාජකාරි ඇණ හිටියා සුමාන දෙකක් යනකම්. ජනතාවගේ කුණු අදින්න බැරිව ගියා. ප්‍රශ්ණ ගොඩනැගුණා. මේකට අපි හැන්ගෙන්න හදනවානම් අපි වැරිදිනේ යථාර්ථයට මුහුණ දෙමු. අපි විවාද කළේ උදේ ඉදලාම තමුන්නාන්සේලත් කළේ එකදේ, අපිත් කරේ එකදේ, ඇයි තමුන්නාන්සේලා දැන් විරුද්ධ වෙන්නේ, ඒකට පක්ෂව දෙන්න පුලුවන්නේ එක පුද්ගලයෙක් ආරක්ෂා කරන්න යන්න එපා මොරටුවේ ලක්ෂ ගාණක් ජනතාව බලාගෙන ඉන්නවා. අපිටත් ගෙවල්ව ලට යන්න බැහැ මිනිස්සු බලාගෙන ඉන්නවා අපි මොකක්ද කරේ කියලා.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි ඔබතුමන්ට ගරු කරනවා ඔබතුමන්ගේ අදහස්වලට ගරු කරනවා. මම මේ වෙලාවේ එක පුද්ගලයෙක්ගේ ආරක්ෂාව නෙමෙයි කල්පනා කරන්නේ, මේ සියලු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව කල්පනා කරන්නේ. දෙපැත්තේම අයගේ මේ යෝජනා ඉදිරිපත් කරලා පක්ෂව විපක්ෂව ඡන්දය පාවිච්චි කිරීමෙන් ගැටලු ඇතිවෙන්න පුළුවන්. අන්න ඒක අවබෝධ කරගෙන අපි ඊළග සභාවට මේක දාමු. මොකද මගේ නියෝගයක් අනුව මේක කරන්න පුළුවන්. සුහදත්වය වර්ධනය කරගෙන ඔබතුමන්ලාගෙත් ගෞරවය ආරක්ෂා කරගෙන යන්න ඕන නිසා තමයි මම මේ ඉල්ලීම කරන්නේ. ඒනිසා, ගරු ලේකම්තුමාට යොමු කරලා තියෙනවා ඊළග සභාවට ගන්න.

(සභා ඝෝෂා)

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබතුමා ප්‍රකාශයක් කරන්න මේ යෝජනාව ගන්නවාද ප්‍රතික්ෂේප කරනවාද කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මෙය ඔබතුමා කරනු ලබන බරපතල වරදක් බවට මෙය පත්වෙනවා පනතේ කිසිම ඉඩක් නැහැ.

(සභා ඝෝෂා)

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, එතුමාගේ ක්‍රියා කලාපය අනුව එතුමා තවදුරටත් මොරටුව නගරයේ ප්‍රධාන පුරවැසියා වීම සුදුසු නැහැ. ඒකයි අපි මෙතන කියන්නේ. අපි දාපු යෝජනාව ඔබතුමා ඉදිරිපත් කරන්න. එතුමා තවදුරටත් මේ කරලා තියෙන ක්‍රියාකලාපය නිසා අනීතික කටයුතු නිසා තවදුරටත් මොරටුවේ ප්‍රධාන පුරවැසියා වීම සම්බන්ධයෙන් අපේ අප්‍රසාදය තියෙනවා. ජනතාවගේ අදහස් මෙතන කථා කරන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි ගුටිකාලා, අපේ දරුවෝ ගුටිකාලා මේ ඉන්න වේලාවක ඔබතුමිය ෆේස්බුක් ලයිව් තියාගන්න එපා.

(සභා ඝෝෂා)

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ සභාවේ නිත්‍යානුකූලතාවයක් නැහැ. කිසිම කෙනෙකුට ෆේස්බුක් ලයිව් එකක් දෙන්න. ඒක නිසා කවුරු කළත් ඒක වැරදියි. හැබැයි, මාධ්‍යය මෙතන ඉන්නවා. මේකේ දැන් අපේ ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා කිව්වා මම ඇතුලේ ඉන්නකොට අපිව ආරක්ෂා කරන්න දැගලුවා කියලා. හැබැයි, මෙතන මේ සිද්ධි දෙකක් වැරදිකරුද, නිවැරදිකරුද කියලා පැහැදිලියි. රූපවාහිනිය බැලුවාම සමන්ලාල් ප්‍රනාන්දු මෙය විනාශ කරා කියලා හැමෝම දන්නවා. ඒ නිසා ඔය යෝජනාව ගන්නවාද නැද්ද කියලා ඔබතුමා කියන්න.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ අවසන් නිවේදනය ගරු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සියලු දෙනාගේ ආරක්ෂාවන් පිළිබඳ සලකලා බලලා මම මේ යෝජනාව ඊළඟ සභා වාරයට නියමානුකූලව ඉදිරිපත් කරන්න කියලා කියනවා.

(සභා ඝෝෂා)

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මේ වෙනකොටත් සමහර මන්ත්‍රීවරුන්ට සමාජ ජාලා මාධ්‍යය ඔස්සේ තර්ජන එනවා. ඔසඳ මන්ත්‍රීතුමාටත් එනවා. මෙතන ප්‍රශ්ණයක් නැහැ ගරු වැඩ බලන නගරාධිපතිතුමනි. ඔතන සමන්ලාල් ප්‍රනාන්දු මූලාසනයේ ඉන්නවා නම් තවදුරටත් ආණ්ඩු පක්ෂයේ ඉන්න එක මගේ එකක්. නමුත්, හැම මන්ත්‍රී කෙනෙකුටම ඒ තිරණය ගන්න බැහැ. ඒ නිසා මෙතන මේ වෙන්නේ දේශපාලන දඩයමකට අවශ්‍ය කරන විදියට පොට පාදනවා. විපක්ෂය දැනුවත්ව හෝ නොදැනුවත්ව සමහර මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රශ්ණ කරනවා. මම කොන්ද කෙලින් තියාගෙන ඔබතුමා හෙට

දවසේ ඔතන හිටියත්, මෙතන ඕනම කෙනෙක් ඔය පුටුවේ හිටියොත් මම මගේ කණ්ඩායම විදියට රකිනවා. මම ඒ වෙනුවෙන් කටයුතු කරනවා. නගරාධිපතිතුමා සමන්ලාල් ඔතන හිටියොත් මම ඒ තිරණය ගන්නවා. මම තවදුරටත් ආණ්ඩු පක්ෂයේ ඉන්නේ නැහැ කියලා ඒක මගේ තිරණය. මේ මිනිස්සුන්ට එ තිරණය ගන්න බැරිවෙයි. එහෙම මේ මිනිස්සුන්ගේ ජීවිත දේපල නැවත වතාවක් අවධානමට ලක්කරලා මේ විදියේ යෝජනා ගේන්න එපා.

( සභා ඝෝෂා)

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සවුන්ඩ් සිස්ටම් එකට රු.137,000.00ක් ගෙවනවා. කාලේ ගතවුනොත් අපිට ඊළග දවසෙත් ගන්න වෙනවා.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබතුමාලාට අවස්ථාව තියෙනවා මීළග සභා වාරයට නියමානුකූලව ගෙන ඒමට යටත්ව මේ යෝජනා මේ සභාවේදි ගන්නේ නැහැ කියලා සඳහන් කරනවා. ‘‘ඌ’’ වගන්තිය යටතේ ඇති අනෙක් යෝජනාවත් තියෙනවා මන්ත්‍රීවරු 4 දෙනෙක් අත්සන් කරපු. මෙම යෝජනා නියමානුකූලව මීළග සභාවට ඉදිරිපත් කරන්න.

## 06 <u>2022 මැයි මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.</u>

### 06(01) 2022.05.24 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ ප්‍රශ්නයක් තියෙනවා. සේවකයෝ 400ක් ගියා. ඒ සේවකයෝ 400න් සේවකයෝ හැත්ත ගාණක් ඇඟිල්ල තියලා ගිහිල්ලා. එතකොට අපිට තියෙන ගැටලුව ගරු නගරාධිපතිතුමා, මිට ඉස්සෙල්ලා මේ නගර සභාවේ කොමසාරිස්වරයා මීට ඉස්සරවෙලා කවුරු හරි ඇඟිල්ල තියලා කොහේ හරි ගිහිල්ලා තියෙනවා නම්, චෙක් කරනකොට හිටියේ නැත්නම්, සේවය හැරගියා සේ ලියුම් ගහනවා. හැබැයි, නගරාධිපතිවරයා එක්කගෙන ගිය මේ පිරිස ඇඟිල්ල තියලා ගිහිල්ලා තියෙද්දි 70 ගාණක් ඉන්නවා කියලා ඔඩිට් එක ගෙඩි පිටින් වාර්තා කරද්දි දැන් මේ පිරිස වැඩියි කියලා මේකට නොපේ 4ක් කපන්න තින්දු කරලා තියෙනවා. ඒකට කොමසාරිස්වරයා දෙන පිළිතුර ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා කියලා තියෙනවාලු පරිපාලන කටයුතු කරගෙන යාමට නොහැකියි කියලා ඉන්ටඩික් කලොත් එහෙම. ඔබතුමා අපිට කියන්න මීට පස්සේ සේවකයෝ වැරදි කරනකොට සාමුහිකව වැරදි කරාම ප්‍රශ්නයක් නැහැ. මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා කියනවානේ මේකේ පරිපාලනය කරන්න බැහැ කියලා ඒ නිසා සාමුහිකව කරාට කමක් නැද්ද? ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සහ බස්නාහිර පළාත් විනිය නීති මාලාව අනුව විනය කාර්යය පටිපාටිය අනුව පැහැදිලිවම පැය 24ක් නොදන්වා සේවයට වාර්තා කර තිබ්බේ නැත්නම් ඒ සේවකයාව සේවය හැරගිය සේවකයෙක් ලෙස සලකන්න ඕන. 9 වෙනිදා උදේ අත්සන් කරනවා 9 හා 10 කර්ෆියු දාලා තියෙනවා. 12 වෙනිදා උදේ වෙනකොට අත්සන් කරන්න ඕන හරිනම්. හැබැයි 12 වෙනිදා අත්සන් නොකරපු පිරිසක් ඉන්නවා. ඒකට නොපේ එකක් දැම්මාට ප්‍රශ්නයක් නැහැ. හැබැයි 12 වෙනිදා අත්සන් නොකරපු අයට මොකක්ද ගන්න තින්දුව. ඊට පස්සේ ගරු නගරාධිපතිතුමා සතියක් වැඩට ආපු නැති අය ඉන්නවා. ඊට පස්සේ සති දෙකක් දවස් 22ක් වැඩට එන්නේ නැතිව ඉන්නවා. කට්ටිය එහෙම උදව්යට ගන්න තින්දුව මොකක්ද? අපි කියන්නේ මේකයි, මේ ගන්න තීන්දුව මොකක්ද කියලා අපිට ගැටලුවක් නැහැ. හැබැයි, අපි කියන්නේ එක දෙයයි මේ ගන්න තීන්දුව තමයි මින් ඉදිරියට නගර සභාවේ සේවකයන්ට බෙදන්න ඕන. ඒහැන්දෙන් මින් ඉදිරියට නගර සභාවේ සේවකයන්ට ඇඟිල්ල ගහලා එළියට ගිහිල්ලා හිටියාම නොපේ කපනවා මිසක් වැඩ තහනම් කිරිම් බැහැ. පැය විසිහතරකට වඩා ඇවිල්ලා නැත්නම් මේ ගන්න තින්දුවම තමයි ගන්න ඕන ආපහු ගන්න බැහැ. හැබැයි ගරු නගරධිපතිතුමා, ලස්සනම වැඩේ කියන්නේ 9වෙනිදා ඉදලා 31 වෙනිදා දක්වා වැඩට ආපු නැති අය ඉන්න විට ඒ මිනිස්සුන්ට මුකුත් නැහැ. හැබැයි හත්වලාමේ අර අහිංසක සේවකයෝ තුන්දෙනෙක් විතර 25, 26 වැඩට ආවේ නැහැ කියලා සේවය හැර ගියා සේ ලියුම් ගහනවා. මම අහන්නේ මොකක්ද මේ නගර සභාවේ තියෙන නිතිය. මේ නගර සභාවේ

හැදි දෙකක් තුනක් තියෙනවාද? දවස් දෙකක් වැඩට ආවේ නැත්නම් සේවය හැරගියා සේ තනතුරු හැරගියා සේ ලිපිය ගහනවා. දවස් ගණනාවක් වැඩට ආවේ නැති අයට මුකුත් නැහැ. ඒගොල්ලන්ට මේල් දානවා ඔයා වැඩට එන්න, නැත්නම් ඔයාව ඉන්ටර්ඩික් කරන්න වෙනවා කියලා. මෙයද සාධාරණත්වය ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, ගෞරවයෙන් ඉල්ලන්නේ කරනවානම් දෙයක් හරියට කරන්න. සමහර සේවකයෝ ඉන්නවා නගරාධිපතිව අඳුරන්නේ නැහැ පෞද්ගලිකව. නියෝජ්‍ය නගරාධිපතිව පෞද්ගලිකව හඳුනන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ව පෞද්ගලිකව අඳුරන්නේ නැහැ. අනේ අහිංසක සේවකයෝ ඇඟිල්ල ගහලා කොහෙට හරි බෙහෙත් ගන්න ළමයාගේ ඉස්කෝලේට ගිහිල්ලා තිබ්බොත් ඔඩිට් එකෙන් චෙක් කරද්දී හිටියේ නැත්නම් ඉන්ටර්ඩික් කිරීමේ ලිපිය ගහනවා. සේවය ගන්න විදියක් නැහැ කොමසාරිස් ගාවට ගියාම කොමසාරිස්ව හම්බවෙන්න බැහැ.බැනලා එලවනවා. ඊට පස්සෙ වෙන වෙන වටේ ගිහිල්ලා අවසානේ ගෙදරම යනවා. මේකෙන් එහෙම ගිය සේවකයෝ අනන්ත අප්‍රමාණ ඉන්නවා කවුරුත් අඳුරන්නේ නැතිව වැඩක් කරගන්න විදියක් නැතිව එහෙම ගිය සේවකයෝ ඉන්නවා. එතකොට මේ ගන්න තීන්දු ඒ සේවකයන්ට වලංගු නැද්ද.ඒ සේවකයෝ අසරණයි. එනිසා අපි කියන්නේ අපිට සේවකයොත් එක්ක ප්‍රශ්න නැහැ. හැබැයි ගරු නගරාධිපතිතුමා හෙට දවසේ ඔබතුමා නගරාධිපති වුනත් හෙට දවසේ ප්‍රදීප් ශ්‍රියන්ත නගරාධිපති වුනත්, සේනක දමයන්ත හෙට දවසේ නගරාධිපතිවුනත් හෙට දවසේ වෙන කෙනෙක් නගරාධිපති වුනත්, මීට පස්සේ වත් අපි නවත්වන්න ඕන මේ සේවකයෝ ගෙනහිල්ලා තමන්ගේ හයිය පෙන්නන එක.එක නවතින්න ඕන.එක නවතින්නනම් සේවකයෝ දැනගන්න ඕන තම හිසට තම අතමය සෙවනැල්ල කියලා. අද සේවකයෝ යන්නේ මන්ත්‍රීවරුන්ට පාට් දාලා කුණුහරපෙන් බැනලා එවා අපිගාව තියෙනවා.ඒනිසා ගරු නගරාධිපතිතුමනි මේකට නිවැරදි විනය ක්‍රියාමාර්ගයක් ගන්නට ඕන.නිවැරදි විනය ක්‍රියාමාර්ගයක් ගන්නට ඕන.එහෙම ගත්තේ නැත්නම් අපි මේක අරගෙන යනවා මානව හිමිකම් කොමිසම් සභාවට අපි මේක පැහැදිලිව අරගෙන යනවා ආණ්ඩුකාරවරයාට, රාජ්‍ය සේවා කොමිසන් සභාවට. මේක අපි මෙතනින් නවත්වන්නේ නැහැ.අපිට ඕන කාගෙවත් රැකියා නැතිකරන්න නෙමෙයි. හැබැයි මේකට සාධාරණය ඉටුකරන්න මේ ගන්න තීන්දුව අනාගතයේ සියලු සේවකයන්ට බලපාන තීන්දුවක් වෙන්න ඕන.මේ ගන්න තීන්දුව අතීතයේ අසාධාරණයට ලක්වෙච්ච සේවකයන්ට අසාධාරණයක් නොවන තීන්දුවක් වෙන්න ඕන.ඒනිසා පත්වීම් බලධරයා හැටියට එහෙම නැත්නම් විනය බලධරයා හැටියට කොමසාරිස්වරයාට පුලුවන් මේකේ තීන්දුව මොකක්ද කියලා තීන්දු කරන්න.එක කොමසාරිස්වරයාගේ අයිතිය.හැබැයි කොමසාරිස්වරයාගේ අයිතිය නිසා තව කෙනෙක් තැලෙන්න බැහැ.අපි කියන්නේ එකයි.එනිසා ගරු නගරාධිපතිතුමා අපි කියන්නේ පැහැදිලිව මේ නීතිය මේ සේවකයෝ සියලු දෙනාටම එක හැන්දෙන් බෙදන්න ආපහු හැදි කිහිපයක් භාවිතා කරන්න එපා.මේ නමවෙනිදා වැඩේ පටන් අරගෙන විසිපස්වෙනිදා වෙනකම් යනවා කිසිම නීතියක් ක්‍රියාත්මක වෙන්නේ නැතිව. 25 අහිංසක සේවකයෝ තුන්දෙනෙක් අල්ලගෙන ගහනවා ලියුමක්. එ විතරක් නෙමෙයි තව දෙයක් අමතක වුනා කාණුවක් සුද්දකරේ නැහැ කියලා අවවාදකිරීමේ ලිපි ගහලා කාණුව සුද්දකරේ නැති එක වරදක්ද?එතකොට එවා වැරදි මේවා වැරදි නෙමෙයිද? මේවා මෙහෙන් ගිය එකේ වීඩියෝ තියෙනවා. අරලියගහ මන්දිරයේ ඇතුලට යනඑකේ වීඩියෝ තියෙනවා.අරලිය ගහමන්දිරයේ ඇතුලේ ගහපු වීඩියෝ තියෙනවා. එවා වැරදි නෙමෙයිද? එනිසා ගරු නගරාධිපතිතුමනි අපි කියන්නේ එක දෙයයි මේක මෙතනින් නවතින්න ඕන.කාටහරි කියන්න පුලුවන් අතීතයේ මේක සිද්ධවෙලා තියෙනවා එක නිසා මෙක දිගටම යනවා කියලා අතීතයේ හෝ කොහෙ හරි සිද්ධවෙලා තියෙන්න පුලුවන්. හැබැයි මේක කොහෙන් හරි නවතින්න ඕන.අද මේ අහිංසක සේවකයෝ අමාරුවෙ වැටිලා එක එක්කෙනාගේ ඕන එපාකම් ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා තමන් අමාරුවේ වැටිලා. එනිසා මම කියන්නේ මේක කොහෙන් හරි නවතින්න ඕන.මේක නවතින්න ක්‍රමවේදයක් ඔබතුමාවත් කරන්න. ඔබතුමා ඉතිහාසගතවෙයි ඒ තීන්දුව හරියට ගත්තොත් එහෙම.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මගේ අදහස් ප්‍රකාශ කිරීමේදිත් මේ ගැන සඳහන් කළා. නාගරික කොමසාරිස්තුමාට මම මේ වෙලාවේ කියනවා සභාවේ කටයුතු බාධාවක් නොවෙන ආකාරයට කටයුතු කරලා එයට අවශ්‍ය පියවර ගන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු වැඩබලන නගරාධිපතිතුමනි සුජිත් මන්ත්‍රීතුමා කියපු දේ සාධාරණයි. ඇත්තයි. මොකද 2009 සිට ඔබතුමාත් නියෝජ්‍ය නගරාධිපතිව හිටියා. අපි එවගේ රැලිවලට ගිහිල්ල තියෙනවා. සේනග අරගෙන ගිහිල්ලා තියෙනවා. ඔබතුමාටත් ඒ ශක්තිය තිබ්බා. අරගෙන ගියා. එ කාලෙත් වැරදි වැඩේ අපි කලා දැනුත් වැරදියි. අපේ සුජිත් මන්ත්‍රීතුමා කියන්නේ ඉස්සරහාට කරන්න එපා කියලා. අපි එහෙම කරමු. නමුත් සේවකයො 424 ගිහිල්ලා තියෙනවා කියලා පිලිගන්නවානේ. 9, 10, 11 දින තුන කර්ෆියු දාලා තිබ්බේ. මේ සේවකයො අපිට තියෙන හයට නගරාධිපතිතුමාට තියෙන හයට කාටහරි තියෙන හයට යන්න පුලුවන් මේ වැඩේට. නමුත් සේවකයෝ ඔවුන්ගේ දරු පවුල නඩත්තුකරන්නේ මේ මුදලින් එ නිසා කරුණාකරලා ඉල්ලීමක් කරනවා මේ සේවකයන්ගේ රස්සා නැතිකනරන්න එපා. එනිසා රස්සාව ආරක්ෂාකරමු. අපි හෙට ඉඳන් හරි වැඩේ කරමු. ඒ නිසා ඔබතුමා සහයෝගය දෙන්න කොමසාරිස්තුමාගේ සහයෝගයගන්න අපි කට්ටියම එකතු වෙලා ඉදිරියට වැඩ කරමු.

( සභා ඝෝෂා)

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා ආයතන කමිටුවේ කරුණු තියෙනවා නම් කමිටු රැස්වීමේදි කථාකිරිමට යටත්ව ඉදිරි කටයුතු කරමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මීට කලින් වෙච්ච පුර්වාදර්ශ තියෙනවානේ ඒ පුර්වාදර්ශ වගේම අනාගතයේ වෙන්නත් පුලුවන්. අපිට හදිසියේවත් අපි හිතමු කවුරුහරි තමන්ගේ අතිතයේ සිදුවෙච්ච වැඩ නැවැත්විමකට විරුද්ධව මානව හිමිකම් එකට ගියෝත් දැන් සමහර නඩු තින්දු තියෙනවා පෙර නඩු තින්දු බලපානවා. එතකොට හදිසියේවත් කවුරුහරි අභියෝග කලොත් එහෙම පරිපාලන ක්ෂේත්‍රයේ වෙන් එකමයි කඩාගෙන වැටෙන්නේ. එනිසා ඔබතුමා ගන්න තින්දු වගේම මේතුමා ගන්න තින්දුත් හරිම වැදගත්. එවගේම සමහරක් වෙලාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 197 වන වගන්තියට අනුව අපිට පුලුවන් ඔමුබුඩ්ස්මන් එකට යන්න තමන්ට හිමි අත්තනෝමතික බලතලයක් පාවිච්චි කළා කියලා වැරදිකරු බවට පත්වෙනවා. එක පුර්වාදර්ශයක් වගේ වෙනවා කියලා ස්ථාපිත වෙනවා. පාවිච්චි කරලා කාටහරි මේවට අභියෝග කරන්න පුලුවන්.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා ඉදිරියේදි එහෙම නොවන ආකාරයට කටයුතු කරමු. මේකත් පුර්වාදර්ශයක් කරගෙන කටයුතු කරමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මෙය එහෙම බැහැර කරන්න පුලුවන් එකක් නෙමෙයි. නගරාධිපතිවරයා කියනවා යන එක සේවකයන්ගේ අයිතිය. මම කොමසාරිස්වරයා දැනුවත් කරනවා නියෝජය කොමසාරිස්තුමා දැනුවත් කරනවා එහෙම කරලත් සේවකයො බැහැරවෙලා යනවා. සේවකයො අරගෙන යනකොට අපිට කියනවා ඔනනම් කොමසාරිස්තුමාගෙන් අහගනින් කියලා. අපි කියන්නේ නිතිය ක්‍රියාත්මක කරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ඔබ අදගන්න තින්දුව බැසිල් රාජපක්ෂ මහත්තයා ඇවිල්ලා පාර්ලිමේන්තුවේ කිව්වා ඩොලර් නැතිව උන්ඩියන්ලා හවාලා ක්‍රමයට ගෙනවා නිත්‍යානුකුලයි කියලා. උන්ඩියන්ලා හවාලා ක්‍රමයට කියලා දැන් ඇනගෙන තියෙනවා. බැසිල් රාජපක්ෂගේ දෙවෙනි ඉනිම තමයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. එනිසා හරියට තින්දුකරලා ගන්න.

(සභා ඝෝෂා)

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපිට අතිශය වැදගත්ම වෙන්නේ මේ ආයතනයේ සේවකයෝ. එනිසා මේ සේවකයො තමයි මේ ආයතනයේ බර දෙවුරේ දරාගෙන ඉන්නේ. එ සේවකයින්ගෙන් දීර්ඝ කාලයක් අපි දකිනවා එ එ ක්ෂේත්‍රවල සැබෑ ලෙස මහන්සිවෙලා වැඩකරන සේවකයෝ එවගේම ගරු නගරාධිපතිතුමනි සේවකයින්ගේ වැඩි කොටසක් ඔවුන් තමන්ගේ ලොක්කායි සලකන්නේ මේ ආයතනයේ කොමසාරිස්තුමාව එතමයි නිවැරදි.එ කියන්නේ තමන් වගකියන්න ඔන කොමසාරිස්වරයාට දැන් එහෙම සේවකයො ප්‍රමාණයක් ඉන්නවා. එවගේම තව කොටසක් නිර්මාණය කලා එගොල්ලෝ වගකියන්නේ නගරාධිපතිට. එගොල්ලෝ හිතනවා තමන්ගේ ලොක්කා නගරාධිපති. එතමයි දේශපාලන මැදිහත්වීමෙන් මේ ආයතනයට ගත්ත සේවකයෝ. එ දේශපාලනයට පින් සිද්ධවෙන්න විවිධ තනතුරු තාන්නමාන්න ආදේශක විවිධ පත්වීම් වලට දාපු අය. එනිසා දැන් අර කියන කථාවේ මගේ හිතවත් දෙන්නා තුන්දෙනා ගියාට කමක් නැහැ මුලු සේවකයෝ ඔක්කෝම ගියාමනේ අවුල් කියලා. අහන්නේ එහෙම එකක් නැහැ.අවුල් නම් දෙන්නා තුන්දෙනාගියත් අවුල් ඔක්කෝම ගියත් අවුල්. එ කියන්නේ මේකේ තමන්ගේ ජාම බේරගන්න තමයි තමන්ගේ වචන හසුරුවන එක අදාල නැහැ. ඉතිහාසයේ දැන් ඔන තරම් අපි කියව ගත්තා එ අත්දැකීම් ගත්තා.

ඒ නිසා දැන් කොමසාරිස්තුමනි, අපේ මේ සේවකයෝ සියල්ල ආරක්ෂාකර ගන්න ඕන. එ පිළිබඳව දෙගිඩියාවක් නැහැ.අද අපි මොනවා කිව්වත් මේ ආයතනයේ ඉන්න සේවකයන්ට කිසිම හිරිහැරයක් වෙන්න බැහැ.ඔවුන්ට විවිධ දේශපාලන බලපෑම් මොකක්හරි පක්ෂපාතිත්වයන් තමන් මොනවාහරි වැඩිපුර සන්දර්ශන දැම්මෝත් තමයි තමන්ට මේ ලොක්කාගේ ගරු බුහුමන් ලැබෙන්නේ විවිධ එවා ඇති. හැබැයි අපි ඉල්ලන්නේ ඔබ කොමසාරිස්තුමා මේ සේවකයින්ගේ මූලික වගකිම ඔබේ. නගරාධිපතිතුමාට මේ මන්ත්‍රීවරුන්ට අවශ්‍යනම් ඔබේ අනුමැතියෙන් තමයි සේවකයෝ ගන්න ඕන. දැන් එහෙම නෙමෙයිනේ මේ පරිපාලනය යන්නේ මන්ත්‍රීවරුන්ට නගරාධිපතිවරයාට හරි එ ජනයාගේ දුක්ගැනවිල්ලක් වෙනුවෙන් සේවකයෝ යොදවන්න තියෙනවානම් පරිපාලනයේ ලොක්කා ඔබතුමා ඔබතුමාගෙන් ඔන ගන්න. දැන් මේ ආයතනයේ බොහෝමයක් වෙන්නේ එහෙම නෙමෙයිනේ ඔබ දන්නේ නැහැනේ අපේ සේවකයෝ කොහෙ කොහෙ දාලා තියෙනවාද? කොහේ කොහෙ වැඩ කරනවාද? මොකක්වත් හරි අවබෝධයක් මේ ආයතනයේ පරිපාලනයේ ඉහල නිලධාරින්ට නැහැ. එනිසා දැන් අරගලයක් සිද්ධ වෙන්න ඕන. මේ සියලු සේවකයෝ කොමසාරිස්තුමා යටතේ ඉන්න එ පරිපාලන නිලධාරින්ට වගකියන අය බවට පත්වෙන්න ඕන. එහෙම නැත්නම් මේක කිසි දවසක බේරන්න හම්බවෙන්නේ නැහැ. දේශපාලන අධිකාරිය හැමවිටම ඔවුන්ව පාවිච්චිකරනවා. ඔවුනගේ අවශ්‍යතාවයට. එනිසා අද අඩා වැටුනාට වැඩක් නැහැ. අඩා වැටෙන අයත් ඉතිහාසයේ කරපු එවා අපි හොදින් දැක්කා. එනිසා ගරු නගරාධිපතිතුමනි මේ ආයතනය නිවැරදි කරගන්නනම් විශේෂයෙන්ම මේ සේවකයින්ගේ ගැටලු එනිසා ඇගිල්ල ගහලා ගිය අයට දඩුවම් කරන එක නෙමෙයි අපි කරන්න ඕන ඒ අයව ගෙන්නලා ඇත්තටම යන්න බලපාපු හේතුව විමසලා පනිශ්මන්ට් එකක් දෙන්න ඕන. අඩුම තරමේ ෆයිල් එකට ලිපියක් හරි දාන්න ඕන.එගොල්ලන්ට දැනෙන්න ඕන එගොල්ලෝ වරදක් කරා මොකද එගොල්ලෝ දේශපාලන අධිකාරියට යටවෙන්න ඕන නැහැ.එගොල්ලෝ වරදක් කරානම් එ වරදට අවම මොකක්හරි දඩුවමක් දෙන්න ඕන. එතනට යමු. එහෙම නැතිව නිකන් අර මේ ආයතනයේ වැඩකරමින් මහන්සිවෙමින් දේශපාලන අධිකාරිය කියන කියන දේවල්වලට රගපාන්න සිද්ධවෙලා ඉන්න අයට වෙන හානියක් කරන්න යන්න එපා අපේ ඉල්ලීම.ඔතන හැබැයි ජුන්ටාවක් ඉන්නවා. ජුන්ටාව තමයි වැරදි කරන්නේ. එක මහා ලොකු එකක් නෙමෙයි. පොඩි එකක් එනිසා ජුන්ටාවටනම් මම කියන්නේ මොකක්හරි ආයතන නිති සංග්‍රහයට අනුව ගතයුතු ක්‍රියාමාර්ග ගන්න ඕන. අද කොමසාරිස්ගේ බලතල අරගත්ත ජුන්ටාවන් ඉන්නවා. කොමසාරිස්තුමාගේ බලතල අරගෙන රගන එනිසා එගොල්ලන්ට දෙන්න ඕන. හැබැයි පොදු සේවකයාට කිසිදු අරවැනි හිංසාවක් නොකොට ඔවුන්ව හදාගන්න ඕන. ඒ හදාගන්න නම් ඔහුත් කරපු වැඩේ වැරදි කියන එක එත්තුගන්වන්න අඩුම තරමේ ෆයිල් එකට ලියුමක් හරි දාන්න ඕන. ඔන්න ඔහොම බේරගමු. නැත්නම් වෙන වෙන දේශපාලන වුවමනාවට වැඩකරන්න ගියොත් ආයි අපි අමාරුවේ වැටෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි සමහරු මේකේ මන් පොර න්‍යාය ක්‍රියාත්මක කරන්න යනවා. එනිසා මම පොර න්‍යාය අවශ්‍ය නැහැ.අපි කියන්නේ මේකයි අපි යම් සේවකයෙක් මේකේ අපි ගෙනහිල්ලා තියෙනවා කියලා ඔප්පුකරන්න පුලුවන්නම් ඔප්පුකරන්න. අපි කියන්නේ රාජකාරි වේලාවේ සේවකයො මොකක්හරි

එකකට ගෙනියනවා නම් එක වැරදි. එක තර්කයක් නැහැ. අනෙක් එක මේ ගෙනහිල්ලා තියෙන්නේ ඉතා දරුණු තැනකට. එනිසා එක වැරදි. එනිසා අපි කියන්නේ මේකට නීත්‍යානුකූලව පියවර ගන්න ඕන. එනිසා පිරිසක්ව ආරක්ෂාකරන්න අරයා තමයි නුඹලාට ගැහුවේ අපි තමයි නුඹලාව බේරගත්තේ එහෙම කතාන්දර නැහැ. සියලු සේවකයන්ට ගන්න පුලුවන් එ සමාන තීන්දුගන්න. 9වෙනිදා ගිය කට්ටියට තීන්දුවක් ගන්නේ නැතිව 25 වෙනිදා 26 වෙනිදා වැඩට ආපු නැති දෙන්නෙක්ව ඉන්ටර්ඩික් කරන්න බැහැ. අපි එකයි කියන්නේ. එනිසා ගන්නවානම් තීන්දු හරියට ගන්න ඕන. කාණුව සුද්ධකරේ නැහැ කියලා අවවාදකිරිමේ ලිපි ගහන්න බැහැ. එවා කොහේද තියෙන්නේ. එහෙම බැහැ ෆයිල් එකට නෙමෙයිද එ ලිපි යන්නේ. මම කියන්නේ අහිංසක සේවකයාට අසාධාරණයක් කරන්නයි මේ ලිස්ට් එකේ වරප්‍රසාද ලාභි පිරිසක් ඉන්න නිසා එ පිරිසට වෙනම නීතියක් ක්‍රියාත්මක කරන්නයි බැහැ. සමහර නිලධාරීන් අපි දන්නවා සේවකයන්ට නුඹලාව මම තමයි බේරගත්තේ නුඹලා මේ ඇගිලි ගහලා ගිහිල්ලානේ. මේ කතාන්දර ඔක්කොම අපි දන්නවා. වැඩිය දැගලුවොත් හාමුමහත්තරුන්ගේ වැඩ ටිකත් අපි දානවා. එනිසා කරුණාකනරලා අපි කියන්නේ මේ නීතිය සැමට සමානව බෙදන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ආයතන කමිටුව ක්‍රියාත්මක වෙනකොට ආයතනයේ නීති නිලධාරි ඉන්න ඕන. අපි අවුරුදු 30ක් නඩු කියලා නඩුව නිදහස්වෙලා ආයතන කමිටුවේ තියෙනවා අවුරුදු 30 නඩු කියලා ෆිස්කල් බලයෙන් නෙරපන්න තියෙන දේපල. අපිට නැවත අත්කරගන්න තියෙන දේපළ උසාවියෙන් ගොනුව අත්සාන ගතවෙනවා. අපේ නීති නිලධාරීන් මොකක්ද කරන්නේ. ගිය මහා සභාවටත් නැහැ. මේ මහා සභාවටත් නැහැ. අධිකරණයේ තියෙන ගොනුව අත්සාන ගතවෙනකොට අපේ නීති නිලධාරි මේ ගැන හොයන්නේ නැද්ද? මේ මලනාලිකා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එතන තමයි එ පද්ධතිය හදන්න තියෙන්නේ. මේ ගොනුව අත්සානගතවෙලා අධිකරණයෙන් තියෙන්නේ. කොමසාරිස්තුමාගෙන් ඉල්ලීමක් කරනවා අධිකරණයෙන් නඩු අංකය අරගෙන මහේස්ත්‍රාත්තුමාට ලිපියක් යවන්න පුලුවන්නම් ඔබතුමාට ආයතනයේ ප්‍රධානියා වශයෙන් කරුණු විමසන්න කියා ඉල්ලා සිටිනවා.

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමා අද නීති නිලධාරි සභාවේ නඩුවක් සඳහා පෙනී සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ 16 වෙනි නඩුව. එක එස් සි එෆ් ආර් 121 සොයිසා ක්‍රිඩාංගනය සම්බන්ධයෙන් දැනට පවත්වාගෙන යන නඩුව. මේක සම්බන්ධයෙන් මේ නඩුවට අදාලව ගාස්තු වශයෙන් මුදල් කමිටුවේ අනුමැතිය සඳහා ඉල්ලීමක් කරලා තියෙනවා. අයිතම අංක 21 යටතේ එක බැලුවාම මේ නඩුව වෙනුවෙන් වියදම් වෙනවා ලක්ෂ 12ක මුදලක් නීතිඥ ගාස්තු හැටියට. මම යෝජනා කරන්න කැමතියි මේක අපි සෙටිල්වෙමු කියලා. අපි සෙටිල්කරගන්න බලමු මේ නඩුව. මේ නඩු සඳහා නීතිඥවරු 3ක් යටතේ දාලා තියෙනවා. එතකොට අපේ නීති නිලධාරියෙක් ඉන්නවානම් මේ නඩුවල ලේඛන සම්බන්ධයෙන් නීති නලධාරිට කටයුතු කරන්න පුලුවන්. ලේඛන ගොනු කිරීමටත් පිටින් නිලධාරියෙක් ගත්තාම එකටත් යනවා. මම යෝජනාවක් කරනවා මුල් අවස්ථාවේදි අපි මේක නීති නිලධාරීන් මගින් ප්‍රකාශනයක් ගොනු කරලා මේ නඩුව අපි සමාදාන කරමු කියලා.එතකොට ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් මේ ප්‍රශ්ණය ඉදිරිපත් කරලා තියෙන කණ්ඩායම නගර සභාවට ගෙන්නලා මේක සමාදාන කරන්න පුලුවන්ද කියලා දෙපාර්ශවයත් එක්ක. මේ වගේ ක්‍රියාමාර්ගයකට යමු. නැත්නම් බදුගෙවන ජනතාවගේ බදු මුදල් ලක්ෂ12ක් ගෙවනවා නගරාධිපතිතුමගේ එකමතික තීන්දු තිරණවෙනුවෙන්. මම ගියපාර සභාවෙත් මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කථාකලා. මේවා නගරාධිපතිතුමා ඔහුගේ තනි කැමැත්තෙන් ගන්න තීන්දු. මේවාට නීති උපදේස් පතන්නෙත් නැහැ මම යෝජනාවක් කරන්න කැමතියි සමාදාන වෙන්න පුලුවන්ද කියලා මුල් අවස්ථාවේම සාකච්ඡා කරලා බලමු.

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරලා තියෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ඇත්තමට අපේ ලිහිණි මන්ත්‍රීතුමිය කියපු එක සතයයි. හේතුව මොකද අපි ඔවුන්ට තුන්වරක් නගර සභාවට පැමිණ සාකච්ඡාකරන්න කිව්වා. නමුත් ඒ තුන්වතාවේම පැහැදිලි කරේ ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් නගරසභාවට කිසිම අයිතියක් නැහැ කියලා. අපි අවසාන වශයෙන් එගොල්ලන්ට දැනුම් දීමක් කරා. ඔයගොල්ලෝ ඇවිල්ලා බදු ගිවිසුමකට යටත්ව ඔබතුමන්ලා පවත්වාගෙන යන්න කියලා. නමුත් අපිට නගරාධිපතිතුමා ලක්ෂ 12ක් වියදම් කරපු එක ගැන මෙතුමිය කිව්වා. නගර සභාවේ සල්ලි තමයි. එක අපරාදයක් වෙනවා. නමුත් මේක අපිට අයිති දේපලක්. පිට එක්කෙනෙක් කියනවානම් අපිට අයිති නැහැ කියලා අපිට ලක්ෂ 12 වඩා වියදම් කරන්න වෙනවා. අනාගතයේදි ඔබතුමිය මැදිහත්වෙලා ඒ ක්‍රිඩා සංගමයේ අයව එක්කරගෙන එන්න. අරගෙන ඇවිල්ලා නගර සභාවේ බදු ගිවිසුමට යටත්වෙමු කියන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කරන්න. එතනදි අපි සාකච්ඡා කරමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ඒ සම්බන්ධව යමක් කර හැකිද කියා මම සොයා බලන්නම්. ඒ සඳහා මම ඔවුන් සමග යම්කිසි සාකච්ඡාවක් කරන්නම්. හැකියාවක් තිබෙනවා නම් එක මම උත්සාහයක් අරගන්නම් නගරසභාවේ දේපල රැකගැනිම වෙනුවෙන් කටයුතු කරන්නම්.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, කඩලානේ පුස්ථකාලය ගෙනහිල්ලා තියෙනවා ජනසේත පුස්ථකාලයට. බඩුටික ගෙනහිල්ලා දාලා තියෙනවා කඩලානේ පුස්තකාලේ තිබ්බ ගොඩනැගිල්ල නිලනිවාසයක් බවට පත්කරන්න තින්දුවක් අරගෙන තියෙනවා. සාමානයයෙන් අපි දන්න විදියටනම් පුස්ථකාලයක් ඇතිකරනවා මිසක් නැතිකරන්න තින්දුවක් ගන්නේ නැහැ. මොකද හේතුව අද පවතින වාතාවරණයත් එක්ක නගරාධිපතිතුමා පොතක් කියවන්න තියෙන චාන්ස් එක නැතිකරනවා කියන්නේ එක මහා අපරාදයක්. හැබැයි දැන් මේකේ වෙලා තියෙන්නේ ළමයෙකුට පොතක් කියවන්න තියෙන චාන්ස් එක වැඩිකරලා ඒ පුස්ථකාලය සංවර්ධනය කරලා පුස්ථකාලය තුලින් ඒ ජනතාවට විශාල සේවයක් කරන්න පුලුවන්කම තියෙද්දි පුස්ථකාලේ තියෙන පරිසරයේ තමන්ගේ ඥාතියෙක් ඉන්න නිසා ඥාතියට කරදරයක් කියලා පුස්ථකාලේ ගෙනියනවා වෙන තැනකට. එක නිල නිවසක් බවට පත්කරනවා. නගර සභාවට නිල නිවාස තව ඕනද? එහෙම එකක් නැහැ. එනිසා ගරු නගරාධිපතිතුමනි මේක වහාම නවත්වන්න ඕන. මේ පුස්ථකාලය නැවත වරක් ස්ථාපනය කරන්න හරිම කණගාටුදායකයි පුස්ථකාලේ තියෙන පොත්ටික අරගෙන යන්නේ නගරාධිපතිතුමා පොහොර උරවල දාලා. මුන් ඉස්කෝලේ ගිය එවුන්ද කියලා ප්‍රශ්නයක් තියෙනවා. කවුද මේ තින්දුව ගත්තේ කියලා ප්‍රශනයක් තියෙනවා. කොමසාරිස්තුමා කියන්නේ නිලනිවාස කමිටුව ගත්තා කියලා. නිල නිවාස කමිටුවට තින්දුවක් ගන්න පුලුවන්ද පුස්ථකාලයක් අයින් කරන්න. නිල නිවාස කමිටුවට තින්දුවක් ගන්න බැහැ නිලනිවසක් ඇතිකරන්න. නිලනිවාස කමිටුවට තින්දු ගන්න පුලුවන් නිලනිවාසය කාටද දෙන්නේ කියලා විතරයි. එනිසා පුස්ථකාල අයින් කරන්න තින්දුගන්න බැහැ. හැබැයි දැන් අද කඩලානේ පුස්ථකාලේ අයින් කරලා තියෙනවා. එනිසා අපි ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා අඩුම තරමින් මේ ඉන්න කාලසිමාවේ හරි මතක හිටින දෙයක් කරන්න. පුස්ථකාලේ නැවත ස්ථාපනය කරන්න. ජනතාව ඉල්ලන්නේ එක මහා අපරාදයක්. අද ඔලේවල් කරන ළමයෙකුට පොත්ගන්න සල්ලියනවාද මිනිස්සුන්ට ළමයින්ට පොත් කියවන්න තැනතක් තියෙනවාද? තැනක් නැහැ පොත් කියවන්න. නගරසභාව අපි ලැජ්ජවෙන්න ඔන හරිනම් හැම ගමකින් ගමකටම සංවර්ධනය වෙච්ච පුස්ථකාලයක් ඇතිකරන්න ඕන. මේ තියෙන වාතාවරණයත් එක්ක. මිනිස්සුන්ට ගිහිල්ලා පොතක් කියවලා දරුවන්ට අධ්‍යාපනය ලබන්න කොච්චර පොත් ඕන වෙනවාද දැන් ඒ ළමයින්ට ගිහිල්ලා අධ්‍යාපනය ලබන්න පුලුවන්ද? ගෙවල්වල කන්න විදියක් නැතිව ඉන්නේ තුන්වේල. තුන්වේල කන්න විදියක් නැතිව පොත්ගන්න සල්ලි තියෙනවාද මිනිස්සුන්ට. ඒ චාන්ස් එක ගන්න තියෙන තැන අනෙක් එක අපි ඉල්ලිමක් කරනවා පුස්ථකාලයක් දැන් කම්පියුටරයක් දාලා ඉන්ටර්නේට් දිලා ළමයින්ට අධ්‍යාපනය ලබන්න පුලුවන් නවීණක්‍රමවේදයන් ඇතිකරලා ඒ ක්‍රමවේදයන් එක්ක ඉස්සරහාට යනවා මිසක් තියෙන පුස්ථකාලේ කාට හරි ලගින්න නිලනිවසක් කරලා

හරියන්නේ නැහැ. එනිසා කරුණාකරලා ඔබතුමාගෙන් ඉල්ලනවා නැවත වතාවක් පුස්තකාලයක් ස්ථාපනය කරන්න කියලා.

**මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා එ කාරණයට මැදිහත්වීම සම්බන්ධව. කඩලාන පුස්ථකාලය වසා දැමු කාලය කොයිතරම් කාලයක්ද කියලා වසරවලින් කිව්වොත් වසර 4කට වැඩියි. එක අලුතෙන් එකපාරට ගහෙන් වැටුණාවගේ කරපු වැඩක් නෙමෙයි. එයට සාපෙක්ෂව විශාල සිද්ධියක් එ ස්ථානයේ ඇතිවෙලා ඊට පස්සේ එක වහලා දාලා. අපි යම් මැදිහත්වීමක් කරලා තමයි අවුරුදු 4කට පස්සේ පොත්ටික කිසිම වගකිමක් නැතිව ජනේල් දොරවල් ඇරලා දාලා එ පැත්ත කවුරුවත් බලන්නේ නැතිව ඉන්නකොට වහල නැතිව ජනේල් කඩලා තියෙද්දි පොත්ටික අනාරක්ෂිතව තියෙනවා කියලා දැන ගත්තාම පුළුවන්තරම් ඉක්මණින් ජනසෙතටවත් ගෙනියලා පරිස්සම් කරන්න කියලා කටයුතු කරේ. එවගේම එකෙන් අදහස් වෙන්නේ නැහැ මේතුමා කියපු කාරණය වැරදියි කියලා. මේතුමා කියන කාරණයට මම සියයට දෙසියයක් එකගයි. පුස්ථකාලයක් වහන එකට අපි සම්පුර්ණයෙන් විරුද්ධයි. පුස්ථකාල ආරම්භ කලයුතු කාලේක.

වැඩ බලන නගරාධිපතිතුමනි, අපේ ඉන්න පුස්තකාලාධිපතිතුමිය ජනසෙතෙන් පිට එක පුස්ථකාලයක් අධික්ෂණය කරපු කාලයක් පුලුවන්නම් මට හොයලා කියන්න. එහෙම වෙන්නේ නැහැ. මම එක නියෝජ්‍ය කොමසාරිස්තුමත් එක්ක නිතර නිතර ගිහිල්ලා කථාකරලා තියෙනවා. මම නාගරික කොමසාරිස්තුමාට සේවා කියලා තියෙනවා. එහෙම වෙන්නේ නැහැ. පහුගිය දවස්වල ජනසේත පුස්ථකාලේ වැඩකරන සේවකයො කිහිපදෙනෙක් එකට එකතුවෙලා මීට අවුරුදු දෙකාමාරකට ඉස්සේල්ලා ආව පොත් බෙදාහරින්නේ නැතිව ජනසේතේ තිබ්බා. ශාඛා පුස්ථකාලවලට ආපුවා. ඊට ඉස්සෙල්ලා කරලා තිබුණේ එක දවසක් අරගෙන වාහනයක් එනකම් බලාගෙන ඉඳලා එක පුස්ථකාලේකට විතරක් පොත්ටිකක් ගෙනහින් දානවා. ආයි කාලේකට පස්සේ තව පුස්ථකාලේකට යනවා. හැබැයි සේවකයෝ කථාවෙලා වැඩකරන නිලධාරි කිහිපදෙනෙක් කථාවෙලා ඔවුන්ගේ පෞද්ගලික වාහනයක් යොදාගෙන එකම දවසේ ශාඛා පුස්ථකාල සියල්ලටම පොත් ටික බෙදා හැරියා. ප්‍රශංශාකලයුතු කටයුත්තක් ඔවුන් එදා කරලා තිබ්බා ඒ අපිට ලැබුණු තොරතුරු අනුව. හැබැයි ඔවුන් එ වැඩේ කරලා ගිමන් අරින්න කලින් අපේ අභ්‍යන්තර විගණන අංශය එතනට ගිහින් තිබ්බා. එගොල්ලෝ එතනින් ගිහිල්ලාද බලන්න. ප්‍රශංසාවට ලක්කලයුතු කාරණා අගය කරන්නේ එහෙම. හැබැයි අපි දන්නවා මේක හොයලා බලන්න වැඩබලන නගරාධිපතිතුමනි. විශේෂයෙන්ම නාගරික කොමසාරිස්තුමා නියෝජ්‍ය කොමසාරිස්තුමා හැබැයි ජනසේත පුස්ථකාලේ ඉන්නවා රාජකාරි පටන්ගන්න ඕන වෙලාවට කලින් ඇවිල්ලා රාජකාරි පටන්ගත්තා කියලා අත්සන් කරලා අනෙක් සේවකයන්ට නොලැබෙන වරප්‍රසාද අරගෙන නිවාඩු දිනවල අනෙක් ඔක්කොම වැඩ නැහැ නමුත් එ අය විතරක් වැඩ කරලා විශාල අතිකාල ගන්න අය. එක නිසා මේවාට වහාම මැදිහත්වෙලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. එවගේම මේතුමා සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රිතුමා කියපු කාරණාව වෙනුවෙන් සභාවක් විදියට අපිට මැදිහත්වෙන්න පුලුවන්නම් පුස්ථකාල සක්‍රිය කරන්න පුලුවන්නම් මේවා වෙනුවෙන් තවත් යම් මීට වඩා වැඩි ක්‍රියාමාර්ගයක් ගන්න පුලුවන්නම් මැදිහත් වෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

**වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කොමසාරිස්තුමා මේ අවස්ථාවේ පුස්ථකාලයක් වහනවා කියන්නේ ඉතාම අනවශ්‍ය වැඩක්. මේ අවධියේ සමාජයේ සාක්ෂරතාව ඉතාම අඩුවෙලා යන මොහොතක නිල නිවාස ඕන තරම් අපේ සභාව සතුව තියෙනවා. එනිසා එකට පුස්ථකාලය නැවත ආරම්භ කරන්න වැඩ කටයුතු කරන්න කියලා මම නියෝග කරනවා.

**මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි නියෝගය හොඳයි. තියෙන පුස්ථකාලේ නිලනිවාසයක් කිරිමට අදාලව විරුද්ධවීමත් හොඳයි. පුස්ථකාල වැදගත්. හැබැයි එකපාරට සිද්ධවෙන දෙවල් නෙමෙයි මේ. ගහෙන් ගෙඩි එන්න වගේ එකපාරට සිද්ධවෙන දේවල් නෙමෙයි. මේ කථාකරන අපිත් ටික කාලයක් මේ සභාවේ ඉන්නවා. හැබැයි පුස්ථකාල පද්ධතියම කඩාගෙන වැටිලා තියෙන්නේ. අද නිල නිවාස නොකලාට පුද්ගලික නිවාස බවට පත්වෙච්ච නිවාසත් තියෙනවා. එවා නිලනිවාස නෙමෙයි දැන් පුද්ගලික නිවාස. සමහර පුස්ථකාල තියෙනවා වැසිකිලියක් නැහැ. අපි ඒ පුස්ථකාලේට යවනවා අපේ කාන්තා නිලධාරිනියක්. වැසිකිලියක් නැහැ.

එනිසා පුස්ථකාල පද්ධතියම තියෙන්නේ වැටිලා. එවා පිළිබඳව ඉතාම ගැඹුරෙන් හොයලා එවට මැදිහත්වීමක් කරේ නැහැ. පුස්ථකාලාධිපතිනියට ඇඟිල්ල දික්කරන්න බැහැ. එතකොට ඇඟිල්ල හතරක් තමන්ගේ පැත්තට. ඇයි මේ වගකිම දුන්නේ පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුවට. ඔබ ආණ්ඩුව දැන් විපක්ෂයේ කරන දේම ඔබත් කරනවානේ. මේ විපක්ෂයට අයිති වැඩක් මේවා පෙන්නලා දෙන එක හදන එක ඔබේ වැඩක්. දැන් ඔබත් කියනවා සුජිත් මන්ත්‍රිතුමා හරි හොදයි අපි කැමතියි. මේ කරන්න ඕන බලය තියෙන අය. දැන් අභියෝගය ගන්න ඔබ නියෝගයක් කලාට එතන පුස්ථකාලයක් කරන්න පුලුවන්ද බැරිද කියලා. එ අවබෝධයෙන් නෙමෙයි ඔබ නියෝග කරන්නේ. ඔබ නියෝග කරන්නේ පුස්ථකාලයක් වැදගත් නිලනිවාසයකට වඩා කියන තක්සේරුවේ ඉදලා. හැබැයි දැන් ගිහින් බලන්න ඕන පුස්ථකාලයක් කරන්න පුලුවන්ද බැරිද කියලා. එකේ පාඨකයෝ ප්‍රමාණයක් හිටියා. දිර්ඝකාලයක් එ පාඨකයෝ අඩුවක් සිද්ධවුනා. එතන සිද්ධවෙච්ච තව තව කාරණා ගොඩක් තියෙනවා. ඔබ අපි කවුරුත් දන්නවා කුඩු බෙදාහැරිමට අදාල සිද්ධියක්. එතන හිටිය අපේ සේවිකාව මගේ මතකයේ හැටියට ඇය අතුරුදහන්. එ ප්‍රශ්ණ ගොඩකට මුහුණ දිලා අවසානේ තමයි ඔය අපි කවුරුත් මේ සභාවේ එකගවෙන්න ඔන නැහැ නිල නිවසක් කරන එකට. අපේ කාගේවත් මන්ත්‍රිවරුන්ගේ අවබෝධයක් නැහැ පුස්ථකාලේ වෙනුවට පුස්ථකාලේ වහලා නිල නිවසක් කරනවානම් හොදයි කියලා. මම හිතන්නේ එක්කෙනෙක්ගේ අදහස ඔය නැත්නම් මේ සභාවේ අදාල ප්‍රදේශයේ මන්ත්‍රිවරයා අපිට කියන්නකෝ මම තමයි එක කිව්වේ කියලා. මම කියන්නේ එහෙම නැහැ. ප්‍රදේශයේ මහජන නියෝජිතයා කොට්ඨාශයේ මහජන නියෝජිතයෝ ඉන්නවා. මම කියන්නේ එගොල්ලෝ ඔවා දන්නේ නැහැ. ඔය වෙන තැනකින් එන්නේ. එනිසා දැන් අපි කරන්න ඔන ඔබ තින්දුවක් දෙන්න වහාම අදාල නිලධාරින් ගිහිල්ලා පරික්ෂා කරලා බලන්න තවදුරටත් එක පුස්ථකාලයක් ලෙස පවත්වාගෙන යන්න පුලුවන්ද? එයට ජනතාව එකගද? එකට පහසුකම්ටික තියෙනවාද? එහෙම නැත්නම් අපි මොකක්ද ඊලග පියවර විදියට ගන්නේ. මම කියන්නේ එහෙම නැත්නම් අපි එකපාරට නියෝග දෙන එකෙන් ඔබේ නියෝග හැල්ලුවෙනවා. ඒ පිළිබඳව වහාම වාර්තාවක් කැදවන ලෙස ඉල්ලා සිටිනවා

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රිතුමා ගොඩනැගිල්ල තියෙනවානම් ආරම්භකරන්න හැකියාවක් නැහැ කියලා කියන්න බැහැ.

(සභා ඝෝෂා)

**2022.05.24 දින පැවති ආයතන හා නිතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.**

**6(02) 2022.05.24 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

<u>මහ නගර සභා මන්ත්‍රි - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, පරිසර කමිටුවේ අංක (3) ඔබේ අවධානය යොමුකරනවා. නාගරික කොමසාරිස් තමයි කමිටුවට ඉදිරිපත් කරන්නේ සි.එච්.රේසිඩන්ට්ස්, අංක 95, චාල්ස් පෙදෙස, ලුනාව මොරටුව එතන ඉදිරිපත් කරන කාරණාව තමයි ලුනාවේ දැනට නිවාස 356 ක් තියෙන අතර දැනට ස්ථිර පදිංචි සංඛ්‍යාව 100 කට ආසන්න වේ. මෙතන මතුකරලා තියෙන්නේ මේගොල්ලන්ගේ කුණු අදින්න බැහැ.කුණු අදින්න බැරි මෙතන එකගතාවයක් තියෙනවා මේ ඉඩම අපේ නගර සභාවේ ඉඩම. එ එකගතාවය තියෙන්නේ අපිට යම් ගෙවිමකට එකග වෙමින් ගෙවිමක් නැත්නම් මට මතක විදියට අපේ රගහල මේක අවසන් කරලා දෙන එකගතාවය මත. හැබැයි දිර්ඝ කාලයක් ඇමතිවරු ගණනාවක් එක්ක සාකච්ඡාකරා මේක හරි කිව්වා. නිතරම මම මේක ප්‍රශ්ණ කරා ආවසන් මට්ටමේ දැන් තියෙන්නේ කිව්වා. දැන් ඔන්න මෙන්න කිව්වා බඩු හම්බවෙන්න. ඔය වගේ එවා කිව්වා. හැබැයි අවසානයේ අපිට මොකක්වත් නැහැ. අපේ ඉඩම ගත්තා ඔවුන් නිවාස පද්ධතිය හැදුවා. අපිට කිසිවක් දුන්නේ නැහැ. දැන් අපි කියනවා එ කියන්නේ අපිට දිපු නැති නිසා ඔයගොල්ලන්ගේ කුණු අදින්න බැහැ.දැන් එක අපි කොහොමද කරන්නේ. දැන් මේ නිවාස පද්ධතිය විවෘත කරනකොට ඉස්සරාහම හිටියේ කවුද අපේ නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු. මේ නිවාස විවෘත කරනකොට ඉස්සරහයින් හිටියේ එතුමා ඇමතිතුමාත් එක්ක. දැන් විවෘත කරලා. විවෘත කිරිමෙන් කියන්නේ එ ගෙවල් පදිංචියට අවසර දුන්නා. අවසර දුන්නේ මේ මහා නගර සභාවේ නගරාධිපතිවරයා.

**වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු මන්ත්‍රීතුමා එවේලේ එකගතාවයක් තිබුණා. මුදල් ටික ලබා දෙනවා කියලා.

**මහ නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, නෑ අපිට බලයක් නැහැ. බලයක් නැති දෙවල් කරන්න එපා. එ කියන්නේ කුණු අදින එකයි ඔවුන්ගේ ගණුදෙනුවයි දෙකක්. නිවාස සංවර්ධන අධිකාරිය එක්ක මේ කරපු ගණුදෙනුව ඇතුලේ මම ලොකු කාලයක් හොද අවධානයෙන් හිටපු එකක්. මේකේ විවිධ ගෙවල් ඉල්ලුවා. මේකේ වෙන වෙන ගණුදෙනු ගණනාවක් යනවා. හැබැයි එවා වෙනම අපිට ඔප්පුකරන්න බැහැ. අපිට තියෙන්නේ තොරතුරු විතරයි. හැබැයි අපි මුදල් නොගෙවීම නිසා කුණු ඇදීම නතර කරන්න මම කියන්නේ සාධාරණ නැහැ. අපිට බලයක් තිබෙයි සාධාරණ නැහැ. එකෙන් අරක යටකරන්නත් බැහැ. එතකොට කියයි එහෙනම් නුඹලා නෑද හිටපල්ලා අපි ගෙවන්නේම නැහැ. මොකෝ ගෙවල් දිලානේ මිනිස්සුන්ට. එ මිනිස්සු සල්ලි දීලා අරගෙනනේ. අපි දක්ෂවෙන්න ඕන මේ නිවාස සංවර්ධන අධිකාරියත් එක්ක ගිහිල්ලා අපේ සාකච්ඡාවේ ඉදිරි පියවරක් අරගෙන මේ මුදල ගන්න ඔබ එකගවුනානම් මම හිතන්නේ එකගවුනේ ලියවිල්ලකට. අපි ලග ලියවිල්ලක් ඇති මොකක් හරි එකගතාවයක් ඇති කට වචනයෙන් කියලා නෙමෙයි එකගවුනේ. අපේ මේ ගොඩනැගිල්ල හදලා දෙනවා කියලා කිව්වේ. මම කියන්නේ අපි දැන් උස්සාහ කරන්න ඕන එක කරගන්න මිසක් අර මිනිස්සුන්ගේ කුණු නෑද ඉදලා හය වෙලා අපිට අරක දෙයි මේ නිර්දේශයට අපි විරුද්ධයි.

**මහ නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, 9වෙනිදා සිද්ධියත් එක්ක කසල ප්‍රශ්ණය නැවත උග්‍රවුනා සති කිහිපයක් කසල ඇද්දේ නැහැ. සේවකයන්ගේ ගැටලුව නිසා සොයිසාපුර එ ගැටලුව තිබුණා. දින කිහිපයක් ඇද්දේ නැහැනේ. දැන් මොනයම් හේතුවකින් කුණු අදින්න පටන් ගත්තා. දැන් සොයිසාපුර සම්බෝධිනුගාශ්‍රම විහාරස්ථානයේ මම මේක කොමසාරිස්තුමාට කිව්වා. එ විහාරස්ථානය ඉතාම අලංකාර ලෙස කසල වෙන්කරන ස්ථානයක් හදලා තියෙනවා. පොලිතින් ප්ලාස්ටික් සියල්ල. හැබැයි අර කසල එකතුකරපු නැති දිනවල පිටස්තර පුද්ගලයෝ එතැනට ගෙනල්ලා කුණු පුරවලා තියෙනවා. විශාල කුණු ගොඩක් ගහලා තියෙනවා. විශේෂයෙන් නොදිරන කසල හාමුදුරුවොත් අපෙන් ඉල්ලිමක් කරා එක සුද්ධකරලා දෙන්න. කලවම් කුණු නිසා ගෙනියන්නේ නැහැ කියලා. සුද්ධකරලා දිලා ඊට පස්සේ අපි එකට ක්‍රමවේදය හදමු.

**මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ අංක 2(3) ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් ඉදිරිපත් කර ඇති මොරටුව මහා නගර සභා බලප්‍රදේශය තුල වාණිජ හා වෙළද පරිශ්‍රවලින් කසල බැහැර කිරිම සදහා එක් එක් මාසය තුල ලැබිච්ච මුලු මුදල් ප්‍රමාණය වාර්තා කරනවා. ඇමුණුම අංක 3 වාර්තා කරනවා මිලියන 34ක් අපිට ලැබිය යුතුයි කියලා. හිග මුදල් 2022 මාර්තු 31 වෙනකොට මිලියන 34ක් හිගමුදලක් තියෙනවා. එතකොට ඇමුණුම අංක 4න් අපිට සදහන් කරනවා ලැබිම් ජනවාරි ඉදලා අප්‍රේල් දක්වා මිලියන 3.8ක්. එතකොට මට දැනගන්න ඕන මේ හිග මුදල් 2022 මාර්තු 31 දිනට ජනවාරි 22 ඉදලා මාර්තු 31 දක්වාද නැත්නම් හිගමුදලක් එකතුවිමෙන් එන හිග මුදලක්ද?. මිලියන 34 ගරු වැඩ බලන නගරාධිපතිතුමනිමට දැන ගන්න ඕන මේ මුදල කාලයක් තිස්සේ එන හිග මුදලක්ද මාර්තු 31දක්වා නැත්නම් 2022 ජනවාරි සිට මාර්තු දක්වාද කියලා. එහෙම වුනොත් අපෙ ලැබිම් මිලියන 3.8 තියෙන්නේ.

වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා

ගරු මන්ත්‍රීතුමිය මෙහි තියෙන්නේ 2010 ඉදලා සභාවට අයවිය යුතු මුදල තමයි.

**මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි 2010 ඉදලා නම් ඒ කාලය ටිකක් සදහන් කරොත් වටිනවා අපි හිතන්නේ මේ වසරට අදාලයි කියලා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි කසල එකතු කිරිමේ හිග ගාස්තු ඔබතුමා කියන විදියට 2010 සිට එකතු වෙලා තියෙනවා. මිලියන 34 එ කියන්නේ කලාප 4 ම ආයතන වලින් එක විස්තරාත්මකව තියෙනවා. දැන් මෙතන මේක ඉදිරිපත්කරලා බලාපොරෝත්තුවෙන්නේ මොකක්ද මේකේ කිසිම නිර්දේශයක් නැහැ. හිග මුදල් එකතු කර ගැනිමේ වැඩපිළිවෙලක් නැහැ. මෙතන ප්‍රශ්ණයක් තියෙනවා.

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමා ඉල්ලිමක් කරලා තියෙනවා පෙර තිබෙන හිග මුදල් සභාවට ඉදිරිපත් කරන්න කියලා. එ අනුව තමයි මේක ඉදිරිපත් කරන්නේ. ලබා ගැනිම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, පහුගිය කාලයතුල දිර්සකාලිනව මෙහෙම හිග තිබුණා. නමුත් අපිට සභාවක් විදියට ලොකු අවබෝධයක් තිබුනේ නැහැ කොහෙන් කොහෙන්ද මේ හිග තියෙන්නේ කියලා. එ අනුව මම සෞඛ්‍ය කමිටුවේ වගකිම භාරගත්තාට පස්සේ මම ඉල්ලිමක් කලා කරුණා කරලා එ වාර්තාවක් අපිට දෙන්න කියලා. දැන් අපිට එ වාර්තාව ලැබිලා තියෙනවා. එතකොට අපිට අය කරගන්නේ කොහොමද කියලා වැඩ පිළිවෙලක් අපි සාකච්ඡා කරලා කරන්න බලාපොරෝත්තුවෙන් ඉන්නවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, එවැනි එකතු කර ගැනිමකට යනවානම් ඉක්මණින් කියන එක කියනවා. මොකද හේතුව මේතන තියෙන ආයතන ගත්තාම රාජ්‍ය බැංකු පෞද්ගලික බැංකු හුඩ් සිටි මේවගේ විශාල ආයතන ප්‍රමාණයක් තියෙනවා. විශාල මුදල් ප්‍රමාණයක් අයකර ගන්න ඉක්මණින් එ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලිමක් කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි අපිට ගැටලුවක් තියෙනවා සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගෙන් අහන්නේ බේල් එක සම්බන්ධයෙන් දිගින් දිගමට චෝදනා එනවා. බේල් එකේ මහා පරිමාණ වංචාවල් සිද්ධවෙනවා කියලා. එවා ඔප්පුකිරිමේ හැකියාවක් තියෙනවා. අපි එවායේ තොරතුරු හොයාගෙන තියෙන්නේ. එනිසා නගරාධිපතිතුමනි සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා අපි දන්නවා එතුමා මේ සම්බන්ධයෙන් දන්නේ නැහැ. වගකිමෙන් කියන්නේ එනිසා පැහැදිලිවම බේල් එකේ නිලධාරින් සහ දේශපාඥයෝ එකතුවෙලා ගහනවා ගෙමක් වගකිමෙන් කියන්නේ. එනිසා කරුණාකරලා ඔබතුමා වැඩබලන නගරාධිපතිවරයා හැටියට එ පිළිබඳව සොයාබලන්න. මම මේක කොමසාරිස්තුමාට කිව්වා නියෝජ්‍ය කොමසාරිස්තුමාට කිව්වා දැන් අපේ සෞඛ්‍ය කමිටු සභාපතිතුමගෙත් අවධානය යොමුකරනවා. බේල් එකේ මේ නගර සභාවට අයවෙන්න ඕන ලක්ෂ ගානක මුදල් පෞද්ගලික මුදල් බවට පත්වෙනවා. ලක්ෂ ගානක් මාසිකව. මේ නගර සභාවේ තියෙන ලොකුම හොරකම බේල් එක බවට පත්වෙලා තියෙනවා වගකිමෙන් කියන්නේ. එනිසා ගරු නගරාධිපතිතුමනි මැදිහත්වෙනවා කියන වචනය නෙමෙයි නගරාධිපතිතුමා බේල් එකෙන් බඩු දෙන්නෙ කාටද බඩු දෙන්නේ මොන ක්‍රමවේදයටද?

<u>වැඩ බලන නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රිතුමා ඔය පිළිබඳව මටත් අවබෝධයක් තියෙනවා. මම එ පිළිබඳව හොයලා බලන්නම් අපි එක නිවැරදි ක්‍රියා මාර්ගයට ගමු.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි ඔබතුමා ලග එහෙම තොරතුරු තියෙනවානම් අපිට උදව් කරන්න. එ පිළිබඳව වහාම සොයා බලලා අවශ්‍ය කටයුතු කරමු. එවගේම මම මේ වේලාවේ මතක් කරන්න ඕන සෞඛ්‍ය කමිටුව වේලාවේ විශේෂයෙන් වැඩ බලන නගරාධිපතිතුමා මේ කටයුතු ආරම්භකරන කොටම විශේෂයෙන් වාහන ගිනිතැබිම් වගේ ප්‍රශ්ණ ඇතිවෙච්ච වේලාවේ එතුමා මැදිහත්වෙලා මේවෙනකොට දෙහිවල ගල්කිස්ස නගර සභාවෙන් වාහනයක් අරගෙන අපි එ කටයුතු ක්‍රමවත්ව කරගන්න කටයුතු කළා. විශේෂයෙන්ම වාණිජ

ස්ථාන වල කසල ඇදීමේ කටයුතු ඇණහිටින්න තිබුණා. නමුත් එ කටයුතු දෙහිවල නගර සභාවෙන් වාහනයක් ලබා ගෙන අපි එ කටයුතු සඳහා මැදිහත්වෙලා කටයුතු කරමින් ඉන්නවා. හැබැයි වැඩබලන නගරාධිපතිතුමනි මට මේ පිළිබඳව ලොකු අවබෝධයක් නැහැ. එ වාහනය සඳහා දිනකට නිකුත්කරන ඉන්ධන අපිට දරාගත නොහැකි මට්ටමට හෝ යන වියදම දරාගතනොහැකි මට්ටමක තියෙනවා යන අදහසක් මට ලැබිලා තියෙනවා මට එ පිළිබඳව ලොකු අවබෝධයක් නැහැ එ පිළිබඳවත් ඉදිරියේදි සාකච්ඡාකරනවා. දෙහිවලින් එන වාහනයකට අපි දිනකට කොච්චර දෙනවාද එ ඉන්ධන වල වටිනාකම කොච්චරද අපි ලබාගන්න සේවයට ප්‍රමාණවත්ද කියන කාරණය පිළිබඳවත් යම් අවබෝධයක් අපිට ලබා ගන්න වෙනවා.

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රිතුමා සභාව සතු ලෝරි රථය සඳහා තෙල් ලීටර් 18ක් ලබාදිලා තියෙනවා කටයුතු කරන්න. දැන් මේ දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ ගරු නගරාධිපතිතුමාට මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා. එතුමා අපිට මෙය ලබා දුන්නා. එවගේම එම රථය පිච්චිච්ච රථයේ වැඩ කොටස කරනවා. ලීටර් 4ක් තමයි වැඩිපුර දෙන්නේ. යන්න එන්න ප්‍රවාහනය සඳහා ලීටර් 4ක් වැඩිපුර යනවා. අපි රථයක් කුලියට ගත්තානම් මීට වඩා ලොකු මුදලක් සභාවට වැය වෙනවා.

**2022.05.24 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් ඒකමතිකව සහා සම්මත විය.**

(මේ අවස්ථාවේ දී 2022.05.24 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 3 කරුණට පමණක් විරුද්ධව බව, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මහා නගර සභා මන්ත්‍රිවරුන් ප්‍රකාශ කරන ලදි.

**06(03) 2022.05.25 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

<u>මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු වැඩ බලන නගරාධිපතිතුමනි කර්මාන්ත කමිටු වාර්තාවේ මෙම අයිතමයේ නැහැ. නමුත් මේක මම දිගින් දිගටම මේ සභාවතුල කියනවා. කල්දේමුල්ල කොට්ඨාශය තුල තියෙනවා සි.පී.ද සිල්වා මාවත, සුදර්මාරාම පාර, දහම් මාවත, ආතර් පෙදෙස. අවුරුද්දක් තිස්සේ ඉදන් අබලන්ම තත්වයේ තියෙන්නේ. වැඩ බලන නගරාධිපතිතුමා මම මේක අවුරුද්දක් තිස්සේ ඉදන්ම කියනවා මම ඔබතුමාට ඔබතුමා වැඩ බලන්න ගත්තාම මම ඔබතුමාට දුන්නා ලියුමක් එකේ ඔබතුමා මට එ වැඩේ කරන්න කියලා ඉන්ජිනේරු දෙපාර්තමේන්තුවට එ ලිපිය භාර දුන්නා. භාරදිලා දැන් සති දෙකක් විතර වෙනවා. මට කිව්වා එක දවසින් දවස කරන්නම් කරන්නම් කියලා කියනවා. නමුත් අද වෙනකම් එක වෙලා නැහැ.මම මේ කියන්නේ වැහි කාලය තුල ගමනාගමනය අපහසු නිසා මිනිස්සුන්ට ඇවිදින්න පවා අමාරු තත්ත්වයක් තියෙන්නේ. වාහන වලටත් ඩැමේජ් වෙනවා. වසරක් කිව්වාම ලොකු කාලයක්නේ. මෙය ඉක්මණින් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු මන්ත්‍රිතුමා අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුත් කථා කරා වර්තමාන ආර්ථික අර්බුදය නිසා අපේ සංවර්ධන කටයුතු නතර කරන්න කියලා. අපිට දැනුම් දිලා තියෙන නිසා අපේ සභාවේ සේවකයන්ගෙන් යම් වැඩ කොටසක් කරන්න බලාපොරෝත්තු වෙනවා. ප්‍රිමික්ස් කරන වැඩ පිළිවෙල එහෙම මීට වඩා සක්‍රියව කරන්න. ඔබතුමාත් එ ඉල්ලිම දිලා තියන්න අපි එ ගැන සලකා බලන්නම්.

**2022.05.25 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන් එකමතිකව සහා සම්මත විය.**

**06(4) 2022.05.25 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අපි මුදල් කමිටුවට විරුද්ධයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, මම සම්පූර්ණයෙන්ම මුදල් කමිටුවට විරුද්ධයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>
ගරු වැඩ බලන නගරාධිපතිතුමනි, අංක 16 සම්බන්ධව පැහැදිලි කිරිමක් අවශ්‍යයි රු 70000.00ක මුදලක් ගෙවිය යුතුයි. සාමාන්‍යයෙන් ක්‍රිකට් තරගයක් සඳහා නමුත් රු 20000.00කින් සොයිසා ක්‍රිඩාංගනය වෙන්කර ගැනිම සඳහා රු70000.00ක මුදලක් ගෙවිය යුතුබවට සඳහන් වෙනවා. රු 20000.00ක් ගෙවලා වෙන්කර ගැනිම සම්බන්ධව...

<u>වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා</u>
ගරු මන්ත්‍රිතුමා අංක 16 කියන්නේ රවිනාත් මන්ත්‍රිතුමා නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා එවේලේ කමිටුවේ හිටියා. එක මොරටුවේ ජයලත් අපොන්සු කියන මේ මොරටුවට විශාල සේවයක් කරපු ජයලත් අපොන්සුව සිහි ගැන්විමට ක්‍රිකට් තරගයක් පවත්වලා තියෙන නිසා කැව්ලියස් කියන ක්‍රිඩා සමාජයෙන් ඉල්ලිමක් කරලා තියෙනවා එක සාධාරණ හේතුවක් නිසා ඒ අනුව කටයුතු කරලා තියෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>
ගරු වැඩ බලන නගරාධිපතිතුමනි මුදල් කමිටුවේ අංක 2(01), 13, 14, 17, 18, 19(01) සිට 19(14) දක්වා, 20(01) සිට 20(06) දක්වා, 21, 22, 29, 33, 35 කරුණු වලට විරුද්ධයි. අනෙක්වාට අපි එකඟයි.

2022.05.25 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | යු. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 09 | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10 | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 13 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14 | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15 | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්. බී. නිලංක සිල්වා මහතා |
| 16 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා |
| 17 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |

| | | | |
|---|---|---|---|
| 18 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 19 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 20 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 21 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 22 | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 23 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ඩබ්. ඩී. රන්දු නිරෝෂණ මහතා |
| 24 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 26 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 27 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණි පීරිස් මහතා |
| 28 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. එම්. ඒ. දෝන දිලාශිනී මහත්මිය |
| 29 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුදර්ශණී ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 30 | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති බසීනා බක්කර් මහත්මිය |

2022.05.25 දින පැවති මුදල් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ අංක 2(01), 13, 14, 17, 18, 19(01) සිට 19(14) දක්වා, 20(01) සිට 20(06) දක්වා, 21, 22, 29, 33, 35 කරුණු වලට විරුද්ධවත්, අනෙකුත් සියලුම කරුණු වලට පක්ෂවත්, පහත නම් සඳහන් මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

2022.05.25 දින පැවති මුදල් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දුමහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.05.25 දින පැවති මුදල් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේ පහත නම් සඳහන් මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 07 | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 08 | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය ) |

**07** **ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තා**

වැඩ බලන නගරාධිපති- ඩී.සමන්ත සිල්වා මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 2022.05.25 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2022 අප්‍රේල් මාසයට අදාල මූල්‍ය වාර්තා ඇමුණුම - 02 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

**08** **පුද්ගලික ස්වභාවයේ කරුණු** **-** නැත

**09** **වෙනත් කරුණු**

**මහ නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු වැඩබලන නගරාධිපතිතුමනි, අද සභාව පැය 07ක් පමණ ගිය බැවින් වාර්තාවේ ඒ 4 කොල 60-70 ක් විතර වෙන්න පුළුවන්. ඒ නිසා වාර්තාව අවශ්‍යම මන්ත්‍රීවරුන්ට පමණක් ලබා දීමටත්, අනවශ්‍ය නම් ඒ බව ලිපියකින් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩී.සමන්ත සිල්වා
වැඩ බලන නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2022.06.02 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.